

# මතකයේ සිට ක්‍රියාවන් දක්වා:

## පශ්චාත් යුධ සමාජයන්හි සදනුස්මරණය පිණිස වන මෙවලම් කට්ටලයකි

# From Memory to Action:

## A toolkit for Memorialization in Post-Conflict Societies

International Coalition of
SITES of CONSCIENCE

**හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි**

**ජාත්‍යන්තර සන්ධානය**

# මතකයේ සිට ක්‍රියාවන් දක්වා:

## පශ්චාත් යුධ සමාජයන්හි සදනුස්මරණය පිණිස වන මෙවලම් කට්ටලයකි

බික්ස් ගේබ්‍රියෙල් සහ මොෆිදුල් හක්ගේ දයකත්වය ඇතිව

එරිශ්නී නායිදු විසින් රචනා කරන ලදී.

# ස්තුතිය

2010 වසරේ අප්‍රිකානු කලාපීය හමුවට සහභාගි වූ යහපාලනය සඳහා වන ව්‍යාපාරය (සියෙරා ලියෝනය), ස්මාරක සහ කෞතුක වස්තු කමිටුව (සියෙරා ලියෝනය), සමාජ ක්‍රියා සඳහා වන ජාතික කොමිසම (සියෙරා ලියෝනය), සියෙරා ලියෝනයේ මානව හිමිකම් කොමිසම, ප්‍රජා මුලපිරීම (ලයිබීරියාව), කෙන්යා සාම-ජාලය (කෙන්යාව), කෙන්යාවේ මානව හිමිකම් කොමිසම සහ සරණාගත නීති ව්‍යාපෘතිය (උගන්ඩාව) යන ආයතනවල නියෝජිතයින් විසින් ලබාදුන් දයකත්වය වෙනුවෙන් ඔවුනට තුති පිදීමට කැමැත්තෙමු.සහභාගිවන්නන් විසින් මෙවලම් කට්ටලය සඳහා සංකල්ප සහ අදහස් සාකච්ඡාවට ගනු ලැබුවේ මෙම හමුවේදීය. මානව හිමිකම් මාධ්‍ය මධ්‍යස්ථානයේ (දකුණු අප්‍රිකාව) ෂර්ලි ගන් මහත්මිය, කෙන්යාවේ මානව හිමිකම් කොමිසමේ (කෙන්යාව) ඩේවිස් මලොම්බේ මහතා සහ සියෙරා ලියෝන විශේෂ අධිකරණයේ (සියෙරා ලියෝනය) ජෝසෆ් ෂේකු දුම්බූයා මහතා යන අය විසින් ව්‍යාපෘතිය සඳහා අඛණ්ඩව ලබාදුන් ප්‍රතිපෝෂණය හා උපකාර මෙන්ම මෙවලම් කට්ටලයේ විවිධ කොටස් පිළිබඳව ලබාදුන් අදහස් වෙනුවෙන් අපගේ විශේෂ ස්තුතිය ඔවුනට පුද කරන්නෙමු.

ෆෙට්සර් ආයතනය(Fetzer Institute), ලැම්බන්ට් පදනම(Lambent Foundation) සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික උරුමය(National Endowment for Democracy) යන ආයතන මෙම ව්‍යාපෘතියට සෘජුවම සහය ලබාදුන්හ. එසේම, විවෘත සමාජ ආයතනය(Open Society Instittute), සිග්‍රිඩ් රවුසිං භාරය(Sigrid Rausing Trust) සහ ඕක් පදනම (Oak Foundation) විසින් හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය වෙත පොදුවේ ලබාදෙන උපකාර වෙනුවෙන් අපගේ ස්තුතිය පිළිගන්වන්නෙමු.

# පටුන

පෙරවදන

පළමු පරිච්ඡේදය: මෙවලම් කට්ටලයේ මූලාරම්භය

දෙවන පරිච්ඡේදය: සදනුස්මරණය සහ සංක්‍රාන්තික යුක්තිය

තෙවන පරිච්ඡේදය: සදනුස්මරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

සිවුවන පරිච්ඡේදය: අදහස් ලබාගැනීම

පස්වන පරිච්ඡේදය: ස්මාරක නොමැතිව සදනුස්මරණය

සමාප්තිය



# පෙරවදන

යැස්මින් සූකා විසිනි

හිටපු කොමසාරිස්: දකුණු අප්‍රිකානු සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම සහ සියෙරා ලියෝන සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම

# අපගේ සෑම සමාජයක් තුළම කටුක වුත් දැඩි බලපෑමක්

ඇතිකලා වුත් සිදුවීම් සම්බන්ධයෙන් වන ඓතිහාසික මතකය සංරක්ෂණය කරනු වස් අනුස්මරණ ක්‍රියාකාරකම් සිදු කෙරෙන අතර සාමාන්‍යයෙන් ගැටුම්, වර්ග සංහාර, දුර්භික්ෂ, වසංගත සහ මහා මානුෂීය අර්බුද අවසානයේදී එසේ සිදු කරනු ලැබේ. එහිදී අපට මුහුණ පාන්නට වන අතිශය වැදගත් ප්‍රශ්න කිහිපයකිඃ

'අප සමාජයේ නූතන විවාද හැඩගැස්වීමෙහි ලා මතකයන් නිරූපණය කරන්නේ කුමන භූමිකාවක් ද? එය භූමිකාවක් නිරූපණය කළ යුතුමද? සමාජය ප්‍රතිසංස්කරණයේදී සහ සංක්‍රාන්තික යුක්තියේදී ස්මාරකවල භූමිකාව සහ බලපෑම කුමක්ද? මෙම ස්මාරක මගින් පෙර සතුරන්ව සිටි පාර්ශව අතර ප්‍රතිසන්ධානය සහ සමාජ ප්‍රතිසංස්කරණ සිදු කිරීම වර්ධනය කිරීම සිදුවන්නේ කෙසේද? නැතහොත් ප්‍රචණ්ඩ ගැටුම්වලට තුඩු දුන් බෙදීම් තවදුරටත් සංරක්ෂණය කිරීමට හෝ ශක්තිමත් කිරීමට ඒවායින් බලපෑමක් ඇති නොවන බව අපට සහතික කරගත හැක්කේ කෙසේද? අප විසින් සංරක්ෂණය කළ යුත්තේ කුමන ස්මාරකද, ඒ කෙසේද? අප ක්‍රියා කරන්නේ කවුරුන් වෙනුවෙන්ද? විශේෂයෙන්ම මහා ජන සංහාර සහ වර්ග සංහාර සිදුව ඇති අවස්ථාවන්හි ප්‍රයෝජනවත් වන්නේ කොපමණ මතකයන් ප්‍රමාණයක්ද? දේශපාලන ක්‍රියාකාරීන් විසින් මහජන මතකය තමන්ගේ එල ප්‍රයෝජන උදෙසා මෙහෙයවීම සීමා කරන්නේ කෙසේද?'

මතකය යනු පුද්ගලයින් විසින් අතීතය පිළිබඳ යම් අදහසක් නැතහොත් අර්ථයක් ගොඩනගා ගන්නා ආකාරය සහ මතක තබාගැනීම යන ක්‍රියාව තුළින් ඔවුන් එම අතීතය තමන්ගේ වර්තමානය සමගින් සම්බන්ධ කරන ආකාරයයි.ඇතැම් පුද්ගලයින් යම්කිසි සිදුවීමක් හෝ කාල පරිච්ඡේදයක් තුළ ජීවත් වූවා වියහැකි අතර, එසේ නැතහොත් අන් අය විසින් සම්ප්‍රේෂණය කළ සංස්කෘතිකමය දැනුම් සම්භාරයක් බෙදාහදා ගන්නා සාමුහික කණ්ඩායමක කොටස්කරුවන් විය හැකිය.මෙම අවස්ථා දෙකෙහිදීම අත්දැකීමක් බෙදාහදාගැනීම සඳහා සංස්කෘතිකමය නිර්වචනාත්මක රාමුවක් පැවතීම හා එය යොදාගැනීම මෙන්ම අපහට එය සංකල්පීකරණය කර, සිතාබලා එම අත්දැකීම ප්‍රකාශ කළ හැකි අන්දමින් අර්ථවත් භාෂාවක් යොදාගැනීම සම්බන්ධ වේ.අත්දැකීම් සහ ද්‍රව්‍යමය හා සංකේතාත්මක සලකුණු සමගින් ඈඳුනු පුද්ගලබද්ධ ක්‍රියාවලීන් වශයෙන් මතකයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම මෙම දෘෂ්ටිකෝණයට සම්බන්ධ වේ.

අමතක කිරීම සහ මතකයේ රඳවාගැනීම අතර සියුම් වූ සමබරතාවය පවත්වාගෙනයාමේදී පශ්චාත්-ගැටුම් ප්‍රජාවන් අතරින් බොහොමයක් බලපෑමට ලක්වන සාධක ගණනාවක් ඇතඃ නෛතික හා දේශපාලනික සාධක, සංස්කෘතිය හා සදාචාරය, මතකයන් ගොඩනැගෙන ආකාරය සහ කථාවස්තුවට පසුබිම් වී ඇති කරුණු ඊට ඇතුළත් වේ.එසේම, ප්‍රජාවන් අතීතය සමගින් තමන්ට ඇති සබඳතාවය නිර්වචනය කරන ආකාරය ඔවුන්ගේ විශ්වාස පද්ධතිය, එනම් ජීවිතය හා මරණය, හරි හා වැරදි, හොඳ හා නරක, සහ අවිහිංසකත්වය හා දඬුවම් ලැබියයුතු බව යනාදිය සමගින් සමීපව බැඳී පවතියි. බොහෝ අවස්ථාවල හරි වැරැද්ද පිළිබඳ සංකල්පය බොඳවී යා හැකි අතර නරක යන සංකල්පය ඇසට පෙනෙන, ස්පර්ශ කළ හැකි රූපකායක් ගනු ඇත. දඬුවම් ලැබිය යුත්තන් තමන් අවිහිංසක බව කියාපානු ඇත.මෙහිදී සමාජය යනු ඊට දැඩි බලපෑමක් එල්ල කළප්‍රචණ්ඩත්වයේ වින්දිතයකු පමණක්ම නොව සිදුවූ දෙයට සහයදීම හෝ අවම වශයෙන් එය වැලැක්වීමට කිසිත් නොකර සිටීම හේතුවෙන් ප්‍රචණ්ඩත්වයේ උත්පාදකයකු වන බව මෙනෙහි කිරීම සඳහා සත්‍ය සොයා යන්නන් එක් පියවරක් ආපසු තැබීම උචිතය.තවද, බොහෝ අවස්ථාවන්හි වරද සිදු කළ පුද්ගලයින්ද එම මරාදැමුණු හෝ කපාකොටා දැමුණු පුද්ගලයින් සමගින් එකම ස්ථානයක වාසය කරනු ලැබුවන් හෝ දැනටමත් එසේ එකම දිස්ත්‍රික්කයක වාසය කරන්නන් විය හැකිය.

ගැටුමක විවිධ දෘෂ්ටිකෝණ සහ ඒ සම්බන්ධයෙන් තමන්ට මතකයේ තබාගැනීමට වුවමනා කුමක්දැයි තීරණය කිරීමට කාලය විසින් වින්දිතයින් සහ දිවිගලවාගත්තවුන්ට ඉඩ ලබාදෙනු ඇත.'යළි කිසිදු සිදු නොවිය යුතුයි' යන මානසිකත්වයක් නිර්මාණය කිරීම හරහා මතකය තුළින් යම් මට්ටමක ප්‍රජාතන්ත්‍රීකරණ සංස්කෘතියක් ප්‍රවර්ධනය සඳහා අපි උත්සාහ දරන්නෙමු.අතීතය පිළිබඳව පුද්ගලයින්ට සිහිකරදීම සඳහා සංස්කෘතික හා අනෙකුත් දැනුවත් කිරීමේ මාධ්‍ය මත දැඩිව රඳා පවත්නා සදනුස්මරණය ලේඛනගත සාක්ෂි මත දැඩිවවිශ්වාසය තබනු ලැබේ.මෙහිදී මෙම මැදිහත්වීම නීත්‍යානුකූල සහ අපක්ෂපාතී වන බවක් පුළුල් ජන ප්‍රජාව විසින් දැකීම ඉතා වැදගත් ය.පොදු මතක ක්‍රියාවලියේදී මෙහි අදහස වන්නේමතකයේ තබාගැනීමේ සහ අනුස්මරණය කිරීමේ ක්‍රියාවලියයනු ජයග්‍රාහකයාගේ යුක්තිය පමණක්ම නොව, සිතා බලා සිදු කරන අතීතය ආවර්ජනය කිරීමේ ක්‍රියාවලියක් වන බවයි. දෙවැනුව,ඕනෑම ප්‍රතිපත්තිමය තීරණයක් හෝ ප්‍රතිඵලයක් පිළිබඳව ප්‍රචණ්ඩත්වයෙන් වැඩිපුරම බලපෑමට ලක්වූ පුද්ගලයින්ගෙන් සැබැවින්ම අදහස් විමසිය යුතු වේ. මතක ව්‍යාපෘතීන් හරහා මතකයේ තබා ගතයුත්තේ කුමක්ද යන්න සහ නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය ඉලක්ක කරගත් වෙනත් මුල්පිරීම් පරාසයක්ද මෙම ව්‍යාපෘතියට සමගාමීව දියත් කරන්නේ කෙසේද යනාදී කරුණු පිළිබඳව සිදු කෙරෙන සාකච්ඡාවට අදාළ සිදුවීමට මුහුණ පා දිවි ගලවාගත්තවුන් සෘජුවම සම්බන්ධ විය යුතු බව මෙහි අදහස වේ.

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන (Sites of Conscience) වන බොහෝ අනුස්මරණ ස්ථාන සාම අධ්‍යාපනය සඳහා වන ස්ථාන බවට පත්කර තිබේ. බොහෝ ජන සමාජයන්ට ඇති අභියෝගය නම් සමරනු ලබන සිදුවීම් අත් නොවිඳි බාල පරම්පරාව වෙත එම සිදුවීම්වල වැදගත්කම ඒකාබද්ධ කිරීම නැතහොත් පැහැදිලි කරදීම වේ.

බොහෝ අවස්ථාවන්හිදී වින්දිතයින් අමතක කර දමනු ලැබේ. රාජ්‍ය ව්‍යාපෘතියක් ගොඩනැගීමේ අරමුණ සමගින් වින්දිතයින්ගේ භූමිකාව පසෙකට තල්ලුවීම හෝ නොසලකා හැරීම සිදුවන අතර ගෙවීගිය අතීතය පිළිබඳව තමන් ලැබූ අවබෝධය පොදු සාමූහිකය මත ආරෝපණය කිරීමට ජයග්‍රාහකයින්ට ඇති වුවමනාව ඉස්මතු වේ. ලෝකයේ බොහෝ රටවල මෙය සිදුවනු අප දැක ඇති අතර රාජ්‍යයන් තමන්ගේ විජයග්‍රාහීවාදය පෝෂණය කරගැනීමට පොදු ජනතාවගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගන්නා අකාරය පිළිබඳව මෙමගින් අපට උගන්වයි.

පශ්චාත්-ගැටුම් ලෝකය තුළ ස්මාරක ස්ථාන වෙත මෙය බලපාන්නේ කෙසේද?

මතකයන් සම්බන්ධයෙන් පසුබිම් ව්‍යූහය සැකසීමේ ක්‍රියාවලියේදී අපගේ සංස්කෘතීන් හා අපගේ ඉහළ මට්ටමේ අනන්‍යතාවය සැලකිල්ලට ගතයුතු වන අතර මිනිසුන් අතර බෙදීම් ඇති කිරීමට නොව මිනිසුන් එකමුතු කිරීමට එමගින් වෑයම් කළයුතු වේ. තරුණයින්ගේ භූමිකාවද සැලකිල්ලට ගනිමින් වත්මන් ගැටළු පිළිබඳ සංවාදයකට මුලපුරන ස්ථාන බවට පත්වන අන්දමින් මෙම ස්ථාන ඉදිකිරීමට අප කටයුතු කළයුතුය.

සැමරුම් සිදු කිරීමේදී, ස්මාරක ස්ථාන ඇති කිරීමේදී සහ ලේඛන ආපසු ලබාගැනීමේදී, මතකයේ තබාගතයුතු බව පවසන්නන් හා අමතක කර අභාවයට පත්වන්නට හැරියයුතු බව පවසන්නන් අතර දේශපාලනමය අරගලයක් ඇතිවීම සාමාන්‍ය තත්වයයි. මෙහිදී වැදගත් වන්නේ සංවාදයක් සඳහා ඉඩකඩ ඇතිකිරීම වේ. මතකයන් සහ අපගේ ස්මාරක ස්ථාන යොදාගනිමින් පුද්ගලයින් අතරේ සම්බන්ධතා ඇති කරමින්ම සමාජ සාධාරණත්වය පිළිබඳ ගැටළු ඉස්මතු කිරීමට කටයුතු කිරීමේ අභියෝගයට අපි මෙහිදී මුහුණ දෙන්නෙමු. එවන් ස්ථාන ඉදිකිරීමේදී අප සිහියේ තබාගත යුතු කරුණ වන්නේ සංවාදය සැබැවින්ම ඇති වන්නේ එතැනින් බවයි.

මෙම අත්පොත එකී සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු අඩංගුවන අත්පොතක් නොවූවද හෘදසාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන (Sites of Conscience) සන්ධානය විසින් සිදුකර ඇති කාර්යයන් යොදාගනිමින් ඉහත කී ප්‍රශ්නවලින් ඇතැම් ඒවා මගින් එල්ල වන අභියෝගයට මුහුණදියයුත්තේ කෙසේද යන්න පිළිබඳව සිත් පොළඹවනසුළුවූත් නවමුවූත් උදාහරණ ලබාදෙයි. විශේෂයෙන්ම පශ්චාත්-ගැටුම් ලෝකය තුළ මතකයන්හි වැදගත්කම අවධාරණය කරන්නා වූ උදාහරණ මෙහි ගෙනහැර දක්වන අතර මතකයන්හි සිට ක්‍රියාවන් දක්වා ගමන් කරන්නේ කුමන ආකාරයෙන්දැයි සාකච්ඡා කෙරේ!




# පළමු පරිච්ඡේදය:

## හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන හඳුන්වාදීම

# හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය

**හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය** (International Coalition of Sites of Conscience) යනු 'හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන', එනම් ඓතිහාසික ස්ථාන, කෞතුකාගාර සහ අතීත අරගල මතකයේ තබාගැනුමට හා ඒවායින් වර්තමානයට පැන නැගී ඇති උරුමයන් ආමන්ත්‍රණය සඳහා කැපවූ මුලපිරීම් යනාදියෙහි ලෝක ව්‍යාප්ත ජාලයක් වේ.එක්සත් ජනපදයේ ලොවර් ඊස්ට් සයිඩ් ටෙනමන්ට් කෞතුකාගාරය, රුසියාවේ ගුලාග් කෞතුකාගාරය සහ දකුණු අප්‍රිකාවේ ඩිස්ට්‍රික්ට් සික්ස් කෞතුකාගාරය වැනි වූ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන මගින් අතීතය පිළිබඳව වඩාත් ගැඹුරු අවබෝධයක් ඇතිකරමින් මහජනයා සමගින් සම්බන්ධවීමට ස්මාරක ස්ථානයන්හි ඇති බලය දිරි ගන්වමින් වඩාත් සාධාරණ වූ අනාගතයක් බිහි කිරීමට පොළඹවයි.ප්‍රජාව සම්බන්ධ කරගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික ස්මාරක ස්ථාන වෙත සෘජුවම අරමුදල් ලබාදීම, තනි පුද්ගලයින් සමගින් සහයෝගිතා ඇති කරගැනීමේ සිට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම දක්වා වූ පුළුල්පරාසයක විහිදෙන ඉගෙනුම් කරුණු හුවමාරු සංවිධානය කිරීම සහ ස්මාරක ස්ථාන සහ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන ව්‍යාපාරය වෙනුවෙන් ක්‍රමෝපායිකව පෙනීසිටීම යනාදිය මෙම සන්ධානය විසින් සිදු කරනු ලැබේ.සන්ධානයට රටවල් 47ක 300කට අධික  සාමාජික සංඛ්‍යාවක් ඇතුළත් වන අතර රටවල් 75ක 3000කට අධික සාමාජිකයින් සහිත සන්නිවේදන ජාලයක් එය සතුය.

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයක් යනු මතකයන් රැඳි ස්ථානයකි- එනම්, එම ස්ථානයේ සිදුවූයේ කුමක්ද යන ඉතිහාසයත් ඉන් වර්තමානයේ ඇති කෙරෙන බලපෑමත් යන කරුණු දෙකම මුණගැසෙන ඓතිහාසික ස්ථානයක්, යම් ස්ථානයක් පදනම් කරගත් කෞතුකාගාරයක් නැතහොත් ස්මාරකයක් වේ. වර්තමානයේ අප මුහුණ දෙන ගැටළු සමගින් එම ස්ථානයසම්බන්ධ කිරීම තුළින් සහ එම ගැටළු ආමන්ත්‍රණයේදී තමන්ට නිරූපණය කළ හැකි භූමිකාව කුමක්දැයි සිතා බලන මෙන් එහි පැමිණෙන පුද්ගලයින්ගෙන් ඉල්ලා සිටීම තුළින් අදාළ ස්ථානයේ ඓතිහාසික දෘෂ්ටිකෝණය සක්‍රිය කිරීමට වෑයම් කරන මහජන සංවාද වැඩසටහන් හරහා කෲරත්වයේ, ධෛර්යයේ හෝ දෛනික ජීවිතයේ කථා වෙත අවධානය යොමු කිරීම හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන මගින් සිදු වේ.

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:

- එම ස්ථානය හරහා ඉතිහාසය අර්ථ නිරූපණය කරයි;
- වැදගත් හා දැඩි බලපෑමක් සහිත සමාජ ගැටළු පිළිබඳ සංවාද සඳහා පොළඹවන වැඩසටහන්වල නිරතවෙයි;
- මූලික කාර්යයක් වශයෙන් මානුෂීය සහ ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ප්‍රවර්ධනය කරයි;
- එම ස්ථානය තුළ මතු කෙරෙන ගැටළු සම්බන්ධයෙන් මහජනතාවට සම්බන්ධවී ක්‍රියාත්මකවිය හැකි අවස්ථා බෙදාහදා ගනියි.

කලාපීය සහ තේමාත්මක ජාල ගණනාවකින් මෙම සන්ධානය සමන්විත වේ. පොදු සහ වර්තමානයට බලපාන ගැටළු ආමන්ත්‍රණය සඳහා එකමුතුවන හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන ඒකරාශී කරමින් දේශීය ජාල ඇතිකිරීමට සාමාජිකයින් විසින් කටයුතු කරනු ලැබේ. වත්මනෙහිදී අපගේ කලාපීය/ තේමාත්මක ජාල පහත පරිදි වේ:

- **අප්‍රිකානු කලාපයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** පශ්චාත්-යටත්විජිත සහ පශ්චාත්-ගැටුම් පරිවර්තනයන් අත්විඳිමින් සිටින දකුණු, නැගෙනහිර-මධ්‍යම සහ බටහිර අප්‍රිකානු

රාජ්‍යයන්හි අතීතය මතකයේ තබා ගැනීම සඳහා වන ස්ථාන සමගින් මෙම ජාලය කටයුතු කරයි.

- **ආසියානු කලාපයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** වාර්ගික හා ආගමික බහුවිධතාවය ආදර්ශනය කිරීමටත් එම අගයන් ප්‍රවර්ධනය කිරීමට සක්‍රියව සම්බන්ධවීම පිණිස තරුණ කණ්ඩායම් පෙළඹවීමටත් ගැටුම් මෙන්ම සහජීවනය සම්බන්ධයෙන් වන ඉතිහාස කථා භාවිතා කිරීමට මෙම ජාලය ආසියාවේ ඇති හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන සමගින් කටයුතු කරයි.

- **යුරෝපීය කලාපයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** වර්තමානයේදී යුරෝපයේ පවතින වෙනස්කොට සැලකීම, සංක්‍රමණ සහ විදේශිකයින් නුරුස්නාබව යනාදී ගැටළු සම්බන්ධයෙන් සංවාදයේ නිරතවීම දිරිගැන්වීමේ අරමුණ ඇතිව යුරෝපයේ ඓතිහාසික ස්ථාන සහ කෞතුකාගාර එක්ව මෙම ජාලය ඇතිකරගෙන තිබේ. අන්‍යයන් ඉවසීම, ප්‍රජාතාන්ත්‍රීය ක්‍රියාවලි සහ මානව හිමිකම් පදනම් කරගත් යුරෝපීය පුරවැසිභාවයක් යනාදිය ප්‍රවර්ධනය සඳහා එම ස්ථානවල සුවිශේෂී ඉතිහාසය යොදාගනිමින් තරුණයින් වෙනුවෙන් වැඩසටහන් සම්පාදනය කිරීමට ජාලය විසින් කටයුතු කරනු ලැබේ.

- **සංක්‍රමනික සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** සංක්‍රමණය සහ ඊට සම්බන්ධ ගැටළු පිළිබඳව ප්‍රාදේශීය මෙන්ම ජාතික මට්ටමින් අඛණ්ඩව සිදු කෙරෙන සාකච්ඡා සඳහා පෙළඹවීම, මානුෂීය සහ ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ප්‍රවර්ධනය කිරීම සහ සංක්‍රමණය පිළිබඳ සංවාදයේදී සියළු ප්‍රේක්ෂක කොටස් පාර්ශවකරුවන් වශයෙන් සැලකීම යන කාර්යයන් සඳහා ඓතිහාසික දෘෂ්ටිකෝණය ප්‍රයෝජනයට ගැනීමට එක්සත් ජනපදය සහ යුරෝපය මුළුල්ලේ පැතිර ඇති මෙම කෞතුකාගාර ජාලය විසින් කටයුතු කරයි.

- **මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** 'නිල මට්ටමින්' පවතින කතාවට ඔබ්බෙන් වන විවිධාකාර ඉතිහාස කතා පිළිබිඹු වන අන්දමේ ලේඛන සහ මහජනතාවට ප්‍රවේශ වියහැකි ලේඛනාගාර පැවතීමේ වැදගත්කම අරාබියානු රාජ්‍යයන්ගේ ජාලයෙන් අවධාරණය කරයි. පරිවර්තනය වෙමින් පවතින මෙම සමාජවල අතීතය මත පිහිටා අනාගතයේදී මානව හිමිකම් සංස්කෘතීන් බිහි කිරීම සඳහාවන්දි ගෙවීම, අනන්‍යතාවය, ආර්ථික විෂමතා, වංචා දූෂණ, වදහිංසා සහ රඳවා තබාගැනීම සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණයකිරීමට මෙම ජාලය කටයුතු කරයි.

- **රුසියාවේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** ඒකාධිපතිවාදයේ ඉතිහාසය සහ එහි ප්‍රතිවිපාක පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම හා වර්තමානයේදී රුසියානු ප්‍රජාතන්ත්‍රවාදයට පවතින තර්ජන ආමන්ත්‍රණය පිණිස පුරවැසියන් සක්‍රියව සම්බන්ධ කරගැනීම සඳහා මෙම ජාලය කෞතුකාගාර සහ ඓතිහාසික ස්ථාන සමගින් කටයුතු කරයි.

- **ලතින් ඇමරිකාවේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන:** ලතින් ඇමරිකාවේ රාජ්‍ය ත්‍රස්තවාදය පැවති සමයේ සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳ මතකය සංරක්ෂණය කිරීමටත් එම ආඥාදායක සමය ඔවුන්ගේ සමාජය මත ඇතිකළ ප්‍රතිවිපාක පිළිබඳවත් වන ස්මාරක ස්ථානයන්හි ශක්‍යතාව වර්ධනයට මෙම ජාලය කටයුතු කරයි. අනාගත පරම්පරාවන් තුළ සියළු ස්වරූපයන්හි ඒකාධිපතිවාද වලක්වාලීම පිණිස දේශපාලන සංස්කෘතියට බලපෑමක් එල්ල කිරීමටත් තරුණයින් සමගින් කටයුතු කිරීමටත් මතකයන් භාවිතා කිරීමට මෙම ජාලය ඉලක්ක කරගෙන තිබේ.

# මෙවලම් කට්ටලයේ පසුබිම

**දිගැදුණු ගැටුම් සහ බරපතල මානව හිමිකම් උල්ලංඝන ඇතිවීමෙන් අනතුරුව** එම අතීතය ක්‍රමයෙන් පිළිගැනීම සඳහා ජන සමාජයන් විවිධ යන්ත්‍රණ භාවිතා කරයි.වරදකරුවන් වගවන බව සහතික කරගන්නේ කෙසේද, ගැටුමේ වින්දිතයින් හඳුනාගෙන ඔවුනට යුක්තිය ඉටුකර දෙන්නේ කෙසේද සහ මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයේ සංස්කෘතියක් යළි ඇතිකිරීමට වඩාත්ම උචිත ක්‍රමය කුමක්ද යනාදිය අතීතයේ සිදුවීම් ක්‍රමක්‍රමයෙන් පිළිගැනීමට උත්සාහ දරණ අතරේ එම සමාජය විසින් ආමන්ත්‍රණය කිරීමට ඉලක්ක කරන ප්‍රශ්න අතරින් කිහිපයකි.මතකය සහ සදනුස්මරණය සම්බන්ධ ප්‍රශ්න, වර්තමානය තුළ අතීතය අවබෝධ කරගැනීමට ජන සමාජ දරන්නා වූ වෑයමට සහ එය අනාගතයට බලපාන්නේ කෙසේද යන්නට ඉතා වැදගත් වේ.මෙම ගැටළු අතරින් ඇතැම් ඒවා සම්බන්ධයෙන් ඔවුන් සිදුකරන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙනයාම සඳහා අප්‍රිකානු කලාපයේ හෘද සාක්ෂිය පිළිබඳ ස්ථානයන්හි පශ්චාත්-ගැටුම් තේමා කරගත් ජාලය 2010 වර්ෂයේදී සියෙරා ලියෝනයේ ෆ්‍රීටවුන් නගරයේදී හමු වී පශ්චාත්-ගැටුම් පසුබිමක් තුළ සදනුස්මරණය සඳහා ඔවුන් දැරූ වෑයම් පිළිබඳ අත්දැකීම් බෙදාහදාගත්හ.සියෙරා ලියෝනය, කෙන්යාව, ලයිබීරියාව සහ උගන්ඩාව යන රටවල් ඊට සහභාගි වූහ. සදනුස්මරණයේ වැදගත්කම පිළිගත් එම සහභාගිවන්නන් සඳහන් කළේ තමන් සදනුස්මරණය සම්බන්ධ ගැටළුවට මුහුණ දුන්නේ විවිධ ආකාරයෙන් බවය. ඇතැමුන් ඒ වනවිටත් මතකය සහ සදනුස්මරණය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටි අතර තවත් අය සඳහන් කළේ සත්‍ය සෙවීම, වගවීම, වන්දි ගෙවීම සහ පුළුල් වූ සංක්‍රාන්තික යුක්ති වෑයම් සිදුකිරීම යනාදිය සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාමේදී සදනුස්මරණය පිළිබඳ කරුණ මතු වූ බවයි.පශ්චාත්-ගැටුම් ප්‍රතිසන්ධාන හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් තුළ සදනුස්මරණය වැඩි වැඩියෙන් වැදගත් අංගයක් බවට පත්වෙමින් පවතින නමුත් සදනුස්මරණය සඳහා දරණ වෑයම්වල පුළුල් අභිමතාර්ථ අතරින් ඇතැම් ඒවා සාක්ෂාත් කරගැනීමට වඩාත් සුදුසු ක්‍රියාවලීන් කවරේද යන්න පිළිබඳව රජයන් සහ සිවිල් සමාජ වැනි වූ මෙම කාර්යයට මුලපුරන්නන්ට පවතින අවබෝධය සීමිත බව සහභාගිවන්නන් විසින් සඳහන් කරන ලදී.සදනුස්මරණය යනු කුමක්ද? යමෙක් සදනුස්මරණ ව්‍යාපෘතියක් ආරම්භ කරන්නේ කෙසේද? අනෙකුත් පශ්චාත්-ගැටුම් සංවර්ධන අවශ්‍යතා සලකා බලන කල සදනුස්මරණයට ප්‍රමුඛතාවය ලබාදිය යුතුද? පෙර පැවති ඒකාධිපතිවාදී සහ පීඩාකාරී පාලන තන්ත්‍ර නියෝජනය කරමින් ඇතිකර තිබෙන ස්මාරක සම්බන්ධ ගැටළුව ආමන්ත්‍රණය කළයුත්තේ කෙසේද? සදනුස්මරණ ව්‍යාපෘතියක ප්‍රධාන පාර්ශවකරුවන් කවුද?

සදනුස්මරණය සම්බන්ධයෙන් දැනට පවතින සම්පත් අතරින් බහුතරය උරුමය හෝ කෞතුකාගාර අධ්‍යනය වැනි විශේෂිත ක්ෂේත්‍ර කිහිපයකට පමණක් සීමා වී ඇති අතර පශ්චාත්-ගැටුම් සදනුස්මරණය පිළිබඳව අවධානය යොමු කරන අවස්ථාවන්හි පවා ඒහා බැඳුනු අභියෝග, එය සාර්ථක වූ අවස්ථා සහ ඊට අදළ යහ පරිචයන් පිළිබඳ සාකච්ඡා කරනු වෙනුවට පශ්චාත්-ගැටුම් පසුබිමක සදනුස්මරණය පිළිබඳව වන පුළුල් වූ දළ විශ්ලේෂණයකට පමණක් සීමා වී තිබෙන බව සහභාගිවන්නෝ තවදුරටත් පැවසූහ.

මෙම මෙවලම් කට්ටලය මගින් එකී අඩුපාඩුව සපුරාලීමට වෑයම් කරනු ලැබේ. හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය අවධාරණය කරන එක් මාර්ගෝපදේශ මූලධර්මයක් වන්නේ එකිනෙකාගෙන් ඉගෙන ගැනීම සහ අදහස් හා යහපරිචයන් බෙදාහදාගැනීම කෙරෙහි වැඩි වැදගත්කමක් ලබාදීමයි.ඒ අනුව මෙම මෙවලම් කට්ටලය විවිධාකාරයේ පශ්චාත්-ගැටුම් පසුබිම්

වෙතින් එන සාමාජිකයින් විසින් සිදුකළ විවිධ කාර්යයන් තුළින් උකහාගත් දැනුම ඇතුළත් වන සහයෝගී ප්‍රයත්නයක් වේ. 2010 ජුනි මාසයේ පැවැත්වූ හමුවට සහභාගිවූවන් විසින් පල කළ අදහස් හා යෙදවුම් භාවිතා කරමින් මෙම මෙවලම් කට්ටලය සම්පාදනය කරනු ලැබුවෙ ලේකම් කාර්යාලයේ කාර්යමණ්ඩලය විසිනි.

සදනුස්මරණය යනු පසුබිමින් පසුබිමට වෙනස්වන්නක් වන අතර 'සියළු දෙනාටම සරිලන' එක් සංකල්පයක් නොමැත. කෙසේනමුත්, සන්ධාන සාමාජිකයින් විසින් සිදුකර ඇති කාර්යයන්ගේ විවිධත්වය මෙන්ම එක් එක් සාමාජික ස්ථානය ක්‍රියාත්මක වන්නා වූ පසුබිම් ගත් කල ඒවායේ පුළුල් පරාසය ප්‍රයෝජනයට ගනිමින් පශ්චාත්-ගැටුම් ජන සමාජ තුළ සදනුස්මරණය පිළිබඳව දළ විශ්ලේෂණයක් සිදු කිරීමටත්, උගත් පාඩම් බෙදාහදා ගැනීමටත්, සදනුස්මරණ මුලපිරීම් සිදුකිරීමේදී මුහුණපාන්නට සිදුවන ඇතැම් පොදු අභියෝග ආමන්ත්‍රණය කළ හැකි නිර්මාණාත්මක ක්‍රම සඳහන් කිරීම තුළින් යහ පරිචයන් ඇතිකරගැනීම කරා ළඟාවීමට කටයුතු කිරීමටත් මෙම මෙවලම් කට්ටලය අපේක්ෂා කරයි.ඒ අනුව, පශ්චාත්-ගැටුම් පසුබිම්වල සදනුස්මරණය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් මූලික මගපෙන්වීමක් මෙම මෙවලම් කට්ටලයෙන් ලබාදෙනු ඇති නමුත් ඒවා විවිධ පසුබිම්වලට සහ විවිධ පශ්චාත්-ගැටුම් අවශ්‍යතාවයන්ට සරිලන පරිද්දෙන් හැඩගස්වාගෙන භාවිතා කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මතකයේ සිට ක්‍රියාවන් දක්වා මහජනතාව ගෙනයමින් වෙනසක් ඇති කිරීමට මුලපිරීම සඳහා මතකය යොදාගැනීමට අප විසින් වෑයම් කරන හෙයින් ඉගෙනුම් ප්‍රජාව ශක්තිමත් කිරීමට ද මෙම මෙවලම් කට්ටලය දායක වනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු!




# දෙවන පරිච්ඡේදය

## සදනුස්මරණය යනු කුමක්ද?

## සදනුස්මරණය සහ සංක්‍රාන්තික යුක්තිය

**සදනුස්මරණය යනු** මතකය චිරස්ථාපනය කිරීමේ ක්‍රියාවලියයි. එය ගරුකිරීමේ, පිළිගැනීමට ලක් කිරීමේ සහ මතකයේ රඳවාගැනීමේ ක්‍රමයක් වන අතර ඉපැරණි වූ සංකල්පයකි. විසිවන සියවසේ අගභාගයේ සිට මතකය සහ සදනුස්මරණය සම්බන්ධ ප්‍රශ්නයට ශාස්ත්‍රීය, දේශපාලනික සහ සමාජයීය මට්ටමින් ලබාදෙන වැදගත්කම ක්‍රමක්‍රමයෙන් වර්ධනය වී තිබේ.දෙවන ලෝක යුද්ධය සහ ඉන් අනතුරුව ගෝලීය, සමාජයීය හා දේශපාලනික තලයන්හි ඇතිවූ වෙනස්කම් ඊට හේතු වන්නට ඇති බව බොහෝ ශාස්ත්‍රඥයින්ගේ මතයයි. නට්සිවරුන් විසින් යුදෙව්වන් සමූලඝාතනයත් සමගින් වින්දිතයින්ගේ අයිතිවාසිකම් සහ සදචාරය, යුක්තිය සහ අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ඇති ගැටළු පිළිබඳව සැලකිලිමත්වීම වර්ධනය වී තිබේ.[1]ප්‍රචණ්ඩත්වයේ විපාකයන්ට මුහුණදුන් ජනසමාජ වින්දිතයින්ගේ භෞතිකමය, චිත්තවේගීමය සහ සදචාරමය අවශ්‍යතා සපුරාලීම ප්‍රධාන කොටගනිමින් අතීතය ආමන්ත්‍රණය සඳහා වන ක්‍රම කෙරෙහි අවධානය යොමු කරන්නට ආරම්භ කිරීමත් සමගින් සංක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනය තුළින් මීට වඩවඩාත් සහය ලැබිණි.

ආර්ජන්ටිනාව, චිලී, දකුණු අප්‍රිකාව, සියෙරා ලියෝනය, කාම්බෝජය සහ බංග්ලාදේශය වැනි රටවල යුක්තිය සඳහා ඉඩකඩ සාද දෙමින් මතකය සහ සදනුස්මරණය එතැන් පටන් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් බවට පත්ව තිබේ. වන්දි ලබාදීමේ සංකේතාත්මක ක්‍රමයක් වශයෙන් සත්‍ය කොමිෂන් වාර්තාවල සඳහන් කර ඇති මතකය යන සංකල්පය අතීතය ක්‍රම ක්‍රමයෙන් පිළිගැනීම සමගින් බැඳුනු අංගයක් වශයෙන් සහ නිරවද්‍ය ඓතිහාසික වාර්තා ඇතිකිරීමට අපේක්ෂා කරන ඕනෑම සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක වැදගත් අංගයක් වශයෙන්ලබා ඇති පිළිගැනීම කෙමෙන් වර්ධනය වෙමින් පවතියි.වින්දිතයින් පිළිගැනීමට ලක් කිරීමට හා පුළුල් ප්‍රතිසන්ධාන ක්‍රියාවලීන්ට දයකත්වය ලබාදීමට අපේක්ෂා කරන්නාවූ සංකේතාත්මක වන්දි ගෙවීම් කාණ්ඩයක් වශයෙන් පශ්චාත් යුධ සදනුස්මරණය වන්දි නැමැති මාතෘකා පාඨය යටතට ඇතුළත් වී තිබේ.උදහරණ ලෙස දකුණු අප්‍රිකානු සත්‍ය හා ප්‍රතිසන්ධාන වාර්තාව ගතහොත් එහි මතකයේ රඳවා ගැනීම සහ ප්‍රතිසන්ධානයසඳහා ජාතීන් අතර ඇතිවන ක්‍රියාවලියට පහසුකම් සැලසීමට හැකි ක්‍රියාමාර්ග වශයෙන් වන්දි ගෙවීම පිණිසවන පුළුල් ක්‍රමෝපායේ කොටසක් ලෙස සංකේතාත්මක වන්දි ගෙවීම‍නිර්දේශ කර තිබේ.සදනුස්මරණය සත්‍ය කොමිෂන් සභා හෝ නඩුවිභාග වැනි සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන්ට පමණක් සීමා නොවන බවත් සත්‍ය සොයාගැනීම සහ වගවීම වැනි වූ පුළුල් සංක්‍රාන්තික යුක්ති ඉලක්ක සඳහා දයකත්වය ලබාදෙන අතරේම සත්‍ය කොමිෂන් සභාවල නිර්දේශයන්ගෙන් පරිබාහිරවද එය සිදුවිය හැකි බව සැලකිල්ලට ගතයුතු වේ.

සදනුස්මරණය පිළිබඳ සිතනවිට වහාම අපගේ සිතට නැගෙන්නේ ස්මාරක හෝ සිහිවටන, ගඩොල් හා බදාම වැනි දෑ වේ. එනමුත් ස්මාරක සහ සිහිවටන යනු සදනුස්මරණයේ එක් අංගයක් පමණි. ප්‍රජාවේ අවශ්‍යතාවය සපුරාලන්නා වූ වඩාත් ස්වභාවිකවූත් එතරම් ස්ථිරසාර නොවන්නාවූත් මුලපිරීම් ද සදනුස්මරණයට ඇතුළත් වන්නට ඉඩ තිබේ.සදනුස්මරණයේ විවිධ ස්වරූප අතරට කෞතුකාගාර, අනුස්මරණ උත්සව, සමාව අයැදීම, පොදු පහසුකම් සඳහා වෙනත් නම් යෙදීම, යළි භූමදනය සහ මතක ව්‍යාපෘති ඇතුළත් විය හැකි අතර, එය ඒවාට පමණක් සීමා නොවේ.

[1]විලසාර් බර්කන්, "Introduction: Amending Historical Injustices in International Morality" In The Guilt of Nations (ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2000) සහ චාල්ස් මයර්, "Overcoming the Past? Narrative and Negotiation, Remembering and Reparation: Issues at the Interface of History and Law" in Politics and the Past: On Repairing Historical Injustices", ජෝන් ටොර්පි (සංස්.), (රෝමන් ඇන්ඩ් ලිට්ල්ෆීල්ඩ්, 2003) බලන්න.

  

**ඔබ සිතන අන්දමට සදනුස්මරණ ව්‍යාපෘතියක් යනු කුමක්ද?**

## සදනුස්මරණයේ කර්තව්‍යයන්

සදනුස්මරණය යනු සමාජ සහ දේශපාලනික ක්‍රියාවලියක් වන අතර ස්වභාවය අනුව සෑමවිටකම එය විවාදයට විවෘතය. විවාදයට ලක්වීමෙන්ම පශ්චාත්-ගැටුම් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට තර්ජනයක් එල්ල නොවූවත් සංවේදී අන්දමින් එම තත්වය පිළිබඳව ක්‍රියා නොකළහොත් සදනුස්මරණය මගින් යහපතට වඩා හානියක් වීමට ඉඩ තිබේ.බොහෝවිට අවධාරණය කෙරෙන්නේ අවසන් නිමැවුම පිළිබඳව වුවත් එම අවසන් නිමැවුම ඇතිකරගැනීම දක්වා ක්‍රියාත්මක වීම පිණිස නිරතවන්නා වූ ක්‍රියාවලිය මත සදනුස්මරණයේ සාර්ථකත්වය බොහෝදුරකට රඳා පවතියි.තවද, සදනුස්මරණ ව්‍යාපෘතියක සාර්ථකත්වය රඳා පවතින්නේ ජනප්‍රජාවේ පුළුල් අවශ්‍යතා සපුරාලීමට එයට ඇති හැකියාව සහ දීර්ඝකාලීනව ප්‍රජාව සම්බන්ධ කරගැනීමෙහිලා එය නිරූපණය කරන භූමිකාව මත වේ.

පශ්චාත්-ගැටුම් සදනුස්මරණයේ කර්තව්‍යයන් එක් එක් පසුබිමින් පසුබිමට වෙනස්විය හැකි අතර එමගින් එක් පශ්චාත්-ගැටුම් ප්‍රතිසන්ධාන සහ සාමය ගොඩනැංවීමේ ඉලක්කයකට වැඩි ඉලක්ක සංඛ්‍යාවක් සපුරාලීමට ද ඉඩ තිබේ. මෙහිදී ඇතැම් කර්තව්‍යයන් අතිච්ඡාදනය වීමට ඉඩ ඇතත් ආරම්භයේ සිටමව්‍යාපෘතියට පැහැදිලි ඉලක්ක පැවතීම වැදගත් වේ.පුළුල් සංක්‍රාන්තික යුක්ති ඉලක්කයන්ගෙන් ඇතැම් ඒවා සදනුස්මරණ මුලපිරීම් හරහා සපුරාලන ආකාරය පහත උදාහරණ මගින් පැහැදිලි කර තිබේ.

**පශ්චාත්-ගැටුම් ප්‍රතිසංස්කරණ තුළ සදනුස්මරණයට සාක්ෂාත් කළහැකි දෑ:**

- **ප්‍රතිසන්ධානය (Reconciliation)**: පොදු ව්‍යාපෘතියක වැඩකිරීම සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් දෙකක් එකට හමු කරවීම පෙර බෙදී වෙන්වී සිටි ප්‍රජාවන් අතර සබඳතා යළි ගොඩනැංවීමට දයක වනු ඇත.

- **පිළිගැනීම (Recognition)**: වින්දිතයින් පිළිගැනීමට ලක් කර සමාජය සමගින් නැවත ඒකාබද්ධ කිරීම සඳහා එමගින් ඉඩ සලසා දෙනු ඇත.

- **ජාතික අනන්‍යතාව ප්‍රවර්ධනය (Promoting National Identity)**: අතීතය සම්බන්ධයෙන් වන විකෘති කර දැක්වීම් ආමන්ත්‍රණය කර සමාජයේ සියළු කණ්ඩායම් ඇතුළත්වන ජාතික කතාන්දරයක් යළි ලිවීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ජාතික අනන්‍යතාවයේ නව යුගයක් උදා කරන්නට සදනුස්මරණයට හැකි වේ.

- **සුවවීම (Healing)**: බොහෝ ගැටුම්කාරී තත්ව යටතේ සිදුවන බරපතළ මානව හිමිකම් උල්ලංඝන අතරට අතුරුදන්වීම් සහ සමූහ ඝාතන ඇතුළත් වේ. එවන් පුද්ගලයින්ගේ භෂ්මාවශේෂ නොමැති තත්ත්වයක් යටතේ ජීවත්වන්නවුන්ට ශෝකවීමට සහ ආවර්ජනයට ඉඩක් ලබාදෙමින් දීර්ඝකාලීනව සුවය ලැබීමට සදනුස්මරණ ස්ථාන දායක වනු ලැබේ.

- **සත්‍ය පැවසීම සහ ඓතිහාසික වාර්තා නිවැරදි කිරීම (Truth-telling and setting the historical record straight)** : මානව හිමිකම් උල්ලංඝන ලේඛනගත කිරීම තුළින් සදනුස්මරණ ව්‍යාපෘති පුළුල් වූ පශ්චාත්-ගැටුම් සත්‍ය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලීන්ට දායකවනු ලැබේ. තවද, මතකයේ තබාගැනීම සඳහා ඇති කරන එවන් ස්ථාන බරපතළ මානව හිමිකම් උල්ලංඝන සඳහා භෞතික සාක්ෂි ද ලබාදීමය ඉඩ තිබේ.

- **ප්‍රජාව සම්බන්ධවීම (Civic Engagement)**: ආඥාදායක පාලන තන්ත්‍රයන්ගෙන් හෝ බරපතළ මානව හිමිකම් උල්ලංඝනයවීම්වලින් අනතුරුව බිහිවන සමාජ බොහෝවිට නිහඬබවේ සංස්කෘතිය සහ ප්‍රජා කර්තව්‍ය සඳහා මහජනතාවගේ සම්බන්ධවීම දුර්වලවීම වැනි ලක්ෂණයන්ගෙන් හෙබි වේ. සදනුස්මරණ ක්‍රියාවලිය සහ මතක ස්ථානයන්හි අඛණ්ඩව සිදු කෙරෙන දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා වැඩදායක මහජන සංවාද, සාකච්ඡා සහ විවාද ප්‍රවර්ධනය කිරීමට සදනුස්මරණ ව්‍යාපෘතීන්ට හැකිවනු ඇත.

- **නැවත කිසිදා සිදු නොවිය යුතුයි! (Never Again!)** අධ්‍යාපන වැඩසටහන් හරහා මානව හිමිකම්වලට ගරුකරන සංස්කෘතීන් ප්‍රවර්ධනය කර අනාගතයේදී ප්‍රචණ්ඩත්වයේ චක්‍ර ඇති නොවන බවට වගබලාගැනීමට සදනුස්මරණ මුලපිරීම්වලට හැකිය.

# ප්‍රතිසන්ධානය (Reconciliation) කරා ළඟාවීම පිණිස සදනුස්මරණය

'ප්‍රතිසන්ධානය' **(Reconciliation)** යන යෙදුම සංක්‍රාන්තික යුක්ති සංවාදය තුළ අනිවාර්යය අංගයක් වුවද එම යෙදුමේ නිශ්චිත අරුත පිලිබඳව පොදු එකඟතාවයක් නොමැත.ප්‍රතිසන්ධානය යන්නෙහි අරුත විවිධ පසුබිම් අනුව වෙනස් වන නමුත් ප්‍රතිසන්ධානය යනුවෙන් පොදුවේ අදහස් කෙරෙන්නේ අතීතයේ සිදුවූ දෑ පිළිබඳව ඇති කතාව පොදුවේ පිළිගැනීම මත පදනම් වූ, අනාගතය දිශානත කරගත් යළි-ගොඩනැංවීමේ ක්‍රියාවලියක් වේ.[2]පෙර සතුරන්ව සිටි පාර්ශව අතර සබඳතා යළි ගොඩනැගීමට වඩා යමක් ප්‍රතිසන්ධානයට ඇතුළත් වන අතර ඒ සඳහා සමාජයේ විවිධ මට්ටම්වලදී සබඳතා යළි ගොඩනැගීම වුවමනා කෙරෙන අතර, පරම්පරා අතර ප්‍රතිසන්ධානය, වින්දිතයින් සහ ඔහුගේ/ඇයගේ ප්‍රජාව අතර ප්‍රතිසන්ධානය මෙන්ම විවිධ වින්දිත කණ්ඩායම් අතර ප්‍රතිසන්ධානය ද ඊට ඇතුළත්වීමට ඉඩ තිබේ.

[2]ප්‍රිසිල්ලා හේනර්, *Unspeakable Truths: Transitional Justice and the Challenge of Truth Commissions* (රූට්ලෙජ් 2002) බලන්න

අතීතයේ සිදුවූ දේ සලකාබැලීමක් සිදු නොවන්නේ නම් ප්‍රතිසන්ධානය සාක්ෂාත් කරගත හැකිද? විධිමත් සංක්‍රාන්තික යුක්ති යන්ත්‍රණයක් නොමැති තත්ව යටතේ සඳනුස්මරණයට ප්‍රතිසන්ධාන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබාදිය හැක්කේ කෙසේද?

# රුසියාවේ පර්ම් 36 - ගුලාග් කෞතුකාගාරය



*පර්ම් 36 -ගුලාග් කෞතුකාගාරය නැරඹීමට පැමිණි අමුත්තන්*

1980 දශකයේ එය අභාවයට යනතෙක් සෝවියට් පාලන තන්ත්‍රය පැවති වසර 70කට අධික කාලය මුළුල්ලේම දේශපාලනමය වශයෙන් විරුද්ධ මතයක් ගැනීම අපරාධයක් ලෙස සලකන ලදී. 1930 දශකයේ ස්ටාලින්ගේ නායකත්වය යටතේ රජයට එරෙහි සැබෑ මෙන්ම සිතින් මවාගත් සතුරන්ට එරෙහිව සිදුකළ පවිත්‍රකිරීමේ (Purges) මෙහෙයුම්වල උච්ඡස්ථානයට ළඟාවූ සමයෙහි ගුලාග් සිර කඳවුරු නමින් බලහත්කරයෙන් වැඩ ගැනීම සඳහා සකස් කළවිස්තීර්ණශ්‍රම කඳවුරු ක්‍රමයක් ආර්ථිකය සමගින් ඒකාබද්ධ කරන ලදී.පර්ම් නගරයට පිටතින් උරල් කඳු පෙල මත සයිබීරියානු සීමාවට ආසන්නයේ පිහිටවා තිබූ, පර්ම්-36 යන රහස් නාමයෙන් හැඳින්වූ කඳවුර ස්ටාලින් පාලන සමයේ ඇති කළ එවන් කඳවුරු දහස් ගණනකින් එකකි. අද වන විට රුසියාව තුළ ඓතිහාසික ස්ථානයක් සහ කෞතුකාගාරයක් වශයෙන් සංරක්ෂණය කරන ලදුව ඉතිරිව පවත්නා එකම සෝවියට් සමයේ ශ්‍රම කඳවුර පර්ම්-36 හි ඇති ගුලාග් කෞතුකාගාරයයි.හැත්තෑව දශකයේ සහ අසූව දශකයේ මුල්භාගයේදී පර්ම්-36 හි පිහිටා තිබූ සිර කඳවුරේ සුප්‍රසිද්ධ විරුද්ධමතවාදී සෝවියට් ජාතිකයින් රඳවා සිටි හෙයින්එය විශේෂයෙන්ම කුප්‍රකට වී තිබූ අතර සර්ගෙයි කොවලෙව්, වසිල් ස්ටුස් වැන්නවුන් ඒ අතර විය.සෝවියට් සංගමයේ සිර කඳවුරු අතරින් අවසානයටම වසා දැමූ කඳවුරක් වන පර්ම් - 36 වසා දැමුයේ 1988දීය. බලහත්කාරයෙන් වැඩගැනීම සඳහා ඇතිකළ සිර කඳවුරක් ගුලාග් වින්දිතයින් වෙනුවෙන් කැප කළ ස්මාරකයක් වශයෙන් සංරක්ෂණය කිරීමට වුවමනා කළ පුරෝගාමී මානව හිමිකම් ක්‍රියාකරුවන් සහ ඉතිහාසඥයින් කණ්ඩායමක් එක්ව මෙම කඳවුර විනාශ මුඛයෙන් ගලවාගෙන පර්ම්-36 හි ගුලාග් කෞතුකාගාරය ආරම්භ කරන්නට 1991 දී කටයුතු කළහ.

1995දී මෙම කඳවුර ගුලාග් කඳවුරු තුළ ජීවිත අහිමිවූවන්ගේ මතකය වෙනුවෙන් නිල වශයෙන් කැපකළ අවස්ථාවට හිටපු සිරකරුවන් මෙන්ම හිටපු සිර කඳවුරු ආරක්ෂකයින්ද සහභාගි වූහ. එහිදී ඔවුහු තමතමන්ගේ දෘෂ්ටිකෝණයෙන් එම ස්ථානයේ 'චාරිකා' සඳහා එකිනෙකාව කැඳවාගෙන ගියහ.ඒ සම්බන්ධයෙන් විධිමත් න්‍යායපත්‍රයක් හෝ ප්‍රතිසන්ධාන ප්‍රතිඵලයක් නොවූවද එම හමුවේදී සියළුදෙනා එක හඬින් දිවුරා සිටියේ 'සිර කඳවුරුවල ආරක්ෂකයින් නියුරම්බර්ග් විලාසයේ නඩු විමසීමකට භාජනය නොකරන' බවයි.[3]1970 දශකයේ මුල්භාගයේදී සිර කඳවුරේ රඳවාතබාගැනීමට ලක්වූ සර්ගෙයි පොනොමර්යෙව් සඳහන් කළේ 'සෑහෙන තරම් අධිකරණ සහ සෑහෙන තරම් රුධිරය හැලීම් සිදුව තිබේ' යනුවෙනි. 'අප පශ්චාත්තාපවීමට සහය දෙන්නෙමු'. මෙම චාරිකාව මුලුල්ලේ නින්නාද දුන්නේ මානව ආධ්‍යාත්මයේ ජයග්‍රහණයත් කුඩා හා මහා පරිමාණ කෲරකම් යටපත් කළ එදිනෙද ජයග්‍රහණත් ය. එම හමුව සහ එම ස්ථානයේ පැවැත්වූ සංවාදය මගින් සිරකරුවන්ට හා සිර කඳවුරු ආරක්ෂකයින්ට මනුෂ්‍යයින් වශයෙන් එකිනෙකා අභිමුවට පැමිණීමට බල කර සිටි අතර එතුළින් තමන් පෞද්ගලිකව යථා තත්වයට පැමිණීමේ ගමනේ සැලකියයුතු පියවරක් තැබීමට ඔවුනට ඉඩ ලැබිණි.

[3] *Back To The GULAG නිව්ස්වීක් සඟරාව, 1995 ඔක්තෝබර් 24*http://www.newsweek.com/1995/09/24/back-to-the-gulag.
html

මෙම ඉතිහාසය පිළිබඳ මතකය ලෝකයෙන් ඉක්මනින්ම වියැකී යන්නට ඇරඹුණු විට ගුලාග් කෞතුකාගාර කණ්ඩායම අවබෝධ කරගත්තේ ගුලාග් සිර කඳවුරු පද්ධතියේ මතකය සක්‍රිය කර ඒකාධිපතිවාදය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමට නම් එක් කඳවුරක සෘජුවම අත්දැකීම් ලත් පුද්ගලයින් අතර භේද සමාදානය කිරීමට වඩා වැඩි යමක් වුවමනා බවයි.සෝවියට් සංගමය තුල විධිමත් සත්‍ය සෙවීමේ ක්‍රියාවලියක් නොවූ අතර අතීතය පිළිබඳව බහුවිධ මෙන්ම බොහෝවිටක චමත්කාරජනක වූ දෘෂ්ටිකෝණ පැවතිණි.[4]

## සදනුස්මරණය සහ සත්‍ය පැවසීම

පීඩාකාරී පාලනතන්ත්‍ර හා දිගැදුණු ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් සමාජ ඉදිරියේ ඇති එක් බරපතල අභියෝගයක් වන්නේ පෙර පැවති පාලනතන්ත්‍ර විසින් සිදුකළ සත්‍ය විකෘති කොට දැක්වීම් සහ ප්‍රතික්ෂේප කිරීම් සම්බන්ධයෙන් කටයුතු කෙරෙන පරිදි අතීතය ආමන්ත්‍රණය සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය තීරණය කිරීමයි. එවන් සංක්‍රාන්ති සමයක් තුළ සත්‍ය කොමිෂන් සභා , ලේඛනාගාරවල ඇති තොරතුරු හා අතුරුදන් වුවන් සම්බන්ධයෙන් සිදුකෙරෙන අධිකරණ වෛද්‍ය විමර්ශන වැනි සත්‍ය සොයන්නාවූ යන්ත්‍රණ තවදුරටත් රහස්‍ය නොවන බව ප්‍රකාශ කිරීම යනාදියමගින් ප්‍රතික්ෂේප කිරීම හා නිහඬව සිටීම වෙනුවට ඉතිහාසය පිළිගැනීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අතීතය සහ වින්දිතයින්ට මුහුණ දෙන්නට වූ අත්දැකීම් පිළිබඳ සත්‍ය දැනගැනීමට වින්දිතයින්ට ඇති අයිතියෙහි අනිවාර්ය අංගයක් එමගින් සපුරාලනු ලැබේ.

සදනුස්මරණ ක්‍රියාකාරකම්, සියළුම පුරවැසියන් ඇතුළත් කරගන්නා අතරම ක්‍රෑර ලෙස මානව හිමිකම් උල්ලංඝනයට ලක් වූවන්ගේ අත්දැකීම් නීතියෙන් පිළිගැනීමට ලක් කෙරෙන අන්දමින් ඉතිහාසය යළි ලියාදැක්වීමට යොදගත හැකි ප්‍රබල යන්ත්‍රණ විය හැකිය. තවද, උල්ලංඝන ලේඛනගත කිරීම සහ ඓතිහාසික වාර්තා නිවැරදි කිරීම සඳහා එමගින් සිදුකෙරෙන ක්‍රියා හරහා තෝරාගත් පුද්ගල කණ්ඩායමක් පමණක් සම්බන්ධ කරගන්නා සත්‍ය පැවසීමේ ක්‍රියාවලියට වඩා පුළුල් වූ පොදුජන පරාසයක් කරා ළඟාවීමේ හැකියාව ඇත.

මානව හිමිකම් උල්ලංඝන ලේඛනගත කිරීම සහ අතීතය පිළිබඳ ඇති කතාන්දර යළි ලියාදැක්වීම තුළින් ප්‍රතික්ෂේප කිරීම් සහ නිහඬතාවයට අභියෝග කිරීමට අමතරව, පෙර කලක වධකාගාර හෝ රැඳවුම් ස්ථාන වූ වත්මන් ස්මාරක ස්ථාන තුළින් සැබෑ සාක්ෂි සොයාගත හැකිවීමට ඉඩ ඇති අතර එවිට ඒවා වරදකරුවන්ට චෝදනා ගොනු කිරීම සහ දැනට සිදු කෙරෙමින් පවතින උල්ලංඝන ලේඛනගත කිරීම සඳහා යොදගැනීමට හැක.

- මානව හිමිකම් උල්ලංඝනය සිදුවුනු ස්ථානයක දැනට පවතින සාක්ෂි විධිමත් සත්‍ය සෙවීමේ ක්‍රියාවලි සහ ඒවායෙන් ඔබ්බට සාක්ෂි වශයෙන් දයක වන්නේ කෙසේද?
- සත්‍ය පැවසීමට හා සඟවන ලද්දවූත් විකෘති කරන ලද්දවූත් අතීතයක් හෙළිදරවු කිරීමට සදනුස්මරණ මුලපිරීම් යොදගත හැක්කේ කෙසේද?

[4] ක්‍රමෝපායික සහ ජාත්‍යන්තර අධ්‍යයන සඳහා වන මධ්‍යස්ථානය 2003 වසරේ පැවැත්වූ මත විමසුමකදී රුසියානු වැඩිහිටියන්ගෙන් හතරෙන් එකකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහන් කළේ ස්ටාලින් ජීවත්ව සිටියේ නම් හා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේනම් ඔවුන් අනිවාර්යයෙන්ම හෝ බොහෝදුරට ඔහුට තම ඡන්දය ලබාදෙන බවකි. තමන් එසේ නොකරන බව සහතික වශයෙන්ම පැවසුවේ සියයට 40කට අඩු සංඛ්‍යාවකි. ඓතිහාසික වාර්තා නිවැරදි කිරීම ඉලක්ක කරගත් සත්‍ය කොමිෂන් ක්‍රියාවලි පැවතියද මතකයේ නිසඟයෙන්ම ඇති වාදයට තුඩුදෙන ස්වරූපය හේතුවෙන් අතීතය පිළිබඳව සෑමවිටකම බහුවිධ දෘෂ්ටිකෝණ පවතිනු ඇත. මයර් (2003) සඳහන් කරන පරිදි ඉතිහාස කථාවේ විවාදයට තුඩුදෙන ස්වරූපය හේතුවෙන් සියළුදෙනා එකඟවන එක් ප්‍රධාන කතාවක් පැවතිය නොහැකි නමුත්එකිනෙකා සමග එක්ව වාසය කිරීමට එකඟ වන විරුද්ධ මත දරන පුද්ගල කණ්ඩායම්වලට වැදගත්වන, සිදුවීම්වලට යටින් දිවෙන ගැටළු ඒකරාශී කරන්නා වූ මූලික කතා වස්තු දෙකක් හෝ තුනක් සම්බන්ධයෙන් එකඟවීමට අදළ සමාජයට හැකිය.

# කෙන්යාවේ න්‍යායෝ හවුස් (Nyayo House)



*කෙන්යා මහාධිකරණය න්‍යායෝ හවුස් වෙතින් දිවි ගලවාගත් පුද්ගලයින් මුහුණ දුන් උල්ලංඝන වෙනුවෙන් වන්දි ප්‍රදානය කළ පසු එම දිවිගලවාගත්තවුන්*

1885 දී යටත්විජිතකරණයට ලක් වූ කෙන්යාව නිදහස් අරගල හා සම්බන්ධ වූ දිගැදුණු ප්‍රචණ්ඩත්වයේ චක්‍රයන්ටත්, පසුව දේශපාලන බෙදීම් හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වයටත් මුහුණ දෙන්නට සිදුවූ රටකි. 1963 දෙසැම්බර් 12 වනදින කෙන්යාවට නිදහස ලැබුණු අතර නිදහස් කෙන්යාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය එදින සිදු විය. ප්‍රජාතන්ත්‍රවාදය පෝෂණය කිරීමට අසමත් වූ පාලන ක්‍රම සහ දේශපාලනමය මැඩපැවැත්වීම් හා මානව හිමිකම් උල්ලංඝන සමගින් සම්බන්ධ වූ පාලනතන්ත්‍ර කෙන්යාවේ දේශපාලන ඉතිහාසයේ මූලික ලක්ෂණ බවට පත්ව තිබේ. යටත්විජිත (1895-1963) මෙන්ම පශ්චාත්-යටත්විජිත පාලකයින් විසින් වරදකරුවන් නීතියෙන් දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය කොතරම් තදින් එම සමාජයට කාවද්දා තිබේද යත් විස්තීර්ණ ප්‍රජාතාන්ත්‍රීකරණ ක්‍රියා සහ මෑතක සිදු වූ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලි සාර්ථකව ඇත්තේ ඉතා සුළුවෙන් පමණි.කෙසේනමුත්, මොයි ජනාධිපතිවරයා යටතේ ඒකාධිපතිවාදී පක්ෂයක් වූ කෙන්යානු ජාතික සංධානය2002 වසරේදී බලයෙන් පහ කරදැමීම වැනි වූ ජයග්‍රහණ ද කිහිපයක් තිබේ.

නයිරෝබි නුවර පිහිටා ඇති න්‍යායෝ හවුස් (Nyayo House) නමින් හඳුන්වන පළාත් මූලස්ථාන කාර්යාලය හිටපු ජනාධිපති මොයි විසින් උරුම කරදුන් කුප්‍රකට ස්ථානයකි. 1980 දශකයේ හා 1990 දශකයේ  මොයි ජනාධිපතිවරයාගේ පාලනය යටතේ මෙම ගොඩනැගිල්ල රහස් වධකාගාරයක් සහ රැඳවුම් ස්ථානයක් වශයෙන් කුප්‍රකට වූයේ රාජ්‍ය සේවා ගොඩනැගිල්ලක් වශයෙන් ක්‍රියාත්මක වන අතරේමය. ජලය භාවිතා කරමින් වධහිංසා සිදු කිරීම සහ සිර කුටි තුළ අධික ශීතෝෂ්ණ තත්ව ඇතිකිරීම යනාදිය ඇතුළුව විවිධ ස්වරූපයේ වධහිංසාවන්ට එහිදීසිරකරුවන් ලක් කර තිබේ.වධ හිංසා සිදුකරමින් ප්‍රශ්න කිරීමට ලක් කිරීම සඳහා තමන්ව න්‍යායෝ හවුස් ගොඩනැගිල්ලේ නව වන මහලට ගෙන ගිය බව ඉන් දිවි ගලවාගත්තවුන් වාර්තා කර ඇත. මෙම ගොඩනැගිල්ල යම් මට්ටමකට ජරාජීර්ණ වෙමින් පැවතියත් එම සිර කුටි ගොඩනැගිල්ලේ බිම් මට්ටමට පහළින් පිහිටි මාලයේ තවමත් දක්නට ලැබෙන අතර එය තවමත් රාජ්‍ය සේවා ගොඩනැගිල්ලක් වශයෙන් භාවිතා කෙරෙන හෙයින් එම සිරකුටි වෙත මහජනතාවට ප්‍රවේශ විය හැකිය.

2003 වසරේදී එරට අධිකරණ අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුත් අමාත්‍ය නියෝජිත මණ්ඩලයක් මෙම ස්ථානය පිළිබඳව මහජනතාවට හෙළිදරවු කළ අවස්ථාවේදී  සඳහන් කරනු ලැබුයේ කිබකි ජනාධිපතිවරයාගේ රජය මෙම ස්ථානය ජාතික ස්මාරකයක් බවට පත්කරන බවකි. කෙසේනමුත් දිවිගලවාගත්තවුන්ගේ සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම් නොසලකා හරිමින් පසුව එම ස්ථානය එසේ නම්කිරීමෙන් වැලකී සිටිමට රජය විසින් කටයුතු කරන ලදී.එරට මානව හිමිකම් සහ වින්දිතයින්ගේ සංවිධාන තර්ක කරන්නේ මෙම ස්ථානය උරුමයක් වශයෙන් නම් කිරීමට රජය පැකිලෙන්නේ සත්‍ය

[5] මැල්කෝම්බ්, ඩී සහ කිල්යාටා, ටී. (2008)*Memorialization and Transitional Justice in Kenya: A Cursory View* ප්‍රකාශයට පත් නොකළ විස්තර පත්‍රිකාව

[6]

පැවසීමට එම ස්ථානය සතුව ඇති හැකියාව හේතුවෙන් බවයි.වධහිංසා සිදුකිරීම සම්බන්ධයෙන් වන සාක්ෂිවලට අමතරව, මොයි ජනාධිපතිවරයා යටතේ ක්‍රියාත්මක වූ වධකාගාරයක් ලෙස න්‍යායෝ හවුස් ගොඩනැගිල්ල පිළිගැනීම තුළින් වත්මන් ජනාධිපතිවරයා වන කිබකි ජනාධිපතිවරයාද එම වරදට හසුවනු ඇත. මක්නිසාද යත් ඔහු මොයි පාලන සමයේ උපජනාධිපතිවරයා ලෙස කටයුතු කළ හෙයිනි.

ඉහත කී සිරකුටිවල බිත්ති වර්ණවත් කිරීම හා ආලෝකකරණය හරහා ඒවා 'නඩත්තු' කිරීමට පසු කාලීනව රජය විසින් උත්සාහ දරා ඇත. රජය තවදුරටත් මෙම ස්ථානයේ වෙනස්කම් සිදුකිරීම වලක්වාලීම සඳහා අධිකරණයෙන් සංරක්ෂණ නියෝගයක් ලබාගැනීමට එම ස්ථානයෙන් දිවිගලවාගත්තවුන් කෙන්යානු මානව හිමිකම් කොමිසමේ නායකත්වය යටතේ කටයුතු කළහ. එම කණ්ඩායමේ තර්කය වූයේ එම ගොඩනැගිල්ලේ ව්‍යුහයම වින්දිතයින් විසින් අත්විඳි වධහිංසා සම්බන්ධයෙන් සාක්ෂියක් වන බවත් එය 'නඩත්තු' කරන්නට යාම සැබැවින්ම එම වධහිංසා සම්බන්ධයෙන් වන වැදගත් දෘෂ්‍යමය සාක්ෂි සැඟවීමක් වන බවත්ය. ඒ අනුව 2009 පෙබරවාරි 16වන දින අතුරු සංරක්ෂණ නියෝගයක් නිකුත් කෙරුණු අතර අදටත් එය වලංගුය.

න්‍යායෝ හවුස් වින්දිතයින්ට අධිකරණයෙන් ලබාදුන් තීන්දු සම්බන්ධ වත්මන් තත්ත්වය පහත පරිදි වේ: වධහිංසාවට සහ රඳවාතැබීමට ලක්වූ වින්දිතයින් 21 දෙනෙකු රජයට එරෙහිව මහාධිකරණයේ පැවරූ නඩුව 2010 ජූලි 21වන දින එම වින්දිතයින් විසින් ජයග්‍රහණය කරන ලදී. ඔවුනට කෙන්යානු සිලිං මිලියන 40ක වන්දියක් ප්‍රදානය කරන ලදී. කෙන්යානු සත්‍ය, යුක්තිය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට පරිබාහිර ආයතනයකින් මෙසේ වන්දි ප්‍රදානය කිරීමට තීරණය කිරීම පුරෝගාමී කර්තව්‍යයක් විය. එම තීරණය එසේ ලබාදීමට මූලික හේතුව වූයේ ඉහත කී කොමිෂන් සභාව පිහිටවීමට පෙර මෙම නඩුව අධිකරණයේ පවරා තිබීම වුවත්, සිදුවීමේ වින්දිතයින්ට ඉන් අදහස් වූයේ අවසානයේ ඔවුනට යුක්තිය ඉෂ්ට වූ බවයි.තමන්ගේ ජයග්‍රහණය සැමරීම සහ අතීතයේදී භීෂණය සංකේතවත් කළ එම ස්ථානය සංකේතාත්මකව යළි ශිෂ්ටත්වය කරා ගෙන ඒම සඳහා එම වින්දිතයින් කලින් සැලසුම් නොකරම න්‍යායෝ හවුස් ගොඩනැගිල්ල කරා ගියහ.එමගින් එම ස්ථානයේ ඇති භෞතික සාක්ෂි තුළින් අතීතයේ ඔවුනට විඳින්නට වූ ගැහැට යළි මහජන අවධානයට ගෙන එන ලදී.

## සදනුස්මරණය තුළින් ප්‍රජාව සම්බන්ධ කරගැනීම සහ මහජන සහභාගීත්වය

නිහඬතාවය, විකෘති කර දැක්වීම් සහ මැඩ පැවැත්වීම් ඒකාධිපතිවාදී පාලනයක ලක්ෂණ වේ. ප්‍රචණ්ඩත්වය යළි ඇති නොවන බව සහතික කරගන්නා අතරේම මානව හිමිකම් මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදයේ සංස්කෘතියක් ගොඩනැගීමට නම් සාමය හා එවැනි සිදුවීම් යළි ඇති නොවීම පදනම් කරගෙන අතීතය සහ සිතින් මවාගත් අනාගතය හා බැඳුණු ගැටළු පිළිබඳව කටයුතු කිරීමට ප්‍රජාව සක්‍රියව සම්බන්ධ කරගැනීමට පශ්චාත්-ගැටුම් සමාජ කටයුතු කළයුතුය. සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලි සහ යන්ත්‍රණ බොහෝවිට දේශපාලන ප්‍රභූ කොටස් අතරට පමණක් සීමා වුවත් සදනුස්මරණ ව්‍යාපෘතියක සෑම අදියරක් තුළම අතීතය පිළිබඳව සහ අනාගතය සම්බන්ධයෙන් ඔවුන් සතු දැක්ම පිළිබඳව පුළුල් මහජනතාව සමගින් සංවාදයක සහ සාකච්ඡාවක නිරතවීමට ඉඩ සලසාලයි.

සදනුස්මරණය සෑමවිටකම පාහේ විවාදයට තුඩුදෙන කාරණයක් වන හෙයින් එම ක්‍රියාවලිය වෙත සුපරික්ෂාකාරී ලෙස එළඹ ඊට පහසුකම් සැලසීම තුළින් වැඩදායී මහජන සම්බන්ධවීමක් හා විවාද

[6] http://www.khrc.or.ke/

ඇතිවීම සඳහා දිරිදීමක් එතුළින්ම සිදුවනු ඇත. තවද, සම්පත් සීමිත වන හෙයින් අඛණ්ඩව මහජන සම්බන්ධවීම සහ සංවාද සිදුවන බව සහතික කරගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ක්‍රියාත්මකවීමටද මෙම අනුස්මරණ ස්ථානයන්ට හැකිය.

**සියෙරා ලියෝන විශේෂ අධිකරණය, සියෙරා ලියෝනය**

1991දී විප්ලවීය එක්සත් පෙරමුණ (RUF) විසින් දේශපාලන කුමන්ත්‍රණයක් සිදු කිරීමට දැරූ වෑයමත් සමගින් සියෙරා ලියෝනයේ 11 වසරක් මුළුල්ලේ පැවති සිවිල් යුද්ධයේ ඇරඹුම සටහන්වන ලදී. 1996 සහ 1999 සමය තුළ මෙම ගැටුම නිරාකරණය සඳහා ජාතික, කලාපීය මෙන්ම ජාත්‍යන්තර වෑයම් රැසක් සිදු වුවද යුද්ධය නිල වශයෙන් අවසන් බව ප්‍රකාශයට පත් වූයේ 2002දීය. ලෝමේ සාම ගිවිසුම ප්‍රකාරව සියෙරා ලියෝන සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම ඇතිකරන ලද අතර, සන්නද්ධ ගැටුම හා සම්බන්ධ මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් අපක්ෂපාතී ඓතිහාසික වාර්තාවක් සම්පාදනය සහ වින්දිතයින්ගේ අවශ්‍යතා වෙත ප්‍රතිචාර දැක්වීම ඉලක්ක කරගෙන එය 2000 වසරේ අරඹන ලදී.එහි පුළුල් අභිමතාර්ථය වූයේ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය සහ අතීතයේ සිදුවීම් යළි ඇතිවීම වලක්වාගැනීමයි.රජය සහ විප්ලවීය එක්සත් පෙරමුණ අතර ඇතිවූ ගැටුම ජීවිත දහස් ගණනක් අහිමිවීමට, ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් උල්ලංඝන දහස් ගණනකට, බලහත්කාරයෙන් අවතැන්කිරීම්වලට සහ ආබාධිතවීම් රැසක් සඳහා හේතු විය. මෙම බරපතළ මානව හිමිකම් උල්ලංඝන සහ මහා පරිමාණ ක්‍රෑරකම් පසෙක ලමින් සටන්කරුවන් සහ ජාතික සමගි ආණ්ඩුවේ කොටස්කරුවන් වූ RUF සාමාජිකයින් විසින් සිදුකළ අපරාධ සම්බන්ධයෙන් ඔවුනට මුක්තිය ලබාදීම ද සාම ගිවිසුම එක් අංගයක් විය.කෙසේනමුත්, සියෙරා ලියෝන රජයේ ඉල්ලීම මත RUF නායකයා අත් අඩංගුවට ගැනීමත් සමග බරපතළ මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් වැඩිම වගකීමක් දරන්නා වූ නායකයින්ට එරෙහිව නඩු පැවරීම තුළින් වරදට දඬුවම් නොලබා සිටීමේ ගැටළුව ආමන්ත්‍රණය සඳහා සියෙරා ලියෝන විශේෂ අධිකරණ ඇතිකිරීමට බලවරමක් ලබාදෙන යෝජනාවක් සම්මත කරගැනීමට එක්සත් ජාතික ආරක්ෂක මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.සියෙරා ලියෝන සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම සහ සියෙරා ලියෝන විශේෂ අධිකරණය එකම කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වූ අතර එතුළින් වින්දිතයින් සහ වරදකරුවන් යන දෙපාර්ශවයම පැටලිලිසහගත තත්වයකට පත් විය. මුක්තිය ලැබූ පුද්ගලයින්ට එරෙහිව පවා නඩු පැවරිය හැකි අන්දමින් මෙම ආයතන දෙක එක්ව වැඩකරමින් තොරතුරු බෙදා හදා ගන්නා බව බොහෝදෙනාගේ අදහස විය. සාකච්ඡා කර එළඹුණු බේරුම්කිරීම තුළ යුක්තිය ඉටුවූ බවක් බොහෝ වින්දිතයින්ට නොහැඟුණු අතර යුද්ධයෙන් අනතුරුව ඇති කළ යුක්ති යන්ත්‍රණ සම්බන්ධයෙන් පොදුවේ දක්නට ලැබුණු අඩු අවබෝධය හා හිමිකාරත්වය හේතුවෙන් රට පාලනය කරන ආයතන පිළිබඳව සියෙරා ලියෝන මහජනතාව තුළ අවිශ්වාසයක් ඇතිවිය.නිදහස් කළ වහලුන් සඳහා මුල්ම ජනාවාසය ඇතිකර දීම සහ උප-සහරානු අප්‍රිකාවේ මුල්ම විශ්වවිද්‍යාලය ඇතිකිරීම සම්බන්ධයෙන් ඓතිහාසික වශයෙන් නම් දරා සිටින සියෙරා ලියෝනය වර්තමානයේදී අප්‍රිකාවේ වඩාත්ම දුගී වූත් පාලනය හා සංවර්ධනය සමගින් බැඳුණු අභියෝග සමගින් පොරබදන රටක් බවට පත්ව තිබේ.තම ආර්ථිකය සහ සමාජ-දේශපාලන පසුබිම යළි ගොඩනංවාගැනීමට වෑයම් දරන අතරේ ප්‍රචණ්ඩත්වය සහ අසාර්ථක පාලනය සහිත තම ඉතිහාසය පිළිගැනීමට සියෙරා ලියෝනය කටයුතු කරන්නේ කෙසේද? සක්‍රියව ප්‍රජාතන්ත්‍රවාදය යළි ගොඩනැංවීමටත් යුක්තිය පිළිබඳ ගැටළු හා සම්බන්ධවී කටයුතු කිරීමටත් සාමයේ සංස්කෘතියක් ගොඩනැගීමට දායකවීමටත් සාමාන්‍ය පුරවැසියන් වගකීම් ගන්නේ කෙසේද?

සියෙරා ලියෝන විශේෂ අධිකරණය තම කටයුතු අවසන් කිරීමට සැරසෙද්දී සහ එම අධිකරණය විසින් මෙතෙක් භාවිතා කළ ෆ්‍රීටවුන් නුවර හෙක්ටාර 11.4ක් වන භූමි භාගය හා ගොඩනැගිලි සංකීර්ණය යොදාගැනීමට සුදුසු වන්නේ කුමන කාර්යයකටද යනාදිය තීරණය කරන මෙම අවස්ථාවේදී එකී අධිකරණයේ උරුමය සම්බන්ධ සැලසුම් සඳහා මගපෙන්වන්නේ ඉහත සඳහන් කළ ප්‍රශ්න වේ.

මෙම ස්ථානයෙන් කොටසක් මේ වනවිටත් සියෙරා ලියෝන රජයට ආපසු භාරදී ඇති අතර අධිකරණයේ බලවරම අවසන් වූ පසු ඉතිරියද භාරදීමට නියමිතය. 2010දී සියෙරා ලියෝන බන්ධනාගාර සේවාවට භාරදුන් රැඳවුම් ස්ථානය කාන්තා සිරකරුවන් හා අවදානම්පාත්‍ර කණ්ඩායම්වල වාසය සඳහා භාවිතා කෙරෙන අතර මෙම ස්ථානයෙන් කොටසක් සියෙරා ලියෝන නීති විද්‍යාලය පන්ති පැවැත්වීමට භාවිත කරයි.අධිකරණ ශාලාව සියෙරා ලියෝන ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ල වශයෙන් යොදාගැනීමටත් සාම උද්‍යානයක්, ස්මාරකයක් සහ වින්දිතයින් පිළිගැනීමට ලක් කරන සාම කෞතුකාගාරයක් ඇතිකිරීමට නියමිතය. යුද්ධයේ වින්දිතයින් පිළිගැනීමට ලක් කිරීමට අමතරව එරට

ගැටුමේ ඉතිහාසය හා කල්පවත්නා සාමය ගොඩ නැගීමට දැරූ වෑයම් ලේඛනගත කර සංරක්ෂණය කිරීමට මෙන්ම මානව හිමිකම් ගරු කරන, යහපාලනය ප්‍රවර්ධනය කරන හා අනාගතයේ ප්‍රචණ්ඩත්වය ඇතිවීම වලක්වන සංස්කෘතියක් ගොඩනැංවීමට එම මතකයන් භාවිතා කිරීමට ද කෞතුකගාරය හරහාඅපේක්ෂා කරයි.

සාම කෞතුකගාරය ඇතිකිරීමට නායකත්වය ලබාදීම සඳහා රජයේ, එක්සත් ජාතීන්ගේ සංගමයේ, සියෙරා ලියෝන විශේෂ අධිකරණයේ, ජාතික මනව හිමිකම් කොමිසමේ සහ ජාතික කෞතුකාගරයේ, යුද්ධයේ වින්දිතයින්ගේ සංගමයේ සහ අනෙකුත් සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයින්ගෙන් ඇතුළත්වන්නා වූ ජාතික පාර්ශවකරුවන්ගෙන් සැදි සාම කෞතුකාගාර කළමනාකරණ කමිටුව නම් කමිටුවක් ස්ථාපිත කර තිබේ.මෙම ව්‍යාපෘතියට සියළු පාර්ශව ඇතුළත්කරගන්නා බව සහතික කරගැනීම ඉලක්ක කරගෙන ඇතිකර තිබෙන මෙම කමිටුව සියෙරා ලියෝන වැසියන් විසින්ම මෙම කෞතුකාගාරය නිර්මාණය කර එහි හිමිකාරත්වය දරන බව සහතික කරගැනීම සඳහා ක්‍රියාත්මක වේ. මෙම ස්ථානයේ පොදු හිමිකාරත්වය නිර්මාණය කිරීමේ සහ පුළුල් වූ යුක්ති හා මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් මහජන සහභගීත්වය දිරිගැන්වීමේ ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් මහජනතාවට සමීපවීමේ විවිධ ව්‍යාපෘති දියත් කිරීමට කමිටුව කටයුතු කර තිබේ.කලින් කලට සිවිල් සමාජ සංවිධාන ඒකරාශී කෙරෙන්නා වූ විවිධ සංසදයන්ට අමතරව සාම කෞතුකාගාරයේ ඉලක්ක හා අභිමතාර්ථ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ සිදුවීම් සංවිධානය සහ සිදුවීම්වලට අනුග්‍රාහකත්වය දැක්වීමට කමිටුව කටයුතු කරයි. තවද, සාම කෞතුකාගාර ව්‍යාපෘතිය ජනතාවට හඳුන්වාදීමටත්, එක් රැස් කිරීමේ ක්‍රියාවලිය ඇරඹීමටත්, කෞතුකාගාරය සම්බන්ධ ගැටළු සඳහා මහජනතාව සම්බන්ධ කරගැනීමටත් මුළු රටෙහිම ව්‍යාප්ත වූ මහජනතාවට සමීපවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කමිටු සාමාජිකයෝ කටයුතු කළහ.ඕනෑම පසුබිමක් තුළ මෙම ක්‍රියාවලිය සිදුකිරීමේදී ලැබෙන ප්‍රතිඵල විවිධ හා අනපේක්ෂිත විය හැකි නමුත් ව්‍යාපෘතියේ හිමිකාරත්වය පිළිබඳ හැඟීමක් ගොඩනැංවීමට හා ඊට සහය වර්ධනය කරගැනීමට එය ඉතා වැදගත් පියවරක් වේ. මෙහිදී විවිධ ගැටළු සාකච්ඡාවට ගැනුණු අතර බොහෝ පුද්ගලයින් තමන්ගේ පෞද්ගලික අත්දැකීම් කෞතුකාගාරයේ වාර්තවලට ඇතුළත් කිරීම සඳහා ලබාදීමට ඉදිරිපත්වූහ. වින්දිතයින් හා වරදකරුවන් සම්බන්ධ සාක්ෂි ප්‍රකාශ ලබාගැනීමට සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම වෑයම් දැරුවද කොමිසම ඉදිරියේ සාක්ෂි ලබාදීමෙන් කුමන ප්‍රතිඵලයක් අත්වේදැයි පුද්ගලයින් සැකසහිත වූ බව ප්‍රජාවේ ඇතැම් සාමාජිකයෝ පැවසූහ.සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම අරඹා දස වසරක් ගතවීමට ආසන්නවන කාලය වනවිට තමන් ගැටුමේදී ලැබූ අත්දැකීම් පිළිබඳ කථා කිරීමට සූදානම් බවක් බොහෝ පුද්ගලයින්ට හැඟී ගොස් තිබිණි. අනෙත් අතට, යුධ අපරාධ සිදු කළ, මුක්තිය ලැබූ හෝ සත්‍ය සෙවීමේ ක්‍රියාවලියට සහභාගිවීමෙන් වැලකී සිටි ප්‍රජා සාමාජිකයින්ගේ අදහස වූයේ මෙම සාම කෞතුකාගාර වැඩසටානද සත්‍ය සෙවීමේ ක්‍රියාවලියේම කොටසක් වන බව වූ අතර ඔවුහු එම ක්‍රියාවලිය පිළිබඳ  තම අවිශ්වාසය පල කළහ.රට මුළුල්ලේ ව්‍යාප්තව පැවති, ක්‍රෑරකම් සිදුකළ අනෙකුත් ස්ථානද සංරක්ෂණය හා එකිනෙක ඈඳීම සාම කෞතුකාගාරය සකස් කිරීම සමගින් සම්බන්ධ කළයුතු බව පාර්ශවකරුවන්ට පෙනී ගියේය.

තවදුරටත් ප්‍රජාවේ අදහස් ලබාගැනීමේ කටයුතු සහ මහජනතාව සම්බන්ධ කරගැනීමේ කටයුතු සිදු කිරීමට කමිටුව සූදානම් වුවත් ඒ සඳහා පවතින සම්පත් සීමිතය. එනමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුරේම, පවතින සීමිත සම්පත් උපයෝගී කරගනිමින් යුක්තිය හා මානව හිමිකම් සම්බන්ධ ගැටළු පිළිබඳව මහජනතාව සමගින් සම්බන්ධවීමට ඔවුන් සමත්වී තිබෙන බව මෙහිදී සැලකිය යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැංවීම, ප්‍රජා සහභාගීත්වය සහ මානව හිමිකම් ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන යහපාලනය සඳහා වන ව්‍යාපාරය [7] නම් වූ, ෆ්‍රීටවුන් නුවර පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධානයක් හෘද සාක්ෂිය පිළිබිඹුකරන ස්ථානයන්හි  ජාත්‍යන්තර සන්ධානය සමගින් හවුල්ව ප්‍රචණ්ඩත්වය, ප්‍රතිසන්ධානය සහ සියෙරා ලියෝනය පිළිබඳ ඔවුන්ගේ දැක්ම සම්බන්ධයෙන් තරුණ කොටස් සමගින් සංවාදයක නිරතවීම සඳහා 2010 වර්ෂයේදී අධ්‍යාපන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී, යුක්තිය, සමාවදීම සහ ප්‍රතිසන්ධානය පිළිබඳ ගැටළු සහ වර්තමානයේ සියෙරා ලියෝන තරුණ කැලට අත්විඳින්නට වූ සිදුවීම් සමගින් එම ගැටළු සම්බන්ධ වන්නේ කෙසේද යන්න ආමන්ත්‍රණය සඳහා යහපාලනය සඳහා වන ව්‍යාපාරය විසින් යොදගත්තේ සියෙරා ලියෝන විශේෂ අධිකරණය පිහිටි ස්ථානයයි.

මෙම ගැටළු වෙත අවධානය යොමු කිරීමේදී, ප්‍රතිසන්ධානය සඳහා සමාවදීම අත්‍යාවශ්‍ය වේද යන්න සහ යුක්තිය ප්‍රතිසන්ධානය අතර ඇති ආතතිය කුමන අන්දමින් අවසන් වූයේද යනාදිය පිළිබඳව තරුණ කැල විවාද කළහ. මෙහිදී වඩාත්ම වැදගත් වන්නේ සංවාද වැඩසටහනට සහභාගිවූ මෙම වයස අවු. 16-19 අතර තරුණ කැල ප්‍රචණ්ඩත්වයෙන් උරුම කරදෙන දෑ සහ වර්තමානයේ එය ඔවුනට බලපාන අන්දම අවබෝධ කරගැනීමයි. වර්තමානයේ පාසල් තුළ දක්නට ඇති ප්‍රචණ්ඩත්ව සංස්කෘතියට හේතුව වන්නේ අතීතය වෙළාගෙන ඇති ප්‍රචණ්ඩත්වයේ මතකසටහන් බව බොහෝදෙනාගේ මතය විය. අවසානයේදී මෙම විවෘත විවාදය හා සංවාදය සඳහා පහසුකම් සැලසීම තුළින් සක්‍රිය පුරවැසියන් වශයෙන් තමන්ගේ රට යළි ගොඩනැගීම සඳහා තමන් තුළ වන හැකියාව හඳුනාගැනීමට මෙම වැඩසටහන ඉගෙනුම්ලාභීන්ට ඉඩ සලසන ලදී.



*සියෙරා ලියෝන විශේෂ අධිකරණ පරිශ්‍රයේ සිට යුක්තිය, ක්ෂමාව සහ ප්‍රතිසන්ධානය පිළිබඳ දැනුවත් වන ඉගෙනුම්ලාභීන්*

## දිවිගලවාගත්තවුන් පිළිගැනීමට ලක් කිරීම

සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය තුළ බෙහෙවින්ම අභියෝගාත්මක අංගයක් වන්නේ බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ට ලක්ව දිවිගලවාගත්තවුන් පිළිගැනීමට ලක් කිරීම සඳහා වඩාත්ම උචිත ක්‍රමය තීරණය කිරීමයි. වන්දිගෙවීම, ප්‍රතිෂ්ඨාපනය, සංකේතාත්මක වන්දි  වැනි විවිධ ස්වරූපයන්හි වන්දි ගෙවීම් ක්‍රම සහ පුනරුත්ථාපනය වින්දිතයින්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින් ඔවුනට විඳින්නට වූ හානිය පිළිගැනීමට ලක් කර ඔවුන්ව නැවත සමාජය තුළ යථා තත්වයට පත් කිරීමේ ක්‍රම වශයෙන් නිර්දේශ කර තිබේ.පුළුල් වූ වන්දිගෙවීමේ ක්‍රමෝපායක කොටසක් වශයෙන් ස්මාරක, කෞතුකාගාර, අනුස්මරණ දින සහ වෙනත් සදනුස්මරණ ක්‍රියාකාරකම් වැනි සංකේතාත්මක වන්දිගෙවීමේ ක්‍රම මගින් ගැටුමේ වින්දිතයින් පිළිගැනීමට ලක් කිරීම පමණක් නොව සමාජය තුළ පොදුවේ අත්විඳින්නට වූ උල්ලංඝන පිළිගැනීම සහ අනාගත පරම්පරා දැනුවත් කිරීම යන අරමුණුද සාක්ෂාත් කරගත හැක.

[7] http://www.slcgg.org/

- අතීතයේ සිදුවූ අරගලයන්ට සාක්ෂි දරන්නා වූ කෲරකම් සිදුවූ ස්ථාන, විජයග්‍රහණ ස්ථාන හෝ සැමරුම් ස්ථාන තිබේද?
- අතීතය, වර්තමානය සහ අනාගතය පිළිබඳ සංවාද හා විවාද ප්‍රවර්ධනය කරන්නාවූ කාරක බවට මෙම ස්ථාන පත් කරගත හැක්කේ කෙසේද?
- මෙම ස්ථානයන් එකිනෙකට උපකාර කරගත හැක්කේ කෙසේද?

# කොමර්කා බලිද්, නැගෙනහිර ටිමෝරය



*දිලි නුවර කොමර්කා බලිද් සිර කුටිවලට පිටතින් ඇඳ ඇති චිත්‍ර*

1642 දී පෘතුගාලය විසින් යටත්විජිතකරණයට ලක් කළ ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය 1975දී නිදහස ලබාගන්නා ලදී. නිසි පිළිවෙලක් නොමැතිව සහ ශීඝ්‍රයෙන් සිදුකළ යටත්විජිත තත්වය තුරන් කිරීමේ (decolonization) ක්‍රියාවලිය හේතුවෙන් දේශපාලන බලය අත්කරගැනීමෙහි ලා අරගලයක් නිර්මාණය වූ අතර ඉන්දුනීසියාවේ සම්බන්ධවීමත් සමගින් තත්වය වඩාත් උග්‍ර විය.රට අභ්‍යන්තරයේ ඇතිවූ දේශපාලන ප්‍රචණ්ඩත්වය සමගින් 1974 දෙසැම්බර් මාසයේදී ඉන්දුනීසියාව ටිමෝර්-ලෙස්තේ රාජ්‍යයට එරෙහිව පූර්ණ පරිමාණයේ ප්‍රහාරයක් දියත් කරන ලදී. ඉන්දුනීසියාව සඳහන් කළේ එම ක්‍රියාව හේතුවෙන් එරට තුළ සිදුවන්නට ගිය මහා සිවිල් යුද්ධයක් සහ කොමියුනිස්ට්වාදීන් බවක් පෙනෙන පක්ෂයක් තුළ බලය සංකේන්ද්‍රණයවීම වලක්වාගත හැකි වූ බවයි.එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය හමුදාව ආපසු ගෙන්වාගන්න මෙන් ඉන්දුනීසියාවෙන් ඉල්ලා සිටියද ඉන්දුනීසියාව 1975 සිට 1999 දක්වා ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින ලදී (මෙම අල්ලාගැනීම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගැනීමට ලක් නොකරන ලදී). ඉන්දුනීසියානු හමුදාව සහ ටිමෝර සටන්කාමී ව්‍යාපාරය අතර දිගින් දිගටම පැවති ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය බලහත්කාරයෙන් අල්ලාගෙන සිටි මෙම කාලසීමාව මානව හිමිකම් උල්ලංඝන හා මැඩපැවැත්වීම් බහුල කාලයක් විය. එක්සත් ජාතීන්ගේ සංගමයේ සහ ජාත්‍යන්තර මැදිහත්වීම්වලින් අනතුරුව 2002 වර්ෂයේදී ටිමෝර් ලෙස්තේ රාජ්‍ය ස්වෛරී රාජ්‍යයක් බවට පත්විය.

ටිමෝර්-ලෙස්තේ රාජ්‍යයට දීර්ඝ කාලීන සාමය උදාකරලීම සඳහා ප්‍රතිසන්ධාන සහ සත්‍ය සෙවීමේ ක්‍රියාවලියක් වුවමනා කරන බව විවිධ දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජ සංවිධාන විසින් 2000 වර්ෂයේදී එකඟවන ලදී.2002-2005 සමය තුළ ක්‍රියාත්මක වූ එක්සත් ජාතීන්ගේ නැගෙනහිර ටිමෝර සංක්‍රාන්තික පරිපාලන ව්‍යහය (UNTAET) විසින් ලබාදුන් බලවරම් ප්‍රකාරව 2001/10 දරන රෙගුලාසිය මගින් පිළිගැනීම, සත්‍ය හා ප්‍රතිසන්ධානය සඳහා වන ටිමෝර්-ලෙස්තේ කොමිසම (CAVR) ඇති කරන ලදී.මෙම කොමිසමේ ප්‍රධාන ඉලක්කය වූයේ 1974 අප්‍රේල් 25 සහ 1999 ඔක්තෝබර් 25 අතර කාලයේදී සිදුවූ මානව හිමිකම් උල්ලංඝන පිළිබඳ සත්‍ය සොයාගැනීම සහ එතරම් බරපතළ නොවූ අපරාධ සම්බන්ධයෙන් ප්‍රජා ප්‍රතිසන්ධානය ඇති කිරීමයි. මීට අමතරව 2005 වර්ෂයේදී ඉන්දුනීසියාව සහ ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය එක්ව සත්‍ය සහ මිත්‍රත්වය සඳහා වන ද්විපාර්ශවික කොමිසම(CTF) ඇති කරන ලදී.මෙම කොමිසම ඇති කරන ලද්දේ ඉන්දුනීසියානු හමුදාව ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය අත්කරගෙන සිටි සමයේ ඉන්දුනීසියානු හමුදාව සිදු කළ මානව හිමිකම් උල්ලංඝන පිළිබඳවත්, ටිමෝර්-ලෙස්තේ රාජ්‍යයේ නිදහස සඳහා 1999 දී පැවැත්වූ ජනමතවිචාරණය දක්වා කාලය තුළ පැවති ප්‍රචණ්ඩත්වය සහ මානව හිමිකම් උල්ලංඝන පිළිබඳවත් නිසැක සත්‍ය සොයාගැනීමට සහ පාපෝච්චාරණය කර සත්‍ය ප්‍රකාශ කළ පුද්ගලයින්ට පොදු සමාව ලබාදීමටත් වේ.මෙම CAVR *Chega!*වාර්තාවේ සහ CTFවාර්තාවේ ස්මාරක ඉදිකිරීම ඇතුළුව වන්දි ලබාදීම හා සම්බන්ධ විස්තීර්ණ නිර්දේශ ඇතුළත් කර තිබේ.

ටිමෝර්-ලෙස්තේ රාජ්‍යයෙහි අගනුවර වන දිලි නගරයේ පිහිටා ඇති සිරගෙයක් වන කොමර්කා බලිද් පෘතුගීසී පාලන සමය තුළ 1963 දී ඉදිකරන ලද්දකි.ටිමෝර්-ලෙස්තේ රාජ්‍ය ඉන්දුනීසියානු ග්‍රහණයේ පැවති 1999 දී වධකාගාරයක් සහ රැඳවුම් ස්ථානයක් වශයෙන් මෙම බන්ධනාගාරය කුප්‍රකට විය. බොහෝ සාමාන්‍ය නැගෙනහිර ටිමෝරවාසීන්ට කොමර්කා බලිද් යනු භයංකර ස්ථානයක් විය. නිදහස ලැබීමෙන් අනතුරුව 2001දී මෙම ස්ථානය පුනරුත්ථාපනය කරන ලද අතර හිටපු ටිමෝර්-ලෙස්තේ දේශපාලන සිරකරුවන්ගේ සංගමයේ භාරකාරත්වය යටතේ CAVR ලේකම් කාර්යාල පරිශ්‍රය වශයෙන් එය භාවිතයට ගැනීම ආරම්භ විය.ජපන් රජය හා හිටපු දේශපාලන සිරකරුවකුගේ සහය ඇතිව අළුත්වැඩියා හා පුනරුත්ථාපනය කළමෙම බන්ධනාගාරය වර්තමානයේදී Post-CAVRකාර්යාල සහ හිටපු දේශපාලන සිරකරුවන්ගේ සංගමයේ ජීවත්වන මතක ව්‍යාපෘතිය, කාන්තාවන්ගේ ඉතිහාස ව්‍යාපෘතිය, 1991 නොවැම්බර් 12 කමිටුව වැනි අනෙකුත් මානව හිමිකම් සංවිධානවල කාර්යාල පිහිටුවීමට යොදාගෙන තිබේ.2003 පෙබරවාරි 17 පැවති විවෘත කිරීමේ උත්සවයට සහභාගි වූ සනානා ගුස්මාවෝ ජනපතිවරයා ක්‍රෑරත්වයේ සංකේතයක සිට මානව හිමිකම් හා සාමයේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන ස්ථානයක් දක්වා මෙම ස්ථානය පරිවර්තනය වීමේ වැදගත්කම අවධාරණය කළේය: ‘ඔබ දන්නා පරිදි අතීතයේදී මෙම බන්ධනාගාරය දේශපාලන සිරකරුවන් රඳවා තබාගත් ස්ථානයක්. මානව හිමිකම් මධ්‍යස්ථානයක් බවට පත්වීමට එය ඉමහත් පරිවර්තනයකට ලක්ව තිබෙනවා. දැඩි කම්පනයට ලක්වීමේ සිට සිතේ සාමය උදාකරගැනීම දක්වා වන පරිවර්තනයකට පහසුකම් සැලසීමටත් CAVRහි වැඩකටයුතු මගින් අරමුණු කර තිබෙනවා. එමගින් සත්‍ය සොයනවා පමණක් නොව දැඩි කම්පනයට ලක්වීමේ සිට සාමය උදා කරගැනීම දක්වා වන පරිවර්තනය සඳහා පහසුකම් සැලසීමට ද වෑයම් දරනවා.’[8]වර්තමානයේදී මෙම පරිශ්‍රයේ CAVR ලේඛනාගාරය, මානව හිමිකම් ගැටළුව වෙනුවෙන් වෙන්කළ පුස්තකාලයක්, සහ පොදු රැස්වීම් පවත්වන ස්ථානයක් තිබේ. ඊට අමතරව සංරක්ෂණය කළ සිර කුටි හා සිරකරුවන් හා සිර මැදිරි ආරක්ෂකයින් විසින් බිත්තිවල ඇඳි සිතුවම් 65ක් අතීතයට සාක්ෂි දරමින්ද එම උල්ලංඝන නැවත සිදු නොවියයුතු බව සිහිගන්වමින්ද එහි දක්නට ඇත. ක්‍රෑරත්වයේ සිට මානව හිමිකම් හා නිදහස ප්‍රවර්ධනය කරන ඉඩක් බවට පත්ව ඇති මෙම ස්ථානය, එහි රඳවා සිටි සිරකරුවන් පිළිගැනීමට ලක් කිරීම පමණක් නොව නැගෙනහිර ටිමෝරවරුන් ඉන්දුනීසියානු පාලනය යටතේ දිනපතා අත්විඳි බිය, වේදනාව, කෝපය සහ ලජ්ජාව පිළිගැනීමට ලක් කරන ස්ථානයකි.

8

[8]http://www.cavr-timorleste.org/en/comarca.htm




# තෙවන පරිච්ඡේදය

## සදනුස්මරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

**රජය, වින්දිත කණ්ඩායම්, ප්‍රජා කණ්ඩායම්, හිටපු සටන්කාමීන් සහ රාජ්‍ය නොවන සංවිධාන වැනි විවිධ වූ පාර්ශවකරුවන්** විසින් සදනුස්මරණ ව්‍යාපෘති ඇරඹීමට ඉඩ තිබේ. සදනුස්මරණ ව්‍යාපෘතියකට මුලපුරන විට විමසිය යුතු ප්‍රධානතම ප්‍රශ්නයක් වන්නේ: ව්‍යපෘතියේ අරමුණ සහ ඉලක්කය කුමක්ද? යන්නයි. එය ප්‍රතිසන්ධානය සඳහා පහසුකම් සැපයීම ඉලක්ක කරගෙන තිබේද? එමගින් නිශ්චිත වින්දිත කණ්ඩායම් පිළිගැනීමට ලක් කරයිද? එය සිදු කරන්නේ අනාගත පරම්පරාවට දැනුම ලබාදීමටද? මෙම ඉලක්ක එකිනෙක අතිච්ඡාදනය වන ඒවා වියහැකි අතර, ව්‍යාපෘතිය මගින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන්නේ කුමක්දැයි පැහැදිලි දැක්මක් තිබීම ප්‍රයෝජනවත් වනු ඇත.බොහෝ පශ්චාත්-ගැටුම් සමාජයන්හි සදනුස්මරණ ක්‍රියාවලියට මාර්ගෝපදේශකත්වය ලබාදීමට උපකාරී වන නෛතික හෝ දේශපාලනික බලවරමක් පැවතීමට ඉඩ තිබේ. උදහරණ වශයෙන් සත්‍ය කොමිෂන් සභා වාර්තා තුළින් සදනුස්මරණ මුලපිරීම් නිර්දේශ කර තිබෙන්නට පමණක් නොව  එවා තුළින් ඉටුවන අරමුණුද සඳහන් කර තිබෙන්නට ඉඩ තිබේ. සත්‍ය කොමිෂන් ක්‍රියාවලියක් හෝ වාර්තාවක් නොමැති තත්ව යටතේ සදනුස්මරණ මුලපිරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නෛතික මාර්ගෝපදේශ ලබාදෙන්නා වූ ජාතික උරුම හෝ සංචාරක අධිකාරියක් බොහෝ රජයන්හි පැවතීමට ඉඩ තිබේ. මේවාද ව්‍යාපෘතියේ බලවරම නිසි පසුබිමක් සමගින් ගලපන්නා වූ නෛතික මාර්ගෝපදේශයක් වශයෙන් ක්‍රියා කරනු ඇත.

- සදනුස්මරණ ව්‍යාපෘතියේ ඉලක්කය කුමක්ද?
- ඔබ පැවසීමට යන්නේ කුමන කතාන්දරද?
- ව්‍යාපෘතියට සම්බන්ධ වියයුතු ප්‍රධාන පාර්ශවකරුවන් කවුද?
- ව්‍යාපෘතියට සහය ලබාගැනීමට යොදගතහැකි, පවතින සම්පත් කිසිවක් තිබේද?

වැදගත්වන දෙවන ගැටළුව පැන නගින්නේ අවශ්‍යතාවය සම්බන්ධයෙනි- ව්‍යාපෘතියෙන් සපුරාලන්නේ කාගේ, කුමන අවශ්‍යතාවයක්ද? බොහෝ පශ්චාත්-ගැටුම් සමාජයන්හි සදනුස්මරණ ව්‍යාපෘති දියත් කිරීම අත්‍යාවශ්‍ය හා හදිසි වුවමනාවක් බවට පත් කර ඇත්තේ දේශපාලනමය සාධක හේතුවෙනි. ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම්වලට ගරු කිරීම මත පදනම්ව ජාතික අනන්‍යතාවයක් යළි නිර්මාණය කිරීමේ ප්‍රධාන මුලපුරන්නා වශයෙන් නව දේශපාලනික පාලනතන්ත්‍රයක සමාරම්භය සනිටුහන් කිරීමට රජය විසින් සදනුස්මරණ ව්‍යාපෘති භාවිතා කිරීම සමගින් මෙම බලවත් ඕනෑකම යම් මට්ටමකටසම්බන්ධ වී තිබේ. කෙසේනමුත්, තමන්ව ප්‍රමාණවත් මට්ටමකින් නියෝජනය නොවන්නා වූ නිශ්චිත කතා සමගින් සම්බන්ධ ජාතික සදනුස්මරණ ව්‍යාපෘති පමණක් ව්‍යාප්ත වන බවක් ඇතැම් තත්ව යටතේ පාර්ශවකරුවන් තීරණය කිරීමට ඉඩ තිබේ. එවන් තත්වයන්හිදි යම් නිශ්චිත කණ්ඩායමක් පිළිගැනීමට ලක් කෙරෙන, ප්‍රධාන ප්‍රවාහයේ විස්තර කතාවට ප්‍රතිවිරුද්ධ විස්තර කතාවක් ඉදිරිපත් කෙරන, නැතහොත් ජාතික වශයෙන් පවතින විස්තර කථාව ඌණපූරණය කරනා විස්තර කතාවක් සහිත සදනුස්මරණ ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට පාර්ශවකරුවන් විසින් තීරණය කිරීමට ඉඩ තිබේ.මෙහිදී ඒවා එකිනෙකා අතර සන්නිවේදනය කරන්නේ කුමක ආකාරයෙන්ද? කාගේ කුමන කතා කියනු ලබන්නේද? සදනුස්මරණයේ විවාදයට තුඩුදෙන ස්වරූපය සලකා බලන කල, සමාජය යටින් දිවෙන්නා වූ පශ්චාත්-ගැටුම් ආතතිය මෙම මුලපිරීමෙන් තවත් පෝෂණය වේද,

නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමේ ක්‍රියාවලියට දායක වේද? උදාහරණ වශයෙන්, ව්‍යාපෘතිය හරහා ක්ෂමාව, ප්‍රතිසන්ධානය සහ යුක්තිය සම්බන්ධ පිළිතුරුදීම දුෂ්කර ප්‍රශ්න ඇසීමට බලාපොරොත්තු වන්නේ නම් එවන් ප්‍රශ්නවලට පිළිතුරුදීමට සමාජය/ප්‍රජාව සූදානම්ද?

කලින් සඳහන් කළ පරිදි සදනුස්මරණය සාම්ප්‍රදායිකව සම්බන්ධ කර ඇත්තේ ස්ථාවර ස්මාරක සහ සිහිවටන සමගින් වුවත් සදනුස්මරණ ව්‍යාපෘති ස්වරූපයෙන්, ප්‍රමාණයෙන් හා විෂයපථය අනුව විවිධාකාර විය හැකිය. සදනුස්මරණ ව්‍යාපෘති දියත් කරන්නාවූ පාර්ශවකරුවන්ට ප්‍රමාණය, විෂයපථය සහ ස්වරූපය සම්බන්ධ මෙම ප්‍රශ්න ඔවුන් සතු සම්පත් ප්‍රමාණය හා බැඳී පවතියි. පවතින මානව සහ මූල්‍ය සම්පත් කවරේද? බොහෝ පශ්චාත්-ගැටුම් පසුබිම්වල ඉතා ඉක්මනින් සපුරාලියයුතු සංවර්ධන අවශ්‍යතා පවතියි. එසේ වුවද, සදනුස්මරණ මුලපිරීම් සිදුකිරීම සඳහා ද විවිධ පාර්ශවකරුවන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත්වීමට ඉඩ තිබේ.එවන් අවස්ථාවන්හි සදනුස්මරණ මුලපිරීම් සංවර්ධන අවශ්‍යතා සමගින් තරඟවැදීම නුසුදුසුය. වඩාත් පුළුල් පශ්චාත්-ගැටුම් යළි ඉදිකිරීමේ න්‍යායපත්‍රයකට දායක විය හැකි, එකිනෙක අනුපූරණය කරන්නාවූ ව්‍යාපෘති වශයෙන් ඒවා සැලකිය යුතුය. තවද, සම්පත් සීමිත වේනම් ව්‍යාපෘතිය අදියර වශයෙන් කරගෙන යාමේ එළඹුමක් භාවිතා කිරීමට පාර්ශවකරුවන්ට හැකිය.තවද, සෑම සදනුස්මරණ ව්‍යාපෘතියක්ම සංස්කෘතික වශයෙන් හා පසුබිම් වශයෙන් විශේෂිත වියයුතු වන අතර, ස්මාරකයක් හෝ කෞතුකාගාරයක් ඉදිකිරීමට වඩා අඩු සම්පත් ප්‍රමාණයක් වුවමනා කරන, එහෙත් ඒ හා සමාන අවශ්‍යතාවයක් හෝ අරමුණක් සපුරාලන්නා වූ වෙනත් ආකාරයක සදනුස්මරණ වැඩසටහනක් සඳහා අදහස් සංස්කෘතික පසුබිම තුළින්ම පැන නැගීමට ඉඩ තිබේ.

මූල්‍ය සම්පත්වලට අමතරව ව්‍යාපෘතියට සම්පත් දායකයින් බවට පත්විය හැකි පුද්ගලයින් හඳුනාගන්නට ද මුලපුරන්නන්ට වුවමනා විය හැකිය. ව්‍යාපෘතිය සඳහා යොදාගැනීමට පවතින කුසලතා සංචිතය කුමක්ද? ප්‍රයෝජනවත් ඓතිහාසික තොරතුරු හා පර්යේෂණ සඳහා ප්‍රයෝජනවත් සාක්ෂි ලබාදීමට ප්‍රජාවේ සාමාජිකයින්ට හැකිවීමට ඉඩ ඇති අතර ව්‍යාපෘතියේ සැලසුම, අරමුදල් සපයාගැනීම හෝ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය සඳහා උපකාර කළහැකි පුද්ගලයින් සිටිනවා වන්නට පුළුවන.බොහෝ පශ්චාත්-ගැටුම් පසුබිම් තුළ වහා ඉටුකිරීමට අවශ්‍ය සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අවශ්‍යතා සලකා බලන කල එම පශ්චාත්-ගැටුම් යළිගොඩනැංවීමේ කටයුතු සඳහා සහය ලබාදීමට මූල්‍යාධාර මෙන්ම මානව සම්පත් ලබාදීමට සූදානමින් පසුවන ජාත්‍යන්තර සංවිධාන සංචිතයක් බොහෝවිට තිබේ.'දේශීය' ගැටළුවක් වශයෙන් සලකනු ලබන කාරණයක් සම්බන්ධයෙන් පුළුල් මහජන අවධානයක් දිනාගැනීමටත්, ක්‍රියාවලියට නීත්‍යානුකූලබවක් ලබාදීමටත්, අවස්ථා හා අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා එළඹුම් පරාසයක් ලබාදීමටත් එවන් ජාත්‍යන්තර සංවිධානවලට හැකිවීම බොහෝවිට ප්‍රයෝජනවත් වුවත් මෙම ක්‍රියාවලියට දේශීය හිමිකාරත්වයක් පැවතීම ද ඒ හා සමානවම වැදගත් වේ.ව්‍යාපෘතියේ සෑම අදියරක් මුළුල්ලේම පුළුල් දේශිය සහභාගීත්වය මගින් දේශීය අවශ්‍යතා ප්‍රමාණවත් අන්දමින් නියෝජනය වන බව සහතික කරගැනීමට, තමන්ව නිසි අයුරින් නියෝජනය වන බවක් සෑම පාර්ශවකරුවකුටම හැඟීමට සහ වඩාත්ම වැදගත් කාරණය වන ව්‍යාපෘතිය තුළ අඛණ්ඩව දේශීය සම්බන්ධවීම් පවතින බව සහතික කරගැනීමට උපකාරී වේ.

## බංග්ලාදේශයේ විමුක්ති යුධ කෞතුකාගාරය




*යුද්ධ භූමි ස්මාරකයේ ඇති 'මෙහි සිදුවූයේ කුමක්ද?' යනුවෙන් විමසන ඵලකයක්*

බංග්ලාදේශයේ මිලිටරි ජුන්ටාව ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීම ප්‍රතික්ෂේපකිරීමත් සමගින් ඇරඹී මාස නවයක් මුළුල්ලේ පැවති බිහිසුණු යුද්ධයකින් අනතුරුව ස්වාධීන රාජ්‍යයක් වශයෙන් බංග්ලාදේශය ස්ථාපිත වූයේ 1971 දෙසැම්බර් මාසයේදීය. ජාතික සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබාගැනීමට බෙන්ගාලි ජනතාව ගෙනගිය අරගලය සම්බන්ධයෙන් 'අවසන් විසඳුමක්' ලබාදීමට තීරණය කළ බටහිර පකිස්ථානු පාලකයෝ නැගෙනහිර පකිස්ථානු ජනතාව සමූලඝාතනය සඳහා ප්‍රහාරයක් දියත් කළහ. පුද්ගලයින් මිලියන තුනක් මියයාම, පුද්ගලයින් මිලියන 10ක් තම නිවාස අතහැර දමා ඉන්දියාවේ සරණ පතා යාම සහ කාන්තාවන් 200,000ක් ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වීම ඇතුළුව මෙම ජයග්‍රහණය වෙනුවෙන් එරටට ගෙවන්නට වූ මිල බොහෝ අධිකය. යුද්ධයෙන් වැනසුනු බංග්ලාදේශය යළි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළත් නොබෝ කලක් යන්නට මත්තෙන් තවත් ආපදාවකට මුහුණ දෙන්නට එරටට සිදුවිය. ජාතියේ පියා සහ ජනරජයේ ජනාධිපතිවරයා වූ ෂේක් මුජිබර් රහ්මාන් හමුදා කුමන්ත්‍රණයක් හරහා ඝාතනයට දැරූ තැතක් හරහා ඝාතනය කෙරුණු අතර, ඉන් අනතුරුව දීර්ඝ කාලයක් යනතුරු මිලිටරිවාදී ඒකාධිපති පාලනයක් පැවතිණි. පාලක මිත්‍ර සංසදය සමගින් එක්වූ ආගමික මූලධර්මවාදී බලකා පාලනාධිකාරයේ කොටස්කරුවන් වූහ. එසමය බංග්ලාදේශයේ ඉතිහාසය ප්‍රතික්ෂේප කළ හා විකෘති කිරීමට ලක් කළාවූත් ආගමකට සම්බන්ධ නොවන, ප්‍රජාතන්ත්‍රවාදී, නිදහස් මතධාරී පරමාදර්ශ පිළිගත් විමුක්ති අරගලයේ මූලික අගයන් පාගාදැමූවාවූත් සමයක් විය.

මෙම පසුබිම යටතේ 1996 වසරේ පැවති 25වන නිදහස් සංවත්සර දිනයේදී සාමජිකයින් අටදෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබුවේ කලා නිර්මාණ, ඡායාරූප, ලේඛන යනාදිය ප්‍රදර්ශනය කරන්නාවූ එකතුවක් භාවිතා කරමින් ජනතා අරගලය නිරූපණය කරන්නා වූ කෞතුකාගාරයක් නිර්මානය කිරීමටයි.කෞතුකාගාරය වශයෙන් භාවිතා කිරීම සඳහා නගර මධ්‍යයේ පිහිටා තිබූ යටත්විජිත ගෘහනිර්මාණ ශිල්පය සහිත ගොඩනැගිල්ලක් කුලියට ගෙන අළුත්වැඩියා කරන ලදී. කෙසේනමුත්, කෞතුකාගාරය ඇතිකරන බවට වන පොරොන්දුවක් පමණක් මත පදනම් වෙමින් වසර 25කට අධික කාලයක් මුළුල්ලේ සුරක්ෂිතව තබාගත් වටිනා කලාකෘති පරිත්‍යාග කරන්නට ප්‍රජාව උනන්දු කරගැනීම මෙහිදී මුහුණ දුන් ප්‍රධාන අභියෝගය විය.ආරම්භයේ සිටම මෙම කෞතුකාගාරය සඳහා ඉමහත් මහජන සහයෝගයක් ලැබිණි.ප්‍රජාවේ සහභාගීත්වයත් සමගින් ලැබුණු විවිධාකාර හා අගනා ලිපිලේඛන මෙන්ම කලාකෘති හේතුවෙන් අරගලයේ කථාව මනාසේ කීම අපහසු නොවීය.

එම සහයෝගයත් සමගින් විමුක්ති යුධ කෞතුකාගාරය ජනතාවගේ කෞතුකාගාරයක් වූ අතර ප්‍රජාව සමගින් සම්බන්ධවීම සඳහා තවතවත් ඉඩකඩ පුළුල් කර දෙන්නට එමගින් හැකිවිය. කතාව ලිඛිත ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට මෙම කෞතුකාගාරය හරහා වෑයම් කර තිබේ.1971 දෙසැම්බර් 16 ලබාගත් ජයග්‍රහණය සමගින් ඓතිහාසික කතාව අවසන් වන අතර, නිදහසින් පසු සංවර්ධනය යන මාතෘකාව සදනුස්මරණ ක්‍රියාවලියේ විෂයපථයෙන් පරිබාහිර විය.තවද, යම්කිසි එක් දෘෂ්ටිකෝණයක් කෞතුකාගාරය නරඹන්නා මත පැටවීම වෙනුවට, ඉතිහාසය පිළිබඳ තමන්ගේම දෘෂ්ටිකෝණයකින් අවබෝධ කරගැනීමට නරඹන්නාට ඉඩ සලසන අන්දමින් ප්‍රදර්ශනභාණ්ඩ ඉදිරිපත් කර තිබේ.



*ඪකා නගරයට පිටතින් වන පාසලකදී විමුක්ති යුධ කෞතුකාගාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය*

එසේම, විමුක්ති යුද්ධයේ මූලික අගයන් වූ ආගමකට සම්බන්ධ නොවූ ප්‍රජාතන්තවාදී පරමාදර්ශ මෙම ඓතිහාසික සිදුවීම් සියල්ල එකට බැඳ තබන රැහැන විය.මෙම එළඹුමත් සමගින් දේශපාලන බෙදීම් අභිබවාලමින් ප්‍රජාවන් සියල්ල ආමන්ත්‍රණය කර ඔවුන්ගේ විශ්වාසය දිනාගැනීමට කෞතුකාගාරයට හැකිව තිබේ. මෙය,ප්‍රජාව සක්‍රිය භූමිකා නිරූපණය කරන තවත් වැඩසටහන් නිර්මාණය කරන්නට කෞතුකාගාරය පොළඹවා තිබේ.

බංග්ලාදේශයේ අත්දැකීම පුළුල් ලෝකය තුළ අත්විඳ ඇති ජනසංහාර සහ කෲරත්වයේ අත්දැකීම් සමගින් සම්බන්ධ වන්නේ කෙසේදැයි ආවර්ජනය කරමින් ඉතිහාසය වෙළාගත් ඒ කෲරකම් දැකබලාගැනීමට නරඹන්නන්ට ඉඩ ප්‍රස්ථා ලබාදෙන අන්දමේ ගෘහනිර්මාණ ශිල්ප සැලසුමක් සහිත ස්මාරක පරිශ්‍රයක් ඪකා නුවර ආසන්නයට වන්නට පිහිටා ඇති ඝාතන ස්ථානයක ඉදිකිරීමට 2007 දී මෙම කෞතුකාගාරය විසින් කටයුතු කරන ලදී.ත්‍රිකෝණ හැඩයක් ගන්නා මෙම හරිත කලාපය, එය ඔස්සේ ගමන් කරන නරඹන්නන් සමග සංවාදයක් අරඹයි. රට මුළුල්ලේ ව්‍යාප්තව පැවති, 500කට අධික වූ ඝාතන ස්ථාන ලයිස්තුව ශ්වේත වර්ණ ගල් වැනි ස්මාරකයක සටහන් කර තිබේ. තාප්පයෙහි ඇති කළුගල් මතුපිට ලෝක ඉතිහාසයේ ප්‍රධාන ජනසංහාර පිළිබඳ සඳහන් කරමින් මෙම ස්ථානය අනෙකුත් ජාතික ස්මාරක මෙන්ම සමස්ථ ලෝකයේම අත්දැකීම සමගින් සම්බන්ධ කරයි.ඉන් අනතුරුව නරඹන්නන් අතහැර දැමූ පොම්පාගාරය සහ ගැඹුරු ආවාටය සහිත කාමරයට ඇතුළු වේ. පුද්ගලයින් මරාදැමුණු ස්ථානය වූයේ මෙයයි. එහි දොරකඩ 'මෙහි සිදුවූයේ කුමක්ද?' යන ප්‍රශ්නය භාෂා හයකින් ලියා තිබේ. සිතා බැලීමට, ආවර්ජනයට හා ප්‍රශ්න කිරීමට නරඹන්නාට ඉඩකඩ සලසා දෙමින් කාමරයේ ඇතුළත ඉතා සරළව අඩු ප්‍රදර්ශනභාණ්ඩ සහිතව සකසා තිබේ.

සිදුවේ. දිවිගලවාගත්තවුන් තම සිතට සැනසීම මෙන්ම පිළිගැනීම ලබාගැනීමට පැමිණෙන ප්‍රධානතම ස්ථානයක් බවට මෙය පත්ව තිබේ. ප්‍රජාව සහ පාර්ශවකරුවන් සමගින් අඛණ්ඩව සිදුවෙන සම්බන්ධවීම හරහා මෙම ස්ථානය සමගින් දැඩි බැඳීමක් හා මෙම ස්ථානය පිළිබඳ හිමිකාරත්වයේ හැඟීමක් වින්දිත කණ්ඩායම් සහ ප්‍රදේශයේ ජනප්‍රජාව විසින් ඇති කරගෙන තිබේ.ඒ අනුව මෙම ස්ථානය මේ වනවිට විවිධ ප්‍රජා ක්‍රියාකාරකම්වල කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබේ. වින්දිතයින්ගේ තෙවන පරම්පරාවේ ළමුන් එක්ව 'ඝාතන ස්ථානයේ ළමුන්' යන නමින් ගායනා කණ්ඩායමක් සාදගෙන තිබේ. සෑම සෙනසුරාදවකම වින්දිතයින්ගේ පවුල්වලින් පැමිණෙන එක් සාමාජිකයකු මෙම ස්ථානය නැරඹීමට පැමිණෙන කුඩා පාසල් ලමුන්ට තමන්ගේ පෞද්ගලික අත්දැකීම් විස්තර කරනු ලබයි.කලක් භීෂණය පැතිරවූ ස්ථානයක් වූ මෙය අද වනවිට ස්මාරක ස්ථානයක් හා ප්‍රජාවේ හදවත බවට පත්ව තිබේ. සමාජයේ අභ්‍යන්තර ශක්තිය සදනුස්මරණය ඉදිරියට ගෙනයන්නා වූ ධාවක බලවේගය වන්නේ කෙසේද යන්න ප්‍රජාව මගින් ලබාදුන් මානව දයකත්වයත් සමගින් මෙම ස්ථානය හරහා මනාව පෙන්නුම් කරයි.

විමුක්ති යුධ කෞතුකාගාරයේ තවත් ප්‍රධානතම වැඩසටහනක් වන්නේ ශිෂ්‍යයින් කෞතුකාගාරය වෙත ගෙන ඒම හා කෞතුකාගාරය ශිෂ්‍යයින් කරා ගෙනයාමේ වැඩසටහනයි. කුඩා කෞතුකාගාරයක් බවට පරිවර්තනය කළ විශාල පරිමාණයේ භාණ්ඩ ප්‍රවාහන රථයක් ඔවුන් සතු වන අතර රටේ දුරබැහැර ප්‍රදේශවල අධ්‍යාපන ආයතන කරා ළඟාවන්නට ඔවුහු එය භාවිතා කරති.

ඉතිහාසය පිළිබඳ දැනගැනීමේ අත්දැකීම විඳීමත් සමගින් අළුත් පරම්පරාව තුළ ඇතිවන උද්යෝගය දුටු විමුක්ති යුධ කෞතුකාගාරය  මෙය තවත් සඵලදායි අන්දමින් භාවිතා කරන්නට සැලසුම් කර තිබේ. වාචික ඉතිහාස ව්‍යාපෘතිය නිර්මාණය කර ඇත්තේ අත්දැකීම් පදනම් කරගනිමිනි.කුඩා කෞතුකාගාරය දැකබලාගෙන කුඩා වාර්තාමය චිත්‍රපටයක් නරඹා, ප්‍රදර්ශනය කර ඇති මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය ද දැකබලාගෙන සාමය සහ ඉවසීම පිළිබඳ ගැටළු සාකච්ඡා කරන්නට සිසුන්ට ආරාධනා කරනු ලැබේ.1971 නිදහස් අරගලය ඔවුන් දෑසින් නොදැක්කත් එම ඉතිහාසයට සාක්ෂි දරන වැඩිහිටියෝ මෙම සිසුන්ගේ පවුල්වල සිටිති. එම පරම්පරාවේ, අරගලය අත්විඳි එක් පුද්ගලයකු තෝරාගෙන විමුක්ති යුද්ධය පිළිබඳ එම පුද්ගලයාගේ අත්දැකීම්වලට සවන්දී එම කතා ලියාගැනීමට සිසුන් දිරිගන්වනු ලැබේ.හැකිතාක් අව්‍යාජ අන්දමින් මෙම කත ලිවීමට ළමුන් උනන්දු කරවනු ලැබේ.

සරළ හා පහසුවෙන් කළහැකි අන්දමින් සකස් කර ඇති මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් තමන් ලියන කතාව විමුක්ති යුධ කෞතුකාගාරය සමගින් සම්බන්ධීකරණයකිරීමට ඉදිරිපත් වී ඇති ජාලයේ ගුරුවරයා වෙත ඉදිරිපත් කළයුතුය. එම ගුරුවරයා කතා එකතු කර ඒවා කෞතුකාගාරය වෙත යවනු ඇත. එම ලේඛන ලැබුණු විට කෞතුකාගාරය එම එක් එක් සිසුවාට ස්තූති කර පෞද්ගලිකව ලිපි යවනු ලැබේ. ඔවුන් එවන සෑම ලේඛනයක්ම නොපමාව සංරක්ෂණය කර ඒවායින් සමන්විත ලේඛනාගාරයක් ඇතිකරන බවත් ඔහුගේ/ ඇයගේ ජීවිතයේ පසු කලක පවා එම ලේඛන කරා ප්‍රවේශවීමට හැකිවනු ඇති බවටත් කෞතුකාගාරය සිසුන්ට පොරොන්දුවී තිබේ.තවද, ලේඛන එවන ලද සිසුන්ගේ නම්, සම්මුඛ සාකච්ඡාවට ලක්වූ පුද්ගලයාගේ නම යනාදිය ඇතුළත් ලේඛනයක් කෞතුකාගාරය විසින් තෙමසකට වරක් ප්‍රකාශයට පත් කරන අතර එය අදාළ ආයතන වෙත යවනු ලැබේ. මනාව බඳින ලද ග්‍රන්ථ වශයෙන් සකස් කළ මෙම ලේඛන එකතු කෞතුකාගාරයේ තබා ඇත.තමන්ගේ පාසලින් සහ අවට ප්‍රජාවෙන් ලැබුණු අනෙකුත් කතා කියවා බැලීමට සිසුන්ට අවස්ථාව සලසමින් මෙම එකතුව අදළ පාසල් වෙතද යවනු ලැබේ.

කෞතුකාගාරය විසින් සිදුකළ සරළ ඉල්ලීමකට සිසුන් දැක්වූ ප්‍රතිචාරය තුළින් ඓතිහාසික කතා වස්තු සම්භාරයක් කෞතුකාගාරයට ලබාදීමට මෙම ළමා පරම්පරාව කටයුතු කර තිබේ. මේවනවිට ඇසින් දුටුවන් විසින් ලබාදුන් විස්තර ලේඛන 18,000ක් පමණ කෞතුකාගාරයට ලැබී ඇති අතර මෙම සම්පත විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමට එය අදහස් කරගෙන සිටියි. 'මතකයේ ලේඛනාගාරය' වශයෙන් හඳුන්වන මෙම එකතුව සැබෑම වස්තුවක් වේ. එය නිල ඓතිහාසික ලේඛනාගාරයක් නොවුවත් නිදහස් අරගලයේ විවිධ තල පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබාදීමේ හැකියාව එය සතුය.මෙම ව්‍යාපෘතියේ පරිමාණය හා විෂයපථය හේතුවෙන් මෙන්ම ඇසින් දුටුවන් සිය දහස් ගණනක් කරා ළඟාවීමට හැකිවීම හේතුවෙන් සාමාන්‍ය හා බොහෝවිට ආන්තීකරණයට ලක්වන පුද්ගලයින්ගේ අත්දැකීම් අවධානයට ගෙන ඒමට

හැකිව තිබේ. තවද අන්තර් පුද්ගල සබඳතා ඇසුරින් ගත්කළ මෙම සම්මුඛ සාකච්ඡාව හේතුවෙන් සම්මුඛ සාකච්ඡාව සිදුකරන්නා හා ඊට මුහුණදෙන තැනැත්තා අතර අපූර්ව මොහොතක් ගොඩනැගේ. එමගින් පරම්පරා දෙකකට අයත් දෙදෙනෙකු ඉතා සමීප කරවයි.අධ්‍යාපනික අත්දැකීමක් වශයෙන්, ඉතිහාසය යනු පෙළපොතේ ඇතුළත්ව ඇති කරුණු පමණක්ම නොවන බවත් ඉතිහාසය යනු සෑමවිටම අප අවට පවතින, සජීවී යමක් වන බවත් ඒ බව සොයාගැනීම සඳහා වුවමනා වන්නේ තමන් විසින්ම ඉතිහාසය සොයා වාම පමණක් බවත් අවබෝධ කරගැනීමට එමගින් සිසුවාට ඉඩ සලසයි.

විමුක්ති යුධ කෞතුකාගාරය විසින් ඉතිහාසය නව පරම්පරාව වෙත ගෙනගොස් ඇති අතර ඉතිහාසයෙන් ඉගෙනගැනීමට ඔවුන් තුළ ඇති උනන්දුව සමගින් කෞතුකාගාරයේ ඉතිහාස එකතුව සුපෝෂණය කරදීමට ඔවුන් සමත්ව ඇත.මෙම සාමුහික හා සහයෝගී වෑයම තුලින් සෑම කෞතුකගාරයක්ම නිර්මාණශීලීව විසඳගැනීමට වෑයම් කරන අභියෝගයක් වන සදනුස්මරණය ක්‍රියාවලියේ නව මාවතක් විවර කර ඇත.




# සිවුවන පරිච්ඡේදය

## අදහස් ලබාගැනීම

# සදනුස්මරණයේ සාර්ථකත්වය

බොහෝ සෙයින් රඳ පවතින්නේ එම ව්‍යාපෘතිය සකස් කරගැනීමෙහිලා සිදු කරනු ලබන ක්‍රියාවලි මතය. ක්‍රියාවලියට ඇතුළත්වන්නේ කවුරුන්ද, ඔවුන් ඇතුළත් කරගන්නේ කෙසේද සහ ඔවුන් ඇතුළත් කරගනු ලබන්නේ ක්‍රියාවලියේ කවර අදියරයන්හිදී ද යන ප්‍රශ්න සලකාබැලිය යුතු වැදගත්ම කාරණා වේ.සදනුස්මරණ ක්‍රියාවලියකට මුලපුරන්නන් විසින් ගැනීමට සුදුසු ප්‍රථම පියවර අතරින් එකක් වන්නේ අදහස් ලබාගැනීමයි. ව්‍යාපෘතියක් සාර්ථකව සම්පූර්ණ කිරීමට ඇති හැකියාව ඇගයුම් කිරීම, ව්‍යාපෘතිය පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම (ව්‍යාපෘතියකට මුලපිරීමේ තීරණයට ඒ වනවිටත් ගෙන අවසන් නම්), ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අවබෝධ කරගැනීම සහ ව්‍යාපෘතියට පුළුල් හිමිකාරත්වයක් හා පිළිගැනීමක් ඇතිකිරීම යන අරමුණු ඇතිව විවිධ පාර්ශවකරුවන් පරාසයක් ඒකරාශී කරගැනීමට අදහස් ලබාගැනීමේ ක්‍රියාවලිය තුළින් වෑයම් දරයි.බොහෝ අවස්ථාවන්හි මෙසේ අදහස් ලබාගැනීමේ ක්‍රියාවලීන් සිදු කිරීමට නියම කරගන්නේ ව්‍යාපෘතියම මූලික සහ අරම්භක අවධියේ වුවත් තොරතුරු බෙදාහදාගැනීම සහ සම්බන්ධවීම අඛණ්ඩව සිදුවන බව සහතික කරගැනීම සඳහා ව්‍යාපෘතියේ සෑම අදියරක් මුළුල්ලේම එසේ කිරීම වඩාත් සුදුසුය.

- අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියේ පරිමාණය සහ විෂයපථය කුමක්ද?
- පර්ශවකරුවන්ට ලබාදෙන විකල්පවල පරාමිතීන් කවරේද?
- අපේක්ෂා කළමනාකරණය කරන්නේ කෙසේද?
- අදහස් ලබාගත යුතු ප්‍රධාන පාර්ශවකරුවන් කවුරුන්ද?

බොහෝ අදහස් ලබාගැනීමේ ක්‍රියාවලි ව්‍යාපෘතිය පිළිබඳව පාර්ශවයන් දැනුවත් කිරීම්වලට පමණක් සීමාවන අතර එම ක්‍රියාවලිය සැබැවින්ම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සහ ව්‍යාපෘතිය පිළිබඳ ඔවුන්ගේ අදහස දැනගැනීමට හා විමසා සිටීමට සිදුකරන ක්‍රියාවලියක් විය යුතුය.එමනිසා, ව්‍යාපෘතියේ රාමුව අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියක් හරහා ඇතිකරගෙන, අමතර අදහස් ලබාගැනීම සඳහා පාර්ශවකරුවන්ට ඉදිරිපත් කරන බව ව්‍යාපෘතියට මුලපුරන්නන් විසින් සහතික කරගත යුතුය.එවිට, නිසි දැනුවත්භාවයකින් යුක්තව ව්‍යාපෘතිය පිළිබඳ තේරීම් සිදුකිරීමට පාර්ශවකරුවන්ට හැකිවනු ඇති අතර ව්‍යාපෘතියේ අපේක්ෂා නිසි පරිදි කළමනාකරණය කිරීමට එහි මුලපුරන්නන්ට හැකිවනු ඇත.

විශේෂයෙන්ම මැඩ පැවැත්වීම් හා නිහඬකරවීම් සහිත ඉතිහාසයක් ඇති සමාජයන්ද ඇතුළුව බොහෝ පශ්චාත්-ගැටුම් සමාජ තුළ සිදු කෙරෙන අදහස් ලබාගැනීමේ ක්‍රියාවලි තුළින් ඔවුන්ගේ අදහස් වැදගත් වන බවත් ඔවුන්ගේ හඬට සවන්දෙන බවත් බහුවිධ පාර්ශවකරුවන්ට හැඟෙනු ඇත.එමගින් සංවාද සහ සාකච්ඡා සඳහා ඉඩ සැලසෙන අතර තමන් සියළුදෙනා එක් පොදු අරමුණක් සාක්ෂාත් කරගැනීමට වැඩකරන බවක් පාර්ශවකරුවන්ට හැඟීම තුළින් විශ්වාසය හා ප්‍රජාව පිළිබඳ හැඟීම යළි ගොඩනැංවීමේ ක්‍රියාවලියට එය දායක වනු ඇත.දීර්ඝ කාලීන තිරසාරත්වය සහ අඛණ්ඩ ප්‍රජා සම්බන්ධතාවය සහතික කරගැනීමට වුවමනා වන, ව්‍යාපෘතියේ පුළුල් හිමිකාරත්වය පිළිබඳ හැඟීම ඇතිවීමටද එමගින් දිරි දෙයි.

අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට පෙර පාර්ශවකරුවන්ගේ ලයිස්තුවක් සකසාගැනීමට මුලපුරන්නන් විසින් කටයුතු කිරීම වඩාත් සුදුසුය. අදහස් ලබාගත යුතු, වඩාත්ම වැදගත් පාර්ශවකරුවන් කවුරුන්ද? උදාහරණ වශයෙන් ප්‍රජා සදනුස්මරණ ව්‍යාපෘතියකදී ප්‍රජාවේ සාමාජිකයින්ගෙන්, පළාත්පාලන ආයතන නිලධාරීන්ගෙන්, ප්‍රදේශයේ ව්‍යාපාරවලින් සහ අවට පාසල්වලින් අදහස් ලබාගැනීම වුවමනා විය හැක.

ජාතික මට්ටමේ ව්‍යාපෘතියකදී, විශේෂයෙන්ම රජයේ මූලිකත්වයෙන් කෙරෙන ව්‍යාපෘතියකදී ජාතික ප්‍රතිසන්ධානය සහ යළි ගොඩනැංවීමේ ක්‍රියාවලියට දායකත්වය ලබාදීමේ පුළුල් අභිමතාර්ථය අදහස් ලබාගැනීම තුළින් සාක්ෂාත් වනු ඇත. නිසි ලෙස හා අඛණ්ඩව සිදුකෙරෙන අදහස් ලබාගැනීම කෙරෙහි කැපවීම තුළින් පුරවැසියන් වෙත ගෙන යන පණිවුඩය වන්නේ නව රජය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් සහ සියළු පුරවැසියන්ගේ හඬ අගය කරන බවයි.

ජාතික මට්ටමේ ව්‍යාපෘතියකදී, විශේෂයෙන්ම රජයේ මූලිකත්වයෙන් කෙරෙන ව්‍යාපෘතියකදී ජාතික ප්‍රතිසන්ධානය සහ යළි ගොඩනැංවීමේ ක්‍රියාවලියට දායකත්වය ලබාදීමේ පුළුල් අභිමතාර්ථය අදහස් ලබාගැනීම තුළින් සාක්ෂාත් වනු ඇත. නිසි ලෙස හා අඛණ්ඩව සිදුකෙරෙන අදහස් ලබාගැනීම කෙරෙහි කැපවීම තුළින් පුරවැසියන් වෙත ගෙන යන පණිවුඩය වන්නේ නව රජය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් සහ සියළු පුරවැසියන්ගේ හඬ අගය කරන බවයි.ජාතික මට්ටමේ ව්‍යාපෘතීන්හි විශාලත්වය සලකා බලා මෙම අදහස් ලබාගැනීම් විවිධ ස්වරූපයෙන් සිදු කළ හැක. මුලපිරීම සිදුවන ප්‍රාන්තය හෝ දිස්ත්‍රික්කය තුළ වඩාත් පුළුල් හා සියළුදෙනාම ඇතුළත් කරගන්නා ක්‍රියාවලියක් දියත් කර, නගර ශාලා රැස්වීම් හෝ ගම් මට්ටමින් රැස්වීම් පැවැත්වීම හරහා අනෙකුත් දිස්ත්‍රික්කවල වඩාත් සීමිත අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියක් දියත් කළ හැකිය.

තවද, වඩාත් විශාල ව්‍යාපෘති සම්බන්ධයෙන් ජාතික හිමිකාරත්ව හැඟීමක් ඇති කිරීම සඳහා එම ස්ථානය හා බැඳුණු නිර්මාණශීලී ව්‍යාපෘති දියත්කර පුරවැසියන් ඊට සම්බන්ධ කරගැනීමට ව්‍යාපෘතියේ මුලපුරන්නන්ට හැකිය.සියේරා ලියෝන විශේෂ අධිකරණය සම්බන්ධ කාරණයේදී සාම කෞතුකාගාර කළමනාකරණ කණ්ඩායම සිදු කළේ ස්මාරක උද්‍යානය සැලසුම්කරණය සඳහා ජාතික මට්ටමේ තරඟයක් පවත්වා එම ස්ථානයේ සංකල්පීය සැලසුම සම්පාදනයට සහභාගිවීමේ අවස්ථාව සියෙරා ලියෝනවරුන්ට ලබාදීමයි.දේශීය හා ජාත්‍යන්තර කලාකරුවන්ගෙන් සැලසුම් විසි අටක් ලැබුණු අතර අවසන් සැලසුමට ඒකාබද්ධ කිරීම සඳහා ජයග්‍රාහී සැලසුම් හතරක් තෝරාගන්නා ලදී. දකුණු අප්‍රිකාවේ කන්ස්ටිටුෂන් හිල් (Constitution Hill) වැඩසටහනට මුලපිරූ පුද්ගලයෝ 'We the People' (මිනිසුන් වන අපි) නමින් ව්‍යාපෘතියක් දියත් කළහ. මෙම ව්‍යාපාරය 'මිනිසුන් කන්ද වෙත ගෙන ඒම' (*Bringing the People to the Hill)* සහ 'කන්ද මිනිසුන් වෙත ගෙනයාම' (*Taking the Hill to the People)* යන ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත විය. 'කන්ද මිනිසුන් වෙත ගෙනයාම' යටතේ, අවට ප්‍රදේශවාසීන්ට එම ස්ථානය පිළිබඳ ඇති මතකය, එය කුමන ආකාරයකින් සංවර්ධනය කළයුතුද යන්න පිළිබඳ ඔවුනට ඇති දැක්ම සහ ඒ ප්‍රදේශයේ ජනප්‍රජාවේ ඇතැම් අවශ්‍යතා සපුරාගැනීමට මෙම ස්ථානය තුළින් සහය ලබාදිය හැකි ආකාරය පිළිබඳ අදහස් හා ප්‍රතිපෝෂණය ලබාගැනීමට උරුම, අධ්‍යාපන සහ සංස්කෘතික (HET) කණ්ඩායම විසින් කටයුතු කරන ලදී. 'මිනිසුන් කන්ද වෙත ගෙනයාම' යටතේ දකුණු අප්‍රිකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව විවිධාකාරයේ දකුණු අප්‍රිකානුවන්ගෙන් අදහස් විමසීම සඳහා එරට මුළුල්ලේ සංචාරය කරන්නට HET කණ්ඩායම කටයුතු කළහ. 'මිනිසුන් වන අපි' We the People වැඩසටහනට ලැබුණු ප්‍රතිචාර එම ස්ථානයේ ඇතිකළ ප්‍රදර්ශනයකට ඇතුළත් කරන ලදී. HET කණ්ඩායම එරට මුළුල්ලේ ව්‍යාප්තව ඇති කාන්තා සංවිධාන අතර හුවමාරු කෙරුනු උණුසුම් ඇතිරිලි මැසීමේ ව්‍යාපෘතියක් ද දියත් කරන ලදී. එමගින් අපේක්ෂා කරන ලද්දේ ව්‍යාපෘතිය පිළිබඳව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර දෙන අයිතිවාසිකම් පිළිබඳව ග්‍රාමීය ප්‍රජාවට පුළුල් අවබෝධයක් ලබාදීම ය.

## දකුණු අප්‍රිකාවේ කන්ස්ටිටුෂන් හිල් (Constitution Hill)

වාර්ගික බෙදීම් සහ සුදු ජාතිකයින්ට වරප්‍රසාද ලබාදීම මත පදනම්ව වර්ණභේදවාදයසම්බන්ධයෙන් කුප්‍රකට වූ දකුණු අප්‍රිකාව 1960 ගණන්වල සිටම ජාත්‍යන්තර ප්‍රජාව තුළ පිටස්තරයකු විය. දකුණු අප්‍රිකාව 1994 දී ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පත්වූ අතර නෙල්සන් මැන්ඩෙලා එරට ප්‍රථම කළු ජාතික ජනාධිපතිවරයා විය. අතීතය ක්‍රමක්‍රමයෙන් පිළිගැනීමට ලක් කිරීමේදී වඩාත් යුක්තිසහගත හා සාධාරණ සමාජයක් බිහිකිරීම අරමුණු කරගෙන විවිධ ප්‍රතිසංස්කරණ සිදුකිරීමට දකුණු අප්‍රිකාව විසින් කටයුතු කරන ලදී.අතීතය පිළිබඳ නිවැරදි වාර්තාසටහන් ඇතිකර වරක් බෙදී සිටි ජාතිය යළි ගොඩනැංවීමට කටයුතු කිරීම ඉලක්ක කරගනිමින් 1995 දී දකුණු අප්‍රිකානු සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම ඇති කරන ලදී. මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නව රජයේ කැපවීමසහ වර්ණභේදවාදයෙන් බිඳීයාම 1996 යළි ලියන ලද දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කර තිබේ.

එරට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ධනය කිරීමේ හා එය බලපැවැත්වෙන බව සහතික කිරීමේ වගකීම පැවරූ ආයතනය වන දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය සඳහා මුල්ම විනිසුරන් පත් කරනු ලැබුවේ 1995 දීය. මෙම විනිසුරන්ට පැවරුනු මුල්ම වගකීමක් වූයේ අධිකරණය සඳහා නව පරිශ්‍රයක් තෝරාගැනීම සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අගයන් පිළිබිඹු වන්නාවූත් යුක්තියේ වර්ණභේදවාදී නිර්වචන පූර්ණ වශයෙන්ම ප්‍රතික්ෂේප කිරීම පිළිබිඹු වන ගොඩනැගිල්ලක් එහි ඉදිකිරීමයි. මේ සඳහා වර්ණභේදවාදී ඉතිහාසය සමගින් තදින් බැඳී ඇති ස්ථානයක් වන අංක හතර නමින් හඳුන්වන පැරණි කොටු බන්ධනාගාරය තෝරාගැනීමට විනිසුරෝ තීරණය කළහ.

අප්‍රිකානු ජනරජයේ ප්‍රථම ජනාධිපති පෝල් කෲගර් විසින් සංක්‍රමණික පතල්කරුවන් බියගැන්වීම සඳහා ජොහැන්නස්බර්ග් නුවර මධ්‍යයේ අංක හතර නමින් හඳුන්වන මෙම පැරණි කොටු බන්ධනාගාරය ඉදි කරන ලදී. කාලයක් ගතවත්ම එය හමුදා කොටුවක් වශයෙන් සහ දඬුවම් දෙන ස්ථානයක්, සිරකර තබන ස්ථානයක් හා

අපයෝජන සිදුකරන ස්ථානයක් වශයෙන් භාවිතා කරන ලදී.වර්ණභේදවාදී සමයේදී අපරාධකරුවන් සමගින් නෙල්සන් මැන්ඩෙලා, ගාන්ධි වැනි දේශපාලන සිරකරුවන් සිරකර තැබීම සම්බන්ධයෙන් මෙම බන්ධනාගාරය කුප්‍රකට විය. කෙසේනමුත් එහි සිරකර සිටි බහුතරය හැඳුනුම්පත තමාවෙත තබා නොගැනීම වැනි සුළු අපාතයිඩ් නීති උල්ලංඝනය වෙනුවෙන් සිරබත් කන දහස් ගණනක් වූ සාමාන්‍ය දකුණු අප්‍රිකානුවෝ වූහ.

විනිසුරුවන් මෙම බන්ධනාගාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ පරිශ්‍රය වශයෙන් තෝරාගැනීමට හේතුව වූයේ මෙම ඉතිහාසයයි. අතීතයේ සිදු වූ අයුක්ති හා අසාධාරණකම් පිළිබඳ මතකයන්ගෙන් ගහණ ස්ථානයක සිට ඔවුන් යුක්තිය පසිඳලනු ඇත.දකුණු අප්‍රිකාවේ නව දැක්ම ඉදිරියට ගෙනයන්නන් වශයෙන් කුප්‍රකට අංක හතර බන්ධනාගාරය ප්‍රජාතන්ත්‍රවාදයේ මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම ඉතා ප්‍රබල සංකේතයක් විය.

නමුත්, ඍණාත්මක මතකයන් ධනාත්මක යමක් බවට පත් කරගන්නේ කෙසේද? රටේ උපරිමාධිකරණය හරහා පසිඳලන යුක්තිය සියළු දකුණු අප්‍රිකානුවන්ගේ ජීවිතවල යථාර්ථයක් බවට පෙරලන්නේ කෙසේද? ජොහැන්නස්බර්ග් නගරයේ වඩාත්ම දුගී ප්‍රදේශ යළි පනගැන්වීම ඉලක්ක කරගත් පුළුල් ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක කේන්ද්‍රය වශයෙන් සලකනු ලැබුවේ කන්ස්ටිටුෂන් හිල් පරිශ්‍රයයි.එම ස්ථානයේ රඳවා තබාගත් පුද්ගලයින් බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ට මුහුණ දුන් අය වන හෙයින් ඔවුන්ගේ අත්දැකීම් සම්බන්ධයෙන්ද එම ස්ථානය සාක්ෂි දැරියයුතු බව එහිදී මතය විය. තවත් අරමුණක් වූයේ වර්තමානයෙහිදී මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ආවර්ජනය සහ විවෘත සාකච්ඡා සිදුකිරීම සඳහා ඉඩක් නිර්මාණය කිරීමයි.මේ විවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය සඳහා උරුමය, සංචාරක කර්මාන්තය සහ සංවර්ධනය යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන බහු ආංශික වෑයමක් සැලසුම් කරන්නට මෙම ස්ථානය සංවර්ධනය කිරීමේ වගකීම දැරූ කණ්ඩායම විසින් කටයුතු කරන ලදී.



*කන්ස්ටිටුෂන් හිල් පරිශ්‍රයේ පවත්වන ලෙගොට්ලා හමුවක්*

පැරණි බන්ධනාගාරය පිහිටි ස්ථානයේ ඇති කරන මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය සම්බන්ධයෙන් වන දැක්ම යථාර්ථයක් කරගැනීමට නම්, රජයේ දෙපාර්තමේන්තුවක් වන රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (Department of Public Works) සාම්ප්‍රදායිකව සැලසුම්කර ඉදිකරන ගොඩනැගිලි වෙනුවට නව එළඹුමක්, එනම්, විවෘත ජාත්‍යන්තර සැලසුම් සහ ගෘහනිර්මාණ ශිල්ප තරඟයක් පැවැත්වීමට වුවමනා කරන බව විනිසුරුවන් අවබෝධ කරගත්හ. අතීතයෙන් වෙන්වී යාමක් නිරූපණය කිරීමටත් නව ප්‍රජාතන්ත්‍රවාදී එළඹුම සංකේතවත් කිරීමටත් මෙම තරඟය උපකාරී වනු ඇති බව විනිසුරුවන්ගේ මතය විය.

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව සමගින් එක්ව අදියර දෙකක ජාත්‍යන්තර සැලසුම් හා ගෘහනිර්මාණ ශිල්ප තරඟයක් පවත්වන්නට විනිසුරෝ කටයුතු කළහ. තරඟ විනිශ්චය සඳහා විවිධ පාර්ශවකරුවන් නියෝජනය වන කණ්ඩායමක් පත් කරන ලදී. මෙම තරඟය ජාත්‍යන්තර මට්ටමින් පැවැත්වූ හෙයින් ලෝකයේ විවිධ රටවලින් තරඟයට ඉදිරිපත් වුවද අවසාන ජයග්‍රාහක කණ්ඩායම වූයේ 'තමන්ගේ රටේ සිදුවන දෑ සාදරයෙන් වැළඳගත්' තරුණ දකුණු අප්‍රිකානුවන් කණ්ඩායමකි.[9] බොහෝ විවාද සහ සාකච්ඡා මධ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ විනිසුරන් හා සැලසුම් කමිටු විනිසුරන් සමග එක්ව අවසන් සැලසුමක් සකස් කරගන්නට සැලසුම් සම්පාදනකණ්ඩායම සමත්විය. නමුත් කන්ස්ට්ටිටුෂන් හිල් දක්වා වන මාර්ගය සංවර්ධනය කිරීම ඇතුළුව සැලසුම්ගත යටිතලපහසුකම් සංවර්ධන කටයුතු

සිදුකර සැලසුම යථාර්ථයක් කරගැනීම ආර්ථික අභියෝග හේතුවෙන් දුෂ්කර විය. අවසානයේදී අන්තර් දෙපාර්තමේන්තු අරමුදල් යොදගනිමින් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට හැකිවිය.

කෞතුකාගාරයක් බවට පරිවර්තනය කර ඇති අංක හතර බන්ධනාගාරයේ කොටසක්, අපක්ෂපාතීව යුක්තිය පසිඳලන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය සහ වර්ණභේදවාදී සමයේ උරුමයක් වශයෙන් අදටත් පවතින සමාජ ගැටළු ආමන්ත්‍රණය කරන සංවිධානවල කාර්යාල ඇතුළත් වන බහුකාර්ය සංකීර්ණයක් බවට කන්ස්ට්ටිටුෂන් හිල් අදවනවිට පත්ව තිබේ.එහි ඇති ලෙගොට්ලා[10] වැඩසටහන හරහා යුක්තිය හා නිදහස මෙන්ම දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ සලකා බලමින් පවතින සමලිංගිකයින්ගේ විවාහ, ඉඩම් අයිතිය වැනි පුළුල් මාතෘකා පිළිබඳ සංවාද හා විවාදයන්හි නිරතවීමට සියළු දකුණු අප්‍රිකානුවන්ට ආරාධනා කරනු ලැබේ.(ඉහත විස්තර කළ) අදහස් ලබාගැනීමේ පුළුල් වැඩසටහන හරහා කන්ස්ට්ටිටුෂන් හිල් පරිශ්‍රය වර්තමානයේදී නව දකුණු අප්‍රිකාවේ ජාතික සංකේතය බවට සහ මෙම නව දකුණු අප්‍රිකාව කුමක්දැයි දකුණු අප්‍රිකානුවන් (සහ අන්‍යයන්) විවාද කරන හා නිර්වචනය කරන ජාතික පොදු ස්ථානයක් පත්ව ඇත.

[9] ලෝරන් සෙගාල් සහ තවත් අය. (2006)*Number Four: The Making of Constitution Hill* ලන්ඩන්: පෙන්ගුඉන්, පි.85

[10] ලෙගොට්ලා යනු ස්වානා භාෂාවට අයත් වචනයක් වන අතර එය යටත්විජිතකරණයට පෙර පැවති ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා ක්‍රමයක් හඳුන්වන නමකි. එහිදී ගම්වාසීහු ගස් සෙවනක හමුවී තමන් මුහුණදෙන ගැටළු සාකච්ඡා කරති.




# පස්වන පරිච්ඡේදය

## ස්මාරක නොමැති සඳනුස්මරණය

**සදනුස්මරණය හරහා** ප්‍රතිසන්ධානය, පිළිගැනීමට ලක් කිරීම, සත්‍ය සෙවීම, ප්‍රජාව සම්බන්ධ කරගැනීම සහ අනාගත පරම්පරාව දැනුවත් කිරීම සඳහා ගඩොල්, බදම හෝ කිරිගරුඬ පාෂාණම වුවමනා නොවන බව මෙම අත්පොත මුළුල්ලේම අවධාරණය කර ඇත.

දෙවන ලෝක යුධ ස්මාරක වැනි වූ සාම්ප්‍රදායික ස්මාරකයන්ගෙන් බැහැරට ගොස් ස්වභාවික ඉඩකඩ නිර්මාණය සඳහා වෑයම් කරන සංකල්පීය කලා නිර්මාණ යොදාගන්නා සදනුස්මරණ ක්‍රියාවලි වෙත යොමුවීමේ නැඹුරුවක් වර්තමානයේදී බහුලව දක්නට ලැබේ.

**සංවාද වැඩසටහන්: විලා ග්‍රිමල්ඩි සාම උද්‍යානය, චිලී දේශය**

ප්‍රචණ්ඩවූ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් චිලී රාජ්‍යයේ ජනාධිපති සැල්වදෝර් අයන්දේ ගේ රජය 1973 දී බලයෙන් පහ වූ අතර දක්ෂිණාංශික රජයක් බලයට පත්විය. රාජ්‍ය මුළුල්ලේ පැවති ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වසා දැමුණු අතර ඒ වෙනුවට කුරිරු මිලිටරි ඒකාධිපතිවාදයක් සහ රජයට එරෙහි පුද්ගලයින් මැඩ පැවැත්වීමේ සහ ක්‍රමානුකූලව විනාශ කර දැමීමේ ව්‍යාපාරයක් පැතිර ගියේය. 17 වසරක් මුළුල්ලේ පැවති මෙම රාජ්‍ය ත්‍රස්තවාදය සමගින් පුරවැසියන් දහස් ගණනක් රඳවා තබාගැනීමටත් 'අතුරුදන් කරවීමටත්' ලක්වූ අතර තවත් අය රහස් රැඳවුම් කඳවුරු හා වධකාගාර තුළ දිවි ගලවාගැනීමේ අරගලයක නිරතවූහ. සන්තියාගෝ නගරාසන්නයෙහි පින්‍යලොලෙන් ප්‍රදේශයේ ධනවත් පවුලක් වාසය කළ වතුයාය වූ විලා ග්‍රිමල්ඩි එවන් එක් ස්ථානයක් විය.උස් තාප්පවලින් වටවූත් වෙන් වෙන්ව පිහිටි විවිධ ප්‍රමාණවල ගොඩනැගිලි සමූහයකින් සමන්විතවූත් මෙම වතුයායේ ගෘහනිර්මාණ ශිල්පය විරුද්ධ මත දරන්නන් තෝරාබේරාගෙන තනි කිරීම සඳහා මනාව ගැලපෙන ස්ථානයක් විය. 1973 කැරැල්ලෙන් අනතුරුව ජාතික බුද්ධි අංශයේ (DINA) සෙබළු මෙම වතුයාය අත්කරගෙන එය මිලිටරි ඒකාධිපති සමයේ රඳවාතබාගැනීම් හා ප්‍රචණ්ඩත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගත්හ.චිලී රාජ්‍යයේ අනාගත ජනාධිපතිනිය වූ මිෂෙල් බැචලට් සහ ඇගේ මව ඇතුළුව, පැවති පාලනතන්ත්‍රයට එරෙහි වූ බවට සැක කරන පුදගලයින් 4500ක් පමණ ඔවුන්ගේ නිවෙස්වලින් හෝ මහමගදී පැහැරගෙන දෑස් බැඳ දමා විලා ග්‍රිමල්ඩි වෙත ගෙන ආ අතර ඔවුන් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මේ පුද්ගලයින් සිටින ඉසව්වක් හෝ මෙම ස්ථානයේ සිදු කෙරෙන්නේ කුමක්දැයි දැන සිටියේ නැත.එහි ගෙන ආ පසු ඔවුන්ව වධහිංසාවට ලක් කිරීම හා ප්‍රශ්න කිරීම සිදු කළ අතර, ඉන් සිවු දෙනෙකු මරා දැමුණු අතර 226ක් අතුරුදන් විය.



*විලා ග්‍රිමල්ඩි හි රඳවා සිටි කාන්තාවන් වෙනුවෙන් කැප කළ විලා ග්‍රිමල්ඩි සාම උද්‍යානයේ රෝස උයන*

විලා ග්‍රිමල්ඩි කඳවුරෙන් දිවි ගලවාගත්තවුන් කණ්ඩායමක් එක්ව එම ස්ථානය හා එහි මතකයන් සංරක්ෂණය කර කල් පවත්නා මානව හිමිකම් සංස්කෘතියක් ප්‍රවර්ධනය සඳහා එහි සිදුවූ දෑ පාඩමක් කරගැනීමේ අරමුණ ඇතිව 1996දී විලා ග්‍රිමල්ඩි සාම උද්‍යාන සමාගම අරඹන ලදී. එම දිවිගලවාගත්තවුන්ගේ සංගමය මුහුණ දුන් මුල්ම අභියෝගයක් වූයේ එම ස්ථානය තවදුරටත් පෙර තත්වයෙන් නොතිබීමයි.මිලිටරි ඒකාධිපති පාලනයේ අවසානය ළඟාවත්ම ජාතික බුද්ධි අංශ සෙබළුන් විලා ග්‍රිමල්ඩි කඳවුරේ රහස් එළිවීම වැලැක්වීම සඳහා බුල්ඩෝසර් යොදගනිමින් එම ස්ථානය පොළොවට සමතලා කර තිබිණි.ඉතිරිව තිබුනේ බුද්ධි අංශ නියෝජිතයින්ට ව්‍යාජ හැඳුනුම්පත් නිපදවීම සඳහා යොදගත් එක් කුඩා ගොඩනැගිල්ලක් පමණි. මෙම ස්ථානයේ රඳවාගැනීමටත්, වධහිංසාවටත්, මරාදැමීමටත් ලක්වූ පුද්ගලයින්ගේ අත්දැකීම් සඳහා අතහැර

දැමූ නෂ්ටාවශේෂ සාක්ෂි දරන්නේ කෙසේද? දැඩි කම්පනයක් ඇතිකළ මෙම ස්ථානය දිවි ගලවාගත්තවුන් සහ වින්දිතයින්ගේ පවුල්වල සාමාජිකයින්ට සැනසිලිසගතව ආවර්ජනයේ නියැලෙන්නටත් සුවවීමටත් හැකි ස්ථානයක් බවට පත් කරන්නේ කෙසේද?

මුල් ස්ථානය අළුත්වැඩියා කරන්නේද නැතහොත් යථා තත්වයට ගෙන එන්නේද, එසේ නම් ඒ කෙසේද යනාදිය පිළිබඳව කණ්ඩායම බොහෝ සාකච්ඡා හා විවාද පැවැත්වූහ. එය ප්‍රතිනිර්මාණය කිරීම වෙනුවට සංකේතාත්මක ස්මාරක සහ ව්‍යූහ විසිර පවත්නා සාම උද්‍යානයක් බවට පත්කිරීමට පසුව තීරණය කරන ලදී. පසුව, මනාව සිතා බලා බොහෝ සාකච්ඡා කර විවිධ ශෛලියේ ව්‍යූහ සහ ස්මාරක උද්‍යානයේ විවිධ ස්ථානවල කලින් කලට ඉදිකරන්නට යෙදුනි. ඉන් බොහොමයක් පැවසීමෙන් නොව පෙන්නුම් කිරීමෙන් වින්දිතයින්ගේ අත්දැකීම් පිළිබඳ සිහියට නංවාලීම ඉලක්ක කරගෙන නිර්මාණය කළ ඒවාය. උදහරණ ලෙස, දෑස් බැඳ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙනගිය සිරකරුවන්ට දකින්නට ලැබුණු එකම දර්ශනය වූ පොළොවේ අතුරා ඇති පිඟන් ගඩොල් විය.  ගොඩනැගිලි කඩා බිඳ දැමූ සුන් බුන් අතරින් එම පිඟන් ගඩොල් කැබලි තෝරාගෙන එම කැබලිවලින් නිර්මාණය කළ රටා සාම උද්‍යානය මුළුල්ලේම විවිධ ස්ථානවල පොළොවේ දක්නට ඇත. එය, රැඳවියන්ගේ අත්දැකීම් පිළිගැනීමට ලක් කිරීමට දරන ලද වෑයමකි.මින් ඇතැම් මෝස්තර රටා වර්ණවත් පුවරු වශයෙන් සකස් කර විවිධ ගොඩනැගිලි පැවති ස්ථාන සහ ඒවායෙහි සිදුවූ දේවල් පෙන්නුම් කිරීමට යොදාගෙන තිබේ (උදා: 'වධක කාමරය') වින්දිතයින්ටගරු කරන අතරේම දිවි ගලවාගත්තවුන්ට එම ස්ථාන සංවර්ධනය කිරීමට සම්බන්ධවීමටඉඩ සලසාදුන් තවත් උදාහරණයක් ඇත. දෑස් බැඳ ප්‍රශ්න කරන කාමරයට රැගෙන යද්දී හා ආපසු එද්දී තමන්ට රෝස මල් සුවඳක් දැනුන බව කාන්තා සිරකරුවන් පැවසූ එක් ස්ථානයක් වූ අතර එම ස්ථානයේ රෝස උයනක් නිර්මාණය කිරීමට තීරණය කරන ලදී. මෙම අදහසට නව අරුතක් දුන් සාම උද්‍යාන සමාගම කාන්තා වින්දිතයින් සිහිකිරීම සඳහා එක් රෝස පැලය බැගින් සිටුවන්නට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට අරාධනා කරන ලදී.ඉතිරිවී තිබුණු එකම ගොඩනැගිල්ල වූ ව්‍යාජ හැඳුනුම්පත් නිපදවීමට බුද්ධි අංශ යොදාගත් ගොඩනැගිල්ල 'සාම නිවහනක්' බවට පරිවර්තනය කර, වින්දිතයින්ගේ ඡායාරූප සහ අනෙකුත් සිහිවටන එහි කුඩා පෙට්ටි තුළ තැන්පත් කරන්නට වින්දිතයිනේ පවුල්වලට ආරාධනා කරන ලදී.

එහිදී පීඩාවට ලක්වූ වින්දිතයින්ට සුවය ලැබීම, ඔවුන්ව පිළිගැනීමට ලක් කිරීම සහ මතකයේ තබාගැනීමට අමතරව නව පරම්පරාවට මෙම පණිවුඩ ගෙන යාමටද විලා ග්‍රිමල්ඩි ප්‍රයෝජනවත් වී තිබේ. දැනුවත් කිරීමේ ඉලක්කය ආමන්ත්‍රණය කිරීමට සාම උද්‍යාන සමාගම විසින් සිසුන් හා අනෙකුත් අය සඳහා මෙම ස්ථානයේ චාරිකා සංවිධානය කරනු ලැබේ. මෙම චාරිකා සඳහා මගපෙන්වන්නේ එම ස්ථානයෙන් දිවි ගලවාගත්තවුන් වන අතර එහි සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳ සැබෑ විස්තරයක් නරඹන්නන්ට ලබාදෙන්නට ඔවුහු කටයුතු කරති.නව ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා පෙළඹවීමටනම් වත්මනෙහි ජීවත්වනනවුන්ට වඩාත්ම අදාළ වන ගැටළු ආමන්ත්‍රණය කළයුතු බව හෘද සාක්ෂිය පිළිබිඹු කරන අනෙකුත් ස්ථාන මෙන්ම විලා ග්‍රිමල්ඩි සාම උද්‍යානයද අවබෝධ කරගෙන තිබේ. පිනෝෂේ රජයට එරෙහිව සංවිධානය වූ තරුණයින් අතුරුදන් වීමට වධහිංසාවට සහ රඳවා තැබීමට ලක්වූ හෙයින් වත්මන් තරුණ පරම්පරාවට ඉතිරි වී ඇති අතිශය විනාශකාරී උරුමය නම් ඉතා දුර්වල ක්‍රියාකාරීත්ව සංස්කෘතියක් පැවතීමයි. ඔවුනට වඩාත්ම වැදගත් වන ගැටළු වශයෙන් තරුණයින් විසින් හඳුනාගත් ගැටළු සම්බන්ධයෙන් පාසල් තුළ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට තරුණයින්ට උපකාර කිරීම සඳහා වත්මන් තරුණ ක්‍රියාකාරීත්වයට උදාහරණ වශයෙන් ගතහැකි සිදුවීම් විලා ග්‍රිමල්ඩි සාම උද්‍යානයේ වැඩසටහන් සඳහා යොදා ගනු ලැබේ. පන්ති කාමරය තුළ වත්මනෙහි වඩාත්ම බලපාන්නා වූ කාරණා හඳුනාගැනීමට පිණිස විලා ග්‍රිමල්ඩි සාම උද්‍යානය ගුරුවරුන් සහ ළමුන් සමඟින් කටයුතු කරනු ලැබේ. රාජ්‍ය ත්‍රස්තවාදයේ නශ්ඨාවශේෂ වශයෙන් ඉතිරිව ඇති එක් බරපතල ප්‍රතිවිපාකයක් වන්නේ සංක්‍රමණිකයින් සහ ආදිවාසී ජන ප්‍රජාව පීඩාවට පත්කිරීම හරහා පෙන්නුම් කරන්නා වූ ප්‍රචණ්ඩත්වයේ, ලේබල් කිරීමේ සහ බහිෂ්කරණයේ සංස්කෘතියයි. (Culture of exclusion)

මෙම තත්ත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා, විලා ග්‍රිමල්ඩි සිර කඳවුරෙන් දිවි ගලවා ගත්තවුන් අතර මතකයන් බෙදා හදා ගැනීමෙන් ඔබ්බට ගොස් ඉතිහාසය සහ එම ස්ථානය අතර ඇති වඩාත් සෘජු සබඳතා මෙන්ම වත්මනෙහි තරුණ කැල මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් අවධානය යොමු කෙරෙන නව චාරිකා සැලසුම් කිරීමට විලා ග්‍රිමල්ඩි කාර්ය මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබේ. ''කිසිදා සිදු නොවිය යුතුයි''[11] යන ඉලක්කය සපුරාගැනීමට නම් විවිධ පරම්පරාවන් විසින් විවිධ කාරණා සඳහා මෙම ස්ථානය භාවිතා කිරීම සිදුවිය යුතු බව විලා ග්‍රිමල්ඩි අධ්‍යාපනඥයෝ විශ්වාස කරති.

## සිරුරු සිතියම්ගත කිරීම (Body Mapping): ප්‍රජා මුලපිරීම්, ලයිබීරියානු මාධ්‍ය මධ්‍යස්ථානය සහ මානව හිමිකම් මාධ්‍ය මධ්‍යස්ථානය, ලයිබීරියාව



*ලයිබීරියාවේදී සිරුරු සිතියම්ගත කිරීම*

අප්‍රිකාවේ පැරණිතම ස්වාධීන රාජ්‍යයක් වන ලයිබීරියාවේ 1990 දශකයේ ඇතිවූ දිගැදුණු යුද්ධය බටහිර අප්‍රිකානු කළාපයටම බලපෑවේය. සාපේක්ෂ වශයෙන් ස්ථාවර වූ ඉතිහාසයක් ඇති ලයිබීරියාව තුළ ප්‍රචණ්ඩත්වයේ පළමු රැල්ල ඇතිවූයේ 1980 දශකයේ දී සැරයන් සැමුවෙල් ඩෝ විසින්ජනාධිපති විලියම් ටොල්බර්ට් බලයෙන් පහකර බලය ලබාගැනීමත් සමගින් ආහාරවල මිල සම්බන්ධයෙන් ඇතිවූ කෝලාහලයත් සමගින්ය. සැමුවෙල් ඩෝ

[11]යම් කෲර සිදුවීමක් සිහියේ තබාගැනීම තුළින් අනාගතයේ එවන් සිදුවීම් සිදුනොවන බව සහතික කරගැනීම සඳහා විවිධ කණ්ඩායම් විසින් ''කිසිදා සිදු නොවිය යුතුයි'' යන පාඨය යොදා ගනු ලැබේ. මෙය මුලින්ම යුදෙව් සමූලඝාතනය සම්බන්ධ කරගෙන ප්‍රචලිත වූවකි. යුදෙවු ආරක්ෂක ලීගයේ (Jewish Defense League) ආදිකර්තෘ මයර් කහානේ විසින් 1972 දී රචිත *Never Again!: A Program for Survival* නම් ග්‍රන්ථය සමගින් මෙම පාඨය ප්‍රචලිත වූ බවක් ඇතැමුන් විශ්වාස කරතත් වෙනත් මත දරන යුදෙවු නායකයින්ද මෙම පාඨය යොදාගෙන තිබේ. 1972 දී ඒබ්‍රහම් ෆොක්ස්මන් රචනා කළ ග්‍රන්ථයට ඔහු විසින් (Never Again?: The Threat of the New Anti-Semitism) යන නම යොදන අවස්ථාවේ ජුවිෂ් ඩේලි ෆෝවර්ඩ් පුවත්පතට ඔහු සඳහන් කර තිබුණේ එම පාඨය යුදෙවු සමූලඝාතන කඳවුරුවලින් දිවිගලවාගත්තවුන් සඳහා පමණක් වන පාඨයක් බව ඇතැමුන් ඔහුට පැවසූ බවයි. 'යුදෙවු ජාතිකයින් වන අපට එම පාඨය සඳහා පේටන්ට් බලපත්‍රයක් නොමැති' බව ෆොක්ස්මන්ගේ මතය විය. (බෙත් ෂ්වාට්සප්ෆල්, "Never Again, Again" Jewish Daily Forward, October 6, 2006) කහානේ සහ ෆොක්ස්මන්ගේ මතය කුමක් වුවද, වර්ගඝාතය (genocide) සම්බන්ධයෙන් සඳහන් කරනවිට පමණක් නොව මහා පරිමාණයෙන් සිදුවන වෙනත් මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී ද විවිධ කණ්ඩායම් විසින් මෙම පාඨය භාවිතා කරනු ලැබේ. ප්‍රචලිත වූ එවන් එක් අවස්ථාවක් වන්නේ පුද්ගලයින් අතුරුදහන්වීම පිළිබඳ ආර්ජන්ටීනියානු ජාතික කොමිසම විසින් 1984දී නිකුත්කළ වාර්තාවේ නාමය වශයෙන් මෙම පාඨය භාවිතා කිරීමයි. හිටපු නීතිපති ජෝන් ඈෂ්ක්‍රොෆ්ට් මහතා ද 9/11 සිදුවීම පිළිබඳ ඔහු විසින් රචිත ග්‍රන්ථයේ නාමය සඳහා මුල් අර්ථයෙන් බැහැරව යමින් මෙම පාඨය භාවිතා කර තිබේ.

ජනපතිවරයාගේ ආණ්ඩුව බලයෙන් පහ කිරීමට චාර්ල්ස් ටේලර්ගේ ජාතික දේශාභිමානී පෙරමුණ කටයුතු කළ 1980 දශකයේ අගභාගය වනවිට සිවිල් යුද්ධයත් සමගින් පාලනයේ අභියෝග සහ ආර්ථිකයේ කඩාවැටීම උච්ඡ ස්ථානයකට පැමිණ තිබිණි.උග්‍ර වූ ගැටුම් 1990 දශකය දක්වාම පැවතුණේය. ECOWAS සාම සාධක හමුදාවේ මැදිහත්වීමෙන් අනතුරුව ඇති වූ යුධවිරාම ගිවිසුම යටතේ චාර්ල්ස් ටේලර් ජනපති තනතුරට පත් වූයේය.චාර්ල්ස් ටේලර් ජනපතිවරයා කැරලිකරුවන්ට සහය දෙන බවට අනෙකුත් බටහිර අප්‍රිකානු රාජ්‍ය චෝදනා කරන අතරේ අසල්වාසී රාජ්‍යය වූ ගිනියාව කැරළිකරුවන්ට සහය දෙන බව ටේලර් ජනපතිවරයා චෝදනා කිරීමත් සමගින් 1999දී ප්‍රචණ්ඩත්වය යළි හිස එසවීය. ජනපතිධුරයෙන් ඉල්ලා අස්වන්නට ටේලර් ජනපතිවරයාට බලකරන ලදී.සිවිල් යුධ සමයේ ඇති වූ බරපතළ මානව හිමිකම් උල්ලංඝන විමර්ෂනය කිරීමටත් සාමය, ප්‍රතිසන්ධානය හා ජාතික සමගිය ප්‍රවර්ධනයටත් 2005දී ලයිබීරියානු සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම ඇතිකරන ලදී.දශක දෙකකට ආසන්න කාලයක් පැවති සිවිල් යුද්ධය හා චාර්ල්ස් ටේලර්ගේ රජය යටතේ ක්‍රමිකව සිදුවූ මැඩ පැවැත්වීම් හේතුවෙන් පුද්ගලයින් 250,000ක් පමණ මරාදැමුණු අතර දහස් ගණනක් බලහත්කරයෙන් අවතැන්වීමත් රටේ  ආර්ථිකය පිරිහීමත් සිදුවිය.අප්‍රිකාවේ වඩාත්ම දුගී රට වන මෙරට යටිතල පහසුකම් අවශ්‍යතා, සේවා වියුක්තිය සහ නූගත්කම හේතුවෙන් පීඩා විඳියි. ඉක්මනින් සපුරාලියයුතු මෙම අවශ්‍යතා සලකා බලන කළ දහස් ගණනක් වන ගැටුමේ වින්දිතයින් පිළිගැනීමට ලක් කරන්නේ කෙසේද?දශක දෙකකට ආසන්න කාලයක් මුළුල්ලේ පැවති ගැටුමකින් ඇතිවූ දැඩි කම්පනය සුවකිරීමට මතකය දායක වන්නේ කෙසේද? 2010 අප්‍රේල් මාසයේදී ප්‍රජා මුලපිරීමේ[12] සහාග සාමාජිකයෝ ලයිබීරියාවේ මාධ්‍ය මධ්‍යස්ථානය[13] සහ දකුණු අප්‍රිකාවේ මානව හිමිකම් මාධ්‍ය මධ්‍යස්ථානය[14] සමගින් එක්ව සිරුරු සිතියම්ගත කිරීමේ හුවමාරු ව්‍යාපෘතියක් දියත් කළහ.රාජ්‍ය නොවන සංවිධාන විසින් මුලපුරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා හෘදය සාක්ෂිය පිළිබිඹු කිරීමේ ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයද සහය දුන් අතර සුවවීම හා වෙනුවෙන් පෙනීසිටීම සඳහා යන්ත්‍රණයක් වශයෙන් මතකයේ සහ කලාවේ භූමිකාව අවධාරණය මෙන්ම ලයිබීරියානු සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් ඉදිරිපත් කළ, විවාදයට තුඩු දුන් නිර්දේශ පිළිබඳ සංවාදයක් හා සාකච්ඡාවක් සිදු කිරීම සඳහා සිරුර සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය භාවිතා කිරීම ඉලක්ක කරගනිමින් එය ක්‍රියාත්මක විය.

සිරුර සිතියම්ගත කිරීම (body mapping) යනු සහභාගිවන්නන් විසින් තමන්ගේ ශරීරයේ හැඩයට හා එම විශාලත්වයට අඳින ලද මිනිස් රුවක් මත තමන්ගේ අත්දැකීම් හා තමන් විඳි කම්පනය ඇඳීම සහ ලියා දැක්වීම සිදු කරන්නා වූ කලා චිකිත්සා සහ ස්මරණ ක්‍රමවේදයකි.සහභාගිවන්නන්ට තමන්ගේ අතීතය, අනාගතය සහ අත්දැකීම් සිතින් මවාගෙන තමන්ගේ සිරුරේ 'සිතියමක්' නිර්මාණය කරගැනීම සඳහා සිදු කෙරෙන නිර්මාණාත්මක අභ්‍යාස මාලාවක් ඊට ඇතුළත් වේ. මෙම සිරුර සිතියම්ගත කිරීමේ තාක්ෂණික ක්‍රමය තුළින් පුද්ගලයකුගේ ළමාවියේ සිට ඔවුන් අපේක්ෂා කරන අනාගතය දක්වා සමස්ථ ජීවන ගමනම පෙන්නුම් කරයි.අතීතය අනාගතය සමගින් සම්බන්ධ කරන සහභාගිවන්නන් තමන් ලැබූ අත්දැකීම්වල භෞතික බලපෑම සිතියම් ගත කරති: එහිදී තමන් ලැබූ තුවාල කැලැල්, වේදනාව සහ තුවාල ඊට ඇතුළත් කරනු ලැබ. තවද ඔවුහු  තමන්ගේ සබඳතා, ඔවුන්ව දිරිගන්වන හා පොළඹවන සාධක, ඔවුනට ඉදිරියට යාමට ශක්තිය ලබාදුන් සිදුවීම් යනදියද ඔවුහු මෙම සිතියමට ඇතුළත් කරති. මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ පුද්ගලයා මුහුණ දුන් දැඩි කම්පන තත්වයන් පුළුල්වූ ජීවන ගමනේ පසුබිම මත ස්ථාපනය කිරීමයි.කණ්ඩායම් ක්‍රියාවලියක් වශයෙන් සහභාගිවන්නෝතමන් ලැබූ විවිධ අත්දැකීම්  වැඩමුළුවේ විවිධ අදියරයන්හිදී  එකිනෙකා සමගින් බෙදාහදා ගනිති. මෙතුළින් පුදගලයින්ට තමන් දෙස බැලීමටත් තමන් විඳි අත්දැකීම් පුළුල් ප්‍රජාවේ අත්දැකීම් පසුබිමෙහි තබා සලකා බැලීමටත් ඉඩ ලැබේ. එවිට, තමන් දැඩිව කම්පනයට පත්කළ එම සිදුවීම් ජීවන අත්දැකීම් රැසක් අතරේ එක් අත්දැකීමක් වන බවත්.

[12]ප්‍රජා මුලපිරීම යනු සංක්‍රාන්තික යුක්තිය සහ සාමය ගොඩනැංවීමේ ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ලයිබීරියානු රාජ්‍ය නොවන සංවිධානයකි.

[13]http://www.lmcliberia.com/

[14]http://www.hrmc.org.za/

ඊට සාර්ථකව මුහුණදීමට තමන්ට ඇති ශක්තිය හා සමාජයට යළි අනුගතවීමටත් සුවවීමටත් වුවමනා කරන යන්ත්‍රණ කවරේද යන්නත් අවධාරණය කරනු ලබයි.මෙම ක්‍රමය විවිධාකාර වූ සහභාගිවන්නගෙන් සැදි පුළුල් කණ්ඩායම් සඳහා යොදවා ඇති අතර ඔවුන් මුහුණදුන් ශාරීරික හා චිත්තවේගීය කම්පන සඳහා සාර්ථකව මුහුණදීමට එමගින් ඔවුනට සහය ලබාදී තිබේ. විශේෂයෙන්ම, මෙම ශිල්පක්‍රමය භෞතික ශරීරයේ පිළිබිඹුවක් යොදගන්නක් වන හෙයින් එය එච් අයි වී වැළඳුනු පුද්ගලයින්, බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් අනතුරුව දිවි ගලවාගත්තවුන් සහ ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් සමග කටයුතු කිරීමේදී බහුලව යොදගෙන තිබේ.ශිල්පක්‍රමයක් වශයෙන් සිරුර සිතියම්ගත කිරීම හරහා සුරක්ෂිත හැඟීමක් දනවන ක්‍රමයක් උපයෝගී කරගනිමින් දුෂ්කර අත්දැකීම් පිළිබඳ එකිනෙකා සමගින් මෙන්ම කැමැති නම් පුළුල් ප්‍රජාව සමගින් ද බෙදහදගැනීමට මෙමගින් පුද්ගලයින්ට ඉඩ සලසාලයි. හෘදය සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන සන්ධානය විසින් මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලබන්නේ බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ට ලක්වූ පුදගලයින් සමගින් කටයුතු කිරීමේදීය. එහිදී එම පුද්ගලයින් වධකාගාර, රැඳවුම් ස්ථාන හෝ සමූලඝාතන සිදු කළ ස්ථාන පිළිබඳ ඇති මතකය තමන්ගේ අත්දැකීම් සහ මතකයන් ගවේෂණය කිරීමට යොදගනිමින් ඔවුන්ගේ වත්මන් ජීවිතයට හා අනාගතයට එම ස්ථානයේ ඇති සම්බන්ධය ගවේෂණයේ නිරත වෙති.

ලයිබීරියාව තුළ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම වන්දි ගෙවීමට කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හෝ දිවිගලවාගත්තවුන්ට නොපමාව වුවමනා කළ වෛද්‍ය, මූල්‍ය හා සදනුස්මරණ අවශ්‍යතා සපුරාලීමට එරට රජය උනන්දු නොවීම පිළිබඳ සලකා බලා දිවිගලවාගත්තවුන්ගේ සුවවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමටත් වින්දිතයින්ගේ අවශ්‍යතා පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමටත් සිරුර සිතියම්ගත කිරීමේ ක්‍රමය වඩාත් සුදුසු බව තීරණය කරන ලදී.තවද, දිවි ගලවාගත්තවුන් මතක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබාගැනීමට කළ ඉල්ලීම් ඇතැම් ජාත්‍යන්තර ආධාර ආයතන විසින් පිළිගෙන තිබුණද සීමිත සම්පත් හා ඉක්මනින් විසඳියයුතු අනෙකුත් සංවර්ධන හා පාලන ගැටළු කෙරෙහි සිවිල් සමාජයේ අවධානය සලකා බලන කල තිරසාර මතක ව්‍යාපෘති සඳහා පැවතියේ ඉතා සීමිත සම්පත් ප්‍රමාණයකි. සිරුරු සිතියම්ගත කිරීම යනු පිරිවැය එලදයී මතක ව්‍යාපෘතියක් වූ හෙයින් ගැටුම සම්බන්ධයෙන් නිල මට්ටමින් ඉදිරිපත්වූ කතාව තුළ බොහෝවිට ඇතුළත් නොවූ සිදුවීම් සම්බන්ධයෙන් බහුවිධ අර්ථ නිරූපණ හා නියෝජන සඳහා ඉඩ ලැබෙන පරිදි ඉතිහාසය පිළිබඳ තම පෞද්ගලික අත්දැකීම් විස්තර කිරීමට දෘෂ්‍යමය වශයෙන් ප්‍රබල ක්‍රමයක් යොදගැනීම තුළින් ඔවුන්ගේ එම පෞදගලිකවූත් බෙහෙවින් වේදනාත්මකවූත් අත්දැකීම්වලට සාක්ෂි දැරීමටත් අදහස් හුවමරුවකට, සහභාගිවන්නන්ට පොදු උරුමයන් හඳුනාගැනීමට සහ සාමය හා යුක්තිය පදනම් වූ අනාගතයක් සාක්ෂාත් කරගැනීම කරා සියළුදෙනාට එක්ව වැඩකල හැකි ක්‍රම හඳුනාගැනීමට මෙම ක්‍රියාවලිය සමගින් ඇතිවන සංවාද ක්‍රියාවලිය යොදගැනීමටත් ඉඩ සලසන්නාවූ ක්‍රමයක් වේ.

සිරුරු සිතියම්ගත කිරීමට එක්වූ බොහෝදෙනා විධිමත් ලයිබීරියානු සත්‍ය හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට සහභාගි නොවූවන් බැවින් අතීතය හා බැඳුණු ගැටළු සම්බන්ධයෙන් සාමුහිකව කටයුතු කිරීමට ඔවුනට ලැබුණි පළමු අවස්ථාව මෙය විය. තවද දකුණු අප්‍රිකාවේ වෙනත් රාජ්‍ය නොවන සංවිධානයක් සමගින් සිදුකළ හුවමාරුවේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් රටක පුද්ගලයින් ගැටුම් තුළ විඳි අත්දැකීම් කෙබඳුදැයි දැකබලාගෙන එතුළින් තමන් විඳි අත්දැකීම් පුළුල් ජාත්‍යන්තර පසුබිමක පොදුවේ අප්‍රිකානු රාජ්‍යයන්හි පසුබිමේ ස්ථානගත කර අවබෝධ කරගන්නට ලයිබීරියානු වින්දිතයින්ට ඉඩ ලැබිණි.දකුණු අප්‍රිකාවේ ගැටුමට ජාත්‍යන්තර අවධානය බෙහෙවින් යොමු වුවත් තම රටේ ගැටුම ජාත්‍යන්තර අවධානයෙන් ගිලිහී ගිය බවක් පෙනෙන බව සහභාගිවන්නන්ගේ මතය විය. නමුත්, ඉහත කී හුවමාරුව හේතුවෙන් මෙම ගැටුම සම්බන්ධයෙන් වූ මහජන අවධානය වර්ධනය විය. වඩාත්ම වැදගත් කරුණ වන්නේ සහභාගිවන්නන්ට තම අත්දැකීම් බෙදහද ගනිමින්, එකිනෙකා සමගින් සහකම්පනය කරමින් බොහෝදෙනෙකුට ප්‍රථමවරට හැඟුන කරුණක් වන තමන්ගේ අත්දැකීම් පිළිගැනීමට ලක් වන බව අවබෝධ කරගැනීමට ඉඩ ලැබීමය.2012දී මේ සම්බන්ධයෙන් සිදු කෙරුණු පසුවිපරම් ක්‍රියාවලිය තුළ 2010 කණ්ඩායමට සහභාගිවූවෝ පසුගිය දෙවසර තුල තම ජීවිතයේ සිදුවූ වෙනස්කම් ආවර්ජනය කරමින් පෙර තමන් ඇඳි සිතියම් යළි සලකා බැලූහ.සිරුරු සිතියම්ගත කිරීමේ වැඩමුළුව ධනාත්මක සහ සවිබලගැන්වූ අත්දැකීමක් වූ බවත්, එය තමන්ගේ ජීවිත ඉදිරියෙන් තැබූ කැඩපතක් වූ බවත් අනාගතය පිළිබඳ යහපත් බලාපොරොත්තු ඇතිකරගැනීමට මග සැලසූ බවත් බොහෝ සහභාගිවූවන්ගේ අදහස විය.තමන් සිතින් මවාගත් අනාගතය සැබෑවක් කරගැනීම සඳහා මේ වනවිට සාර්ථකව ගමන් කරමින් සිටින බව ද ඔවුහු පැවසූහ.

## ගැටුම හේතුවෙන් පරිවර්තනයට ලක්වූ එදිනෙද භාණ්ඩ: මතකයේ තබාගැනීම තුළින් සුවවීම, උතුරු අයර්ලන්තය



*බෙල්ෆාස්ට් හි 'මතක තබාගැනීම තුළින් සුවවීම' වැඩසටහනේ 'ගැටුමින් පරිවර්තනයට ලක්වූ එදිනෙද භාණ්ඩ' ප්‍රදර්ශනය නරඹන්නන්*

උතුරු අයර්ලන්තය 1960 දශකයේ සිටම 'කරදර' (The Troubles) නමින් එරට ජනවහරින් ඔවුන් හඳුන්වන්නාවූ ප්‍රචණ්ඩත්වයේ ග්‍රහණයට නතුව තිබුණි. මෙම ගැටුමට මූලික වශයෙන් හේතුවී ඇත්තේ උතුරු අයර්ලන්තය අයර්ලන්ත සන්ධානයේ කොටසක් වියයුතුද නැතහොත් බ්‍රිතාන්‍ය සමගින් ඈඳිය යුතුද යන්නයි. ආගමික විශ්වාසය අනුව මේ පිළිබඳ මතවාදය බෙදීගොස් ඇති අතර ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිවරු බ්‍රිතාන්‍ය සමගින් ඈඳීමට සහයදෙන අතරේ කතෝලික ජාතිකවාදීහු ස්වාධීන අයර්ලන්තයක් සඳහා සහය ලබාදෙති. 'කරදර' සමය වශයෙන් හැඳින්වෙන්නේ 1960 දශකයේ සිට 1998 දක්වා කාලවකවානුවවේ. බෙල්ෆාස්ට් මහ සිකුරාද ගිවිසුම සමගින් එම යුගය නිමා විය.මෙම සාම ගිවිසුම 'කරදර' සමයේ නිමාව නිල වශයෙන් සනිටුහන් කළද 2011 තරම් මෑත කාලයක් වන තුරු දේශීය ප්‍රජාවන්ට ගැහැට පැමිණවූ ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීම නොකඩවා සිදුව තිබේ. මෙම 'කරදර' (the troubles) සඳහා සක්‍රිය සටන්කාමීන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් සම්බන්ධ විය. 1960ත් 2001ත් අතර පුද්ගලයින් 3526ක් පමණ මරාදැමුණු අතර හදිසි අවස්ථා තත්වය යටතේ ජීවත් වීමේ දෛනික කම්පනය දහස් ගණනාවක් වූ ජනතාව අත්වින්දහ.'කරදර' මගින් සාමාන්‍ය පුරවැසියන්ගේ එදිනෙද ආරක්ෂාවට තර්ජනයක් එල්ල වූ අතර වෙනස්කොට සැලකීමේ පරිචයන්, ඒකාකෘතිකරණය සහ ප්‍රචණ්ඩත්වයට හේතුපාදක වූ කරුණු පිළිබඳව එකිනෙකට පටහැනි කතා සහ මිත්‍යාමත යනාදියද ඊට ඇතුළත් විය. පරම්පරා දෙකක් මුළුල්ලේ, දශක හතරක් තුළ ව්‍යාප්තව ඇති ප්‍රචණ්ඩත්වය තදින් කාවැදී ඇති සමාජයක් අතීතය ක්‍රමයෙන් පිළිගැනීමට ලක් කරන්නේ කෙසේද?ගැඹුරට විහිදුනු බෙදීම් සහිත සමාජයක් සාමය හා ප්‍රතිසන්ධානය සඳහා වන පොදු දැක්මක් පිළිබඳ කථා කරන්නට පොළඹවන කාරක මොනවාද? සාමාන්‍ය පුරවැසියන් දෛනිකව අත්විඳි ප්‍රචණ්ඩත්වය සහ කම්පනය පිළිගැනීමට ලක් කරන්නේ කෙසේද? සුවවීමේ ක්‍රියාවලීන්ට දයකවීමට වඩාත්ම සුදුසු යන්ත්‍රණ කවරේද?

15 http://www.healingthroughremembering.org/

එම අදහස් ලබාගැනීමේ ඉලක්කය වූයේ ගැටුමේ බහුවිධ දෘෂ්ටිකෝණ වඩාත් හොඳින් හඳුනාගැනීමත් ප්‍රතිසන්ධාන හා සුවවීමේ ක්‍රියාවලීන්ට පහසුකම් සැලසීම සඳහා ගැටුම මතකයේ තබාගැනීමට වඩාත්ම සුදුසු ක්‍රම පිළිබඳ අදහස් ලබාගැනීමය.එම ක්‍රියාවලියෙන් මතුවූ ප්‍රධානතම නිර්දේශය වූයේ අනුස්මරණ කෞතුකාගාරයක් ඇති කිරීමයි. 2004 වසරේදී HTR (Healing Through Remembering) සංවිධානය සජීවී අනුස්මරණ කෞතුකාගාර අනු කමිටුව නම් කමිටුවක් පත් කළ අතර එය, මතකය, සදනුස්මරණය, සහ සජීවී අනුස්මරණ කෞතුකාගාරය නිර්මාණය යන මාතෘකා ඔස්සේ පර්යේෂන සිදු කිරීමටත් අදහස් ලබාගැනීමටත් ආරම්භ කර තිබේ.
ගැටුමේ වින්දිතයින් පිළිගැනීමට ලක්කිරීම සහ සැමරීම සඳහා ස්මාරකයක්, කෞතුකාගාරයක් හා සාම උද්‍යානයක් නිර්මාණය කරන මෙන් පොදුවේ ඉල්ලීම් ඉදිරිපත්වී ඇතත් එවන් මතක ව්‍යාපෘති මගින් තවදුරටත් ගැටුම් හෝ තරඟකාරීත්වය ඇති කරමින් උතුරු අයර්ලන්තය වැනි දුබල සමාජයකට දැඩි බලපෑමක් ඇති කළහැකි බව කෞතුකාගාර අනු-කමිටුව හඳුනාගෙන තිබේ.උතුරු අයර්ලන්තයේ ප්‍රචණ්ඩත්වය නම් තේමාව ආමන්ත්‍රණය කරන සදනුස්මරණ ව්‍යාපෘති කිහිපයක් පැවතියද, 'අයර්ලන්තයේ ගැටුම' නම් ප්‍රදර්ශනයක් ඇති අල්ස්ටර් කෞතුකාගාරය වැනි කෞතුකාගාර විවාදයට හා දැඩි විවේචනයට ලක්ව තිබේ.එමනිසා, මානුෂීය ගැටළු ආමන්ත්‍රණය කරන්නා වූ සජීවී, විකාශයවන, සහ සහභාගීත්ව කෞතුකාගාරයක් ඇතිකිරීමට අනුකමිටුව තීරණය කර ඇත.එවන් කෞතුකාගාරයක ප්‍රධාන ඉලක්කය වනු ඇත්තේ සියළුදෙනාටම අතීතය සිහියට නගා ගැනීමට, සැමරීමට සහ ආවර්ජනයට සුරක්ෂිත ඉඩක් ලබාදීම සහ ප්‍රචණ්ඩත්වය යළි ඇති නොවීමට දායක වන අධ්‍යාපන හා සංවාද වැඩසටහන් හරහා අතීතයේ උරුමයන් පිළිබඳව අවබෝධයක් ලබාගැනීමයි.විවිධාකාර වූ ප්‍රේක්ෂකයින් පරාසයක් කරා ළඟාවන ප්‍රජා-මූලික සහභාගීත්ව එළඹුමකින් පමණක් මෙම දැක්ම සාක්ෂාත් කරගත හැකි බව හඳුනාගත් කෞතුකාගාර අනු කමිටුව පුළුල් සහභාගීත්වය සහ සියළුදෙනාම ඇතුළත් කරගැනීමේ මූලධර්ම මත පදනම් වූ ප්‍රදර්ශනයක් නිර්මාණය කිරීමට කටයුතු කරමින් සිටියි.

මතක තබාගැනීම තුළින් සුවවීම සංවිධානය හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ සහය ඇතිව සජීවී අනුස්මරණ කෞතුකාගාරයේ 'ගැටුම හේතුවෙන් පරිවර්තනය වූ එදිනෙදා භාණ්ඩ' ප්‍රදර්ශනය සකස් කිරීම 2010දී ආරම්භ කරන ලදී.තවමත් ආරම්භක අවධියේ පවතින මෙම ව්‍යාපෘතිය හරහා මතකය, ගැටුම, අනන්‍යතාව සහ බෙදීම සම්බන්ධ ගැටළු වටා සංවාද ආරම්භ කරනා කාරක  ඒකරාශී කරනු ලබයි.ඡායාරූප, ධජ, ඇඟළුම් සහ කලා නිර්මාණ වැනි දෑ ප්‍රදර්ශනයට දායක කරන මෙන් විවිධ ප්‍රජාවන්ට අයත් පුදගයින් හා කණ්ඩායම්වලින් ඉල්ලා සිටින ලදී. මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ කොටසක් වූ සාමාන්‍ය පෞද්ගලික භාණ්ඩ ඒකරාශී කර ප්‍රදර්ශනය කිරීම හරහා ගැටුම තුළින් ජන ජීවිතයේ සෑම අංගයක් මතම ගැටුමින් ඇතිවන බලපෑමමනාව සලකා බලා පිරිවැය සළලදැයි අන්දමින් ඉදිරිපත් කිරීමසිදු කෙරෙන අතර, එක් එක් පුද්ගලයාගේ කතා පුළුල් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියකට දායක වන සාමුහික කතාවක් නිර්මාණයට භාවිතා කරනු ලැබේ.



# සමාප්තිය

# සදනුස්මරණ ව්‍යාපෘතියක් ආරම්භ කරනවිට සලකා බැලියයුතු ප්‍රශ්න ඇතුළත් පිරික්සුම් ලයිස්තුව

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන යොදාගනිමින් උදාහරණ දැක්වූ පරිදි ගැටුමක ඕනෑම අවධියකදී සදනුස්මරණ මුලපිරීමක් ආරම්භ කළ හැකි නමුත් පශ්චාත්-ගැටුම් සදනුස්මරණ කටයුතුවල සාර්ථකත්වය බෙහෙවින්ම රඳා පවතින්නේ එම මුල්පිරීම සැලසුම් කිරීමේදී සම්පූර්ණ කරනු ලබන ක්‍රියාවලීන් මත වේ.

සදනුස්මරණ මුලපිරීමක් සිදු කිරීමේදී සැලකිල්ලට ගතයුතු මූලික ප්‍රශ්න අතරට පහත ප්‍රශ්න ද ඇතුළත් වේ:

- ✓ **ඉලක්ක:** මෙම මුලපිරීමේ ඉලක්කය කුමක්ද? ඒ, දිවි ගලවාගත්තවුන් සහ වින්දිතයින් පිළිගැනීමට ලක්කිරීමද? එමගින් ප්‍රතිසන්ධානය පෝෂණය වේද? එමගින් ප්‍රජාව සම්බන්ධ කරගැනීම ප්‍රවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමේ ක්‍රියාවලීන්ට දායකවීම සිදුවේද? එය, දැනට සිදු කෙරෙමින් පවතින සත්‍ය පැවසීමේ ක්‍රියාවලීන්ගේ කොටසක් වේද? අතීතය නැවත ඇතිවීම වැලැක්වීම සඳහා දැනුවත්භාවය ඇතිකිරීම කෙරෙහි එමගින් අවධානය යොමුවේද?

- ✓ **කාලය සහ සිදුවීම්වල අනුපිළිවෙල:** මෙම ව්‍යාපෘතියට සහභාගිවීම සඳහා පාර්ශවකරුවන් සූදානම්ද? ව්‍යාපෘතිය මගින් මතු කෙරෙන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රජාව සූදානම්ද, නැතහොත් ගැඹුරේ සැඟව තිබූ, යටින් දිවෙන ආතතිකාරී තත්ව ව්‍යාපෘතිය හරහා මතුපිටට ගෙන එයිද?අනෙකුත් සංක්‍රාන්තික යුක්ති හා පශ්චාත්-ගැටුම් ප්‍රතිසංස්කරණ යන්ත්‍රණ සමගින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධ වන්නේ කෙසේද? සත්‍ය කොමිෂන් ක්‍රියාවලියෙන් ලබාදුන් නිර්දේශ එමගින් තවදුරටත් ගොඩනැගේද?

- ✓ **මුලපුරන්නන්:** ව්‍යාපෘතියට මුලපුරන්නේ කවුරුන් විසින්ද? එම මුලපුරන්නන්ට සමාජය තුළ සහ පාර්ශවකරුවන් අතරේ මෙවන් ව්‍යාපෘතිකක් දියත් කිරීමට ප්‍රමාණවත් නීත්‍යානුකූල පිළිගැනීමක් තිබේද?

- ✓ **පාර්ශවකරුවන්:** ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරුවන් කවුද? මෙම ව්‍යාපෘතියෙන් නියෝජනය කරන්නට වෑයම් කරන්නේ කාගේ කතාද? ව්‍යාපෘතියට මුලපුරන්නේ පාර්ශවකරුවන් නොවේ නම්, ව්‍යාපෘතියේ සැලසුම සම්බන්ධයෙන් ඔවුන්ගෙන් අදහස් ලබාගෙන තිබේද? ව්‍යාපෘතියේ සෑම අදියරකදීම ඔවුන්ව සම්බන්ධ කරගන්නේ කෙසේද? ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායම් කවරේද?

- ✓ **සම්පත්:** ව්‍යාපෘතියට පවතින විවිධ සම්පත් කවරේද? පවතින සම්පත් සහ ව්‍යාපෘතියේ ඉලක්කය සලකා බලන කල ව්‍යාපෘතිය කුමන ස්වරූපයක් ගැනීම වඩාත් සුදුසු වේද? එය කෞතුකාගාරයක් වේද, ස්මාරකයක් වේද, නැතහොත් මතක ව්‍යාපෘතියක් වේද? සංවාද වැඩසටහන් හරහා පවතින ස්ථානයක් යළිපනගැන්විය හැකිද?

- ✓ **අදහස් ලබාගැනීම:** පාර්ශවකරුවන් සහ පුළුල් ප්‍රජාව වෙතින් අදහස් ලබාගැනීමට සහ ඔවුන් සමගින් තොරතුරු හුවමාරුවට වන සැලසුම කුමක්ද? ව්‍යාපෘතියේ සෑම අදියරකදීම සම්බන්ධ වියයුතු අය කවුරුන්ද? මුලපුරන්නන් සහ පාර්ශවකරුවන් අතර අඛණ්ඩව සන්නිවේදනය සිදුවන බව සහතික කරගැනීම සඳහා කුමන යන්ත්‍රණ වුවමනා වේද?

- ✓ **මහජනතාව දැනුවත් කිරීම**: ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඔබ විසින් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන්නේද? එය ජාතික ව්‍යාපෘතියක් වේනම් පුළුල් මහජනතව ඇතුළත් කරගන්නා බව හා දැනුවත් වන බව සහතික කරගැනීමට කුමන අන්දමේ දැනුවත් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේද?

- ✓ **පර්යේෂණ**: කුමන ආකාරයේ පර්යේෂණ කටයුතු කුමන අරමුණක් උදෙසා සිදු කරයි ද? එම පර්යේෂණ කටයුතු සම්මුඛ සාකච්ඡා, ගම් මට්ටමේ රැස්වීම්, ඉලක්ක කණ්ඩායම් නැතහොත් මහජන සමීක්ෂණ ස්වරූපයෙන් සිදු කෙරෙනු ඇත්ද? එම පර්යේෂණ එක් රැස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමට, ප්‍රදර්ශනයක් සූදානම් කිරීමට හෝ ලේඛනාගාරයක කොටසක් වීමට යොදාගනු ඇත්ද?

- ✓ **සම්බන්ධතා ඇතිකිරීම**: ඔබේ ව්‍යාපෘතිය ඒ හා සමාන අනෙකුත් ව්‍යාපෘති දැනුවත් කරන්නේ හෝ ඒවා සමගින් සන්නිවේදනය කරන්නේ කෙසේද? සමාන ව්‍යාපෘති සමගින් සම්බන්ධතා පවත්වාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ ද?

- ✓ **දීර්ඝ කාලීන දැක්ම**:ව්‍යාපෘතියේ දීර්ඝකාලීන දැක්ම කුමක්ද? ව්‍යාපෘතිය මගින් පාර්ශවකරුවන්ගේ සහ පුළුල් ප්‍රජාවේ පරිණාමය වන අවශ්‍යතා සපුරාලන බව ඔබ විසින් සහතික කරගන්නේ කෙසේද?